*සැ. යු.*- මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,684 - 2010 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා - 2010.12.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 2140 | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2140 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 දෙසැම්බර් මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත් කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (I) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් කරන ලද පත් කිරීම්**

| *අනු අංකය* | *නම/සේවය/පන්තිය* | *පත් කරන ලද තනතුර/අමාත්‍යාංශය හා ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01 | එච්. සුමනපාල මහතා | 2010.11.08 දින සිට වසර 05ක කාලයක් සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික වශයෙන් පත් කිරීම |

එස්. අලවි මව්ලානා,
බ. ප. ආණ්ඩුකාරවර.

2010 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ 04,
යුනිටි ප්ලාසා ගොඩනැගිල්ලේ පිහිටි,
බ. ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

12-174

---

# පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත සමුපකාර සමිති ප්‍රඥප්ති කෙටුම්පත

ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්මව ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම් කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ දී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතු ය.

අමාත්‍ය ආර්. එම්. කුමාරසිරි රත්නායක,
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන,
පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ
ආහාර සැපයීම් හා බෙදාහැරීමේ අමාත්‍යාංශය,
ඌව පළාතේ පළාත් සභාව.

2010 නොවැම්බර් මස 23 වැනි දින,
අමාත්‍ය කාර්යාලයේ දී,
අංක 301,
ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ - ඌව පළාතේ පළාත් සභාව**

***ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත සමුපකාර සමිති ප්‍රඥප්ති කෙටුම්පත***

ඌව පළාත තුළ ජීවත්වන ප්‍රජාවගේ ආර්ථික හා සමාජ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා එම ක්ෂේත්‍රය තුළ නව සමිති බිහිකිරීම හා අධීක්ෂණය කිරීම, සමුපකාර සමිති ඵලදායී හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මෙහෙයවීම, උපදෙස් දීම හා සමුපකාර ප්‍රජාව දැනුවත් කිරීම සහ සමුපකාර ක්ෂේත්‍රයට අදාළ ව්‍යවස්ථාපිත කටයුතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතට අනනුකූල වේ.

කාර්යක්ෂම, ඵලදායී හා විශ්වාසනීය වූ යහපත් සමුපකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යාම තුළින් ඌව පළාතේ ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට ඌව පළාතේ පළාත් සභාව බැඳී සිටින හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ. පූර්විකාව.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ සමුපකාර සමිති ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙය මින් මතු ආණ්ඩුකාරවරයා ලෙස හඳුන්වනු ලබන ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනක හෝ ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ලද දිනක සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2. මෙම ප්‍රඥප්තිය මගින් සමුපකාර ව්‍යාපාරයේ සංවිධානය, පාලනය හා සංවර්ධනය සඳහා වූ පහත දැක්වෙන පොදු අරමුණු ඉටු කිරීමට අදාළ වන්නා වූ නෛතික විධිවිධාන සලසනු ලැබේ :- අරමුණු.

(අ) සමුපකාරය පිළිබඳ පළාත් ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම හා නීති පරිපාලනය ;
(ආ) සමුපකාර ආයතන හෝ සමිති හෝ සංවිධානවලට නෛතික අනන්‍යතාවයක් ලබාදීම ;
(ඇ) සමුපකාර සමිති හා සමුපකාර ආයතනවල සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, වගකීම් හා වරප්‍රසාද තහවුරු කිරීම ;
(ඈ) සමුපකාර ආයතන විධිමත් කිරීම, ශක්තිමත් කිරීම හා සංවර්ධනය කිරීම ;
(ඉ) සමුපකාර ව්‍යවසාය ක්‍රමය ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;
(ඊ) අධ්‍යාපනික හා පුහුණුවීම් කටයුතු මෙහෙයවීම හා සමුපකාර ව්‍යාපාරයට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

## *I වැනි පරිච්ඡේදය*

*සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් හා ඔහුගේ කාර්ය භාරය*

3. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලධරයා ලෙස ක්‍රියා කිරීමට හැකිවන පරිදි සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (මෙහි මින්මතු කොමසාරිස් හෝ රෙජිස්ට්‍රාර් වශයෙන් හඳුන්වනු ලබන) වරයෙකු පත්කළ යුතු ය. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

4. රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය පහත පරිදි විය යුතුය :- රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය.

(අ) සමුපකාර සමිති ලියාපදිංචි කිරීම සහ අනෙකුත් ව්‍යවස්ථාපිත කටයුතු ඉටු කිරීම ;
(ආ) සමුපකාර ආයතන සඳහා අවශ්‍ය ප්‍රාග්ධන පහසුකම් සැපයීම හා මූල්‍ය කළමනාකරණය ;
(ඇ) සමුපකාර සමිති සඳහා අරමුදල් වෙන් කිරීමේ දී මැදිහත්කරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම ;
(ඈ) අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු වැඩසටහන්, දැනුම ලබාදීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;
(ඉ) කළමනාකරණ උපදේශන සේවා සැපයීම හා සමුපකාර ව්‍යාපාරයට අදාළ පර්යේෂණ පැවැත්වීම ;
(ඊ) ජාත්‍යන්තර හා ජාතික සමුපකාර සංවිධාන අතර සම්බන්ධීකාරකයකු වශයෙන් ක්‍රියා කිරීම ;
(උ) සමුපකාර ව්‍යාපාරය ඇතුළත සහ සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීම හා තීරක කටයුතු ;
(ඌ) තීරකකරණ හෝ නියමයන් අධිකරණ මඟින් බලාත්මක කිරීම, අධිකරණයේ නඩු පැවරීම සහ අධිකරණ කටයුතු සම්බන්ධ කර්තව්‍ය භාර ගැනීම ;
(එ) සමුපකාර සමිතිවල කටයුතු පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ පරීක්ෂණ පැවැත්වීම සහ උපදේශන කටයුතු ;
(ඒ) අකර්මන්‍ය සමිති විසුරුවා හැරීම සහ ඒවායේ ඈවර කටයුතු ;
(ඔ) සමුපකාර සමිති විගණනය සඳහා විධිවිධාන සැලැස්වීම ;
(ඕ) රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායකයින් සමුපකාර ව්‍යාපාරය සමග එක්ව කටයුතු කිරීමට සම්බන්ධීකරණය කිරීම ;
(ක) සමුපකාර ආයතන ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම, වත්කම් හා වගකීම් පැවරීම ;
(ග) සමුපකාර සේවක පාලන කටයුතු කිරීම ;
(ජ) ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ඉහත කී ඉහත කී කර්තව්‍යවලට අනුෂාංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

5. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් (මෙහි මින්මතු ''දෙපාර්තමේන්තුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) පැවතීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්ට සහය වීම සඳහා නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර, හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් සංඛ්‍යාවක් සහ අවශ්‍යයැයි හැඟෙන අනෙකුත් නිලධාරීන් ද පත්කළ හැකිය. කෙසේ වුව ද බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක 02 සඳහා ද පළාත් දෙපාර්තමේන්තුවේ එක් තනතුරක් සඳහා ද දෙපාර්තමේන්තුමය නිලධාරීන් තිදෙනෙක් සහකාර රෙජිස්ට්‍රාර්වරුන් හෝ සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් ලෙස පත්කළ යුතු ය.

(4) සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු විය යුතු ය.

(5) (අ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන රීති කිසිවක් යටතේ වූ රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල සියල්ලම හෝ ඒ අතුරින් යම් බලයක් යම් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකුට, ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුට හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුට ලියවිල්ලක් මගින් පවරා දීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකි විය යුතු ය ;

(ආ) ඉහත (5) (අ) වගන්තිය යටතේ පවරා දෙනු ලබන කිසියම් බලයක් ක්‍රියාවෙහි යෙදවීම එහි බලයලත් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර් හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හැකි විය යුතු ය.

## *II* වැනි පරිච්ඡේදය

*සමුපකාර සමිති හා සංගම් ලියාපදිංචි කිරීම*

ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිති හා සංගම්.

6. (1) මෙහි මින්මතු සඳහන් කරනු ලබන විධිවිධානවලට යටත්ව පහත සඳහන් සමුපකාර සමිති හා සංගම් ලියාපදිංචි කළ හැකිය :-

(අ) ස්වකීය සාමාජිකයන්ගේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික හා අධ්‍යාත්මික සුබසාධනයට හේතුවන නිශ්චිත සේවාවන් ජාත්‍යන්තර සමුපකාර සන්ධානය විසින් පිළිගත් සමුපකාර ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූලව සැලසීම ස්වකීය අරමුණු වශයෙන් ඇත්තා වූ සමිතියක් ;

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සමිතිවල ක්‍රියාකාරිත්වය පහසු කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයන් ලියාපදිංචි කළ සමිතිවලින් සමන්විත සංගමයක් ;

(ඇ) සමුපකාර අධ්‍යාපනය, පුහුණුව හා කළමනාකරණ සේවාවන්, උපදේශක සේවාවන් ඌව පළාතේ සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සේවාවන් සැලැස්වීම අරමුණු කරගෙන ප්‍රාථමික සමුපකාර සමිති, දිස්ත්‍රික් සමුපකාර සංගම් සාමාජිකත්වයෙන් යුතු දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ එම අරමුණු ඇතිව දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ පළාත් සමුපකාර සංගම්වලින් සැදුම්ලත් පළාත් සමුපකාර මණ්ඩල ;

(ඈ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් අරමුණ ඉටුකර ගැනීම සඳහා වූ ව්‍යාපාර පවත්වාගෙන යාම පිණිස ලියාපදිංචි කරන ලද සංගම්වලින් සමන්විත සංගම් හෝ මණ්ඩල.

(2) (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ වන සමිති සීමාසහිත හෝ සීමාරහිත වගකීම් ඇතිව ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, (ආ), (ඇ), (ඈ) ඡේද යටතේ වන සංගම් සීමාසහිත වගකීම් යටතේ පමණක් ලියාපදිංචි කරනු ලැබිය යුතුය. (අ) ඡේද යටතේ වන සමිතිය, සමිතියක් වශයෙන් ද, (ආ), (ඇ) හා (ඈ) ඡේද යටතේ වන සමිති, සංගම් හෝ මණ්ඩල වශයෙන් ද හඳුන්වනු ලැබිය යුතු ය.

(3) සමිතියක සාමාජිකයන්ගේ වගකීම සීමා කරනු ලැබූ අවස්ථාවක ලියාපදිංචි කරනු ලැබූ සමිතියක නොවන කිසිම සාමාජිකයෙකු විසින් පහෙන් එකක උපරිම ප්‍රමාණයකට යටත්ව ඒ සමිතියේ කොටස් ප්‍රාග්ධනයේ රීතිවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට වැඩි ප්‍රමාණයක් නොදැරිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ කොන්දේසි, ලියාපදිංචිය සඳහා ඉල්ලීම් කිරීම හා ඉදිරිපත් කළ යුතු ලියවිලි.

7. (1) ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා රීති මගින් නියම කරනු ලබන ආකාරයට අයදුම් පත්‍රයක් සමිතිය හෝ සංගමය විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ඒ අයදුම් පත්‍රය -

(අ) පුද්ගලයින්ගෙන් පමණක් සාමාජිකත්වය සමන්විත වන සමිතියක් සම්බන්ධයෙන් වූ විට අයදුම්පත්‍රය බල ප්‍රදේශය තුළ, පදිංචිව සිටින හෝ නිශ්චල දේපළ අයිතිව සිටින හෝ සේවයේ නියුක්තව සිටින හෝ වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයින් විසිදෙනෙකු විසින් අත්සන් කළ යුතුය. එසේ වුව ද මෙම වයස් සීමාව පාසල් සඳහා පිහිටුවන සමුපකාර සමිතිවලට අදාළ නොවිය යුතු ය ;

(ආ) ලියාපදිංචි කළ සමිති සාමාජිකවන සංගමයක් සම්බන්ධයෙන් වූ විට ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තන් පස් දෙනෙකු විසින් ද ;

(ඇ) ලියාපදිංචි කළ සමිති හා සංගම්වලින් සමන්විත වන සංගමයක් වන විට යථා පරිදි බලය පවරනු ලැබූ සමිති හා සංගම්වල තැනැත්තන් අවම වශයෙන් පස්දෙනෙකු සහ පුද්ගල සාමාජිකයන් ද ඇතුළුව දස දෙනෙකු විසින් ද, අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) අයදුම්පත්‍රය සමග -

(අ) සභාපති හා ලේකම් විසින් නිසි පරිදි සහතික කරන ලද සමිතිය හෝ සංගමය ලියාපදිංචි කිරීම සඳහා වූ යෝජනාව සම්මත කර ගනු ලැබූ මහ සභාවේ වාර්තාවේ සහතික පිටපත් දෙකක් හා පැමිණීම සම්බන්ධයෙන් විස්තර හා අතුරු ව්‍යවස්ථාව සම්මත කර ගනු ලැබූ මහා සභා වාර්තාවේ සහතික පිටපත් දෙකක් ;

(ආ) යෝජිත අතුරු ව්‍යවස්ථාව, මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් රීතිවලට පටහැනි නොවන බවට සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හා රෙජිස්ට්‍රාර්වරයා නියම කර ඇත්තා වූ යම් තැනැත්තෙකුගෙන් හෝ ආයතනයක වාර්තාවක් හෝ නිර්දේශයක් සමග යෝජිත සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක් ;

(ඇ) සමිතිය හෝ සංගමය නිරත වීමට යෝජනා කරනු ලබන ඉදිරි කටයුතුවලට අදාළ යෝග්‍යතා වාර්තාවක් ;

(ඈ) අයදුම්පත්‍රය අත්සන් කරන සාමාජිකයන් විසින් සාමාජික ගාස්තු ගෙවනු ලැබීම ස්ථිර කෙරෙන සහ ඒ මුදල් එම කාරක සභාවේ භාරකාරත්වයෙහි පවතින බවට සමිතියේ හෝ සංගමයේ කාරක සභාව විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ;

(ඉ) අයදුම්පත්‍රය අත්සන් කරන ලද එක් එක් සාමාජිකයාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ලිපිනය, රැකියාව සහ හිමිකරගත් කොටස් ප්‍රමාණය දැක්වෙන ලේඛනයක් ;

(ඊ) සාමාජිකයන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබූ කාරක සභිකයන්ගේ තනතුරු ඇතුළත් නාම ලේඛනයක්;

(උ) සමිතියේ හෝ සංගමයේ ව්‍යාපාර කටයුතුවල ශක්‍යතාවය හා ප්‍රරෝහණත්වය පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් පිළිගනු ලබන පුද්ගලයෙකුගේ වාර්තාවක් ;

(ඌ) සමිතියේ හෝ සංගමයේ කාරක සභාවේ සාමාජිකයන් අතුරෙන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත් වයස අවුරුදු දහ අටටත් තිස්පහටත් අතර විය යුතු තැනැත්තන් වන බවට යෝජිත අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත්ව ඇති බවට සභාපති හා ලේකම් විසින් අත්සන් කරන ලද සහතිකයක් ;

(එ) යෝජිත සමිතියේ හෝ සංගමයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ශක්‍යතා වාර්තාව අනුව පෙන්නුම් කරන ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් සියයට දහයක ප්‍රමාණයක් සාමාජිකයන් විසින් කොටස් හා තැන්පත් වශයෙන් ගෙවා සම්පූර්ණ කර ඇති බවට සභාපති හා ලේකම් විසින් අත්සන් කරන ලද සහතිකයක් ;

(4) මේ වගන්තියේ කාර්යයන් සඳහා යම් තැනැත්තෙකු වයස, පදිංචිය, රක්ෂාව, දේපළ හෝ වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය ;

8. (1) සමුපකාර සමිතිය හෝ සංගමය විසින් මේ ප්‍රඥප්තියේ හා රීතිවල විධිවිධාන අනුව ක්‍රියා කර ඇති බවට, ඒ සමුපකාර සමිතිය හෝ සංගමය නියුක්ත වීමට අදහස් කරන කටයුතු ආර්ථික වශයෙන් ශක්‍ය බවට හා සමිතියේ හෝ සංගමයේ යෝජිත අතුරු ව්‍යවස්ථාව මේ ප්‍රඥප්තියට හෝ රීතිවලට එකඟ වන බවට හා ඉහත 7 (3)(ඌ) වැනි උපවගන්තියේ සඳහන් කරුණු යෝජිත අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත්ව ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් ඒ සමුපකාර සමිතිය හෝ සංගමය, සමුපකාර සමිතියක් හෝ සංගමයක් ලෙස ලියාපදිංචි කළ හැකි අතර, එම අතුරු ව්‍යවස්ථාව ද ලියාපදිංචි කළ හැකිය.

සමිති හා සංගම් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම.

(2) (අ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සීමාසහිත වගකීම්වලින් යුත් සෑම සමුපකාර සමිතියක හා සංගමයක නමෙහි ''සීමාසහිත'' යන වචනය මුල් වචනය විය යුතුය. නැතහොත් එහි දෙමළ හෝ ඉංග්‍රීසි වචනය ඒ නමෙහි කොටසක් විය යුතු ය ;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සීමාරහිත වගකීම්වලින් යුත් සෑම සමුපකාර සමිතියක හා සංගමයක නමෙහි 'සීමාරහිත' යන වචනය මුල් වචනය විය යුතුය. නැතහොත් එහි දෙමළ හෝ ඉංග්‍රීසි වචනය ඒ නමෙහි කොටසක් විය යුතු ය ;

(3) සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම හා සංගමයක්ම ස්වකීය ලියාපදිංචි කිරීමේ දින සිට හය මසක් ඇතුළත දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගත යුතු ය.

(4) යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනයක්, ඒ සම්බන්ධයෙන් එම ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබ ඇතැයි සැලකෙන රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(5) (අ) කිසියම් සමිතියක හෝ සංගමයක හෝ මණ්ඩලයක ලියාපදිංචිය අලුත් කළ යුතු බවට රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන්නේ නම් එසේ කළ යුතු බවට විධානයක් නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකිය. ඒ සඳහා සුදුසු රීති සම්පාදනය කරගත යුතු ය ;

(ආ) එසේ ලියාපදිංචිය අලුත් කළ යුතු බවට විධානය ලද සමිතියක් හෝ සංගමයක් හෝ මණ්ඩලයක් ඒ අනුව ලියාපදිංචිය අලුත් කරවා නොගතහොත් එම සමිතියේ හෝ සංගමයේ හෝ මණ්ඩලයේ ලියාපදිංචිය අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකි ය.

*අතුරු ව්‍යවස්ථාවේ අඩංගු විය යුතු කරුණු.*

9. (1) සමුපකාර සමිතියක හෝ සංගමයක, යෝජිත අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය :-

(අ) සමිතියේ හෝ සංගමයේ නම, ලිපිනය සහ බල ප්‍රදේශය ;

(ආ) සාමාජිකයන්ගේ පොදු අවශ්‍යතා ඉටු කිරීම සඳහා වන සමිතියේ පරමාර්ථ හා අරමුණු ;

(ඇ) සාමාජිකත්වය හා ආශ්‍රිත සාමාජිකත්වය සඳහා අවශ්‍ය සුදුසුකම් හා සාමාජිකත්වය සහ ආශ්‍රිත සාමාජිකත්වය ලබාගැනීමේ කාර්ය පටිපාටිය ;

(ඈ) සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් හා සාමාජිකයෙකු වශයෙන් රැඳී සිටීමේ දී කොන්දේසි ;

(ඉ) සාමාජිකත්වය ඉල්ලා අස්කර ගැනීම, පැවරීම, සාමාජිකත්වය අවසන් කිරීමේ කාර්ය පටිපාටිය, අඛණ්ඩ වර්ෂ දෙකක කාලයක් තුළ සමිතිය හෝ සංගමය සමග ගණුදෙනු නොකිරීම හා ක්‍රියාකාරකම්වලට දායක නොවීම මත සාමාජිකයන්ගේ සාමාජිකත්වය අහිමි වීම ද, පිළිබඳ විස්තර ඇතුළත් කිරීම ;

(ඊ) ඡන්ද විමසීමක දී, ඡන්දය පාවිච්චි කිරීම හෝ තරග කිරීම ඇතුළු සාමාජික අයිතීන් භුක්ති විඳීම සඳහා එක් එක් සාමාජිකයා විසින් වාර්ෂිකව කළයුතු මූලික දායකවීම, රැස්වීම හා රැස්වීම්වලට සහභාගීත්වය ආදී සේවාවන්වල අවම කාර්ය සාධන අවශ්‍යතාවය නිශ්චය කිරීම ;

(උ) රැස්වීම් කැඳවිය යුතු ආකාරය, සනපූර්ණ අවශ්‍යතා, රැස්වීම් පිළිබඳ නිවේදන, මහ සභාවේ සහ කාරක සභාවේ කාර්යභාරය ;

(ඌ) කොටස් වටිනාකම, කොටස් ලාභාංශය, සමිතියේ ප්‍රාග්ධන අවශ්‍යතා, අරමුදල් රාශීකරණය, තැන්පත් රාශීකරණය, ණය ගනුදෙනු, ආපසු අයකර ගැනීම ආදිය ;

(එ) ගිණුම් සහ විගණන, විගණනය සඳහා සූදානම් වීම, මහ සභාව විසින් විගණන කමිටුව තෝරා ගැනීම, මුදල් වර්ෂය ආදිය ;

(ඒ) කාරක සභාවේ, විගණන කමිටුවේ හා වෙනත් අනුකමිටුවල සංයුතිය හා කාර්යභාරය ;

(ඔ) අතිරික්තය හෝ ලාභ පිළිබඳ කටයුතු, විවිධ අරමුදල් ඇති කිරීම ආදිය ;

(ඕ) දේපළ, උපකරණ හා වෙනත් වත්කම් නතුකර ගැනීමේ හා බැහැර කිරීමේ කාර්ය පටිපාටිය ;

(ක) පොත්පත් හා ලේඛනවල භාරකාරත්වය ;

(ග) සේවකයන් හා ඔවුන්ගේ කාර්ය හා බැඳීම ;

(ජ) ආරවුල් බේරුම් කිරීම ;

(ට) අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ කාර්ය පටිපාටිය ;

(ඩ) සාමාජිකයන් නොවන්නන් සඳහා පනවන යම් සේවා සීමාවන් ;

(න) උපකාරක කටයුතු, බද්ධ කටයුතු ආදිය සඳහා විධිවිධාන ;

(ත) සමිතිය හෝ සංගමය විසුරුවා හැරීමේ කාර්ය පටිපාටිය

(ද) සමිතියේ හෝ සංගමයේ අවශ්‍යතා හා ක්‍රියාකාරකම් සඳහා වන වෙනත් ආනුෂංගික කරුණු ;

(ණ) සමිතියේ හෝ සංගමයේ හෝ කාරක සභා තෝරා පත්කර ගැනීම හා ඉවත් කිරීම හෝ අහෝසිවීම පිළිබඳ විධිවිධාන.

10\. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ සහතිකයෙහි සඳහන් සමිතියෙහි හෝ සංගමයෙහි ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති බව ඔප්පු කරතොත් මිස, ඒ සමිතිය හෝ සංගමය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂි විය යුතු ය. ලියාපදිංචි කිරීමේ සාක්ෂි.

(2) සමිතියක් හෝ සංගමයක් ලියාපදිංචි කරනු ලැබූ විට රීතිවලින් නියම කර ඇති ආකාරයට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය හෝ සංගමය වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

11\. (1) යම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් මේ ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව සමිතියේ හෝ සංගමයේ හෝ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාව ඇතුළු සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැකිය. සමිතියක, සංගමයක අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.

(2) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක කිසිම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක්, ඒ සංශෝධනය මේ ප්‍රඥප්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන්නේ නම් මිස වලංගු නොවිය යුතුය. ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ඒ සංශෝධනයේ පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) ලියාපදිංචි සමුපකාර සමිතියක හෝ සංගමයක අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ කිසිම සංශෝධනයක් 7 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් විධිවිධාන අනුව වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, ඒ සංශෝධනය ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(4) අතුරු ව්‍යවස්ථාවල යම් සංශෝධනයක් මේ ප්‍රඥප්තියට හෝ ඒ යටතේ සාදන ලද රීතිවලට හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන රීතිවලට පටහැනි නොවන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් හා අදාළ සංශෝධනය සුදුසු යැයි සලකතහොත්, ඔහු විසින් ඒ සංශෝධනය ලියාපදිංචි කළ හැකිය. යම් අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනයක් ඒ සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(5) සමුපකාර සමිතියක හෝ සංගමයක නාමයක් වෙනස් කරන සංශෝධනයක් ඒ සමිතියේ, සංගමයේ හෝ එහි යම් සාමාජිකයකුගේ හෝ හිටපු සාමාජිකයකුගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බලනොපෑ යුතු අතර, එවකට පවත්නා යම් නීති කෘත්‍යයක් එහි අළුත් නාමය යටතේ ඒ සමිතිය හෝ සංගමය විසින් හෝ සමිතියට හෝ සංගමයට විරුද්ධව ඉදිරියටත් පවත්වා ගෙන යනු ලැබිය හැකිය.

(6) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක, තමා විසින් සහතික කරන ලද ඒ සංශෝධනයේ පිටපතක් ඔහු විසින් සමිතිය හෝ සංගමය වෙත නිකුත් කළ යුතුය. ඒ සංශෝධනය යථා පරිදි ලියාපදිංචි කර ඇති බවට, ඒ සංශෝධනයේ සහතික කරනු ලැබූ පිටපත තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(7) මේ වගන්තියේ "සංශෝධනය" යන්නට අළුත් අතුරු ව්‍යවස්ථාවක් සෑදීම හා අතුරු ව්‍යවස්ථාවක් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ ඇතුළත් වේ.

12\. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක සෑම අතුරු ව්‍යවස්ථාවකින්ම එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කිරීමෙන් පසු, ඒ සමිතියේ හෝ සංගමයේ එක් එක් සාමාජිකයා විසින් ඒ අතුරු ව්‍යවස්ථාව අත්සන් කරන ලද්දේ නම් හා ඒ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් වූයේ නම් ඒ ප්‍රමාණයටම, ඒ සමිතියට ද හෝ සංගමයට ද ඒ සාමාජිකයන් ද බැඳී සිටිය යුතු ය. සමිතියක, සංගමයක අතුරු ව්‍යවස්ථාවෙන් සාමාජිකයන් බැඳෙන බව.

(2) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක අතුරු ව්‍යවස්ථාව අර්ථ නිරූපනය සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් තම තීරණය දින තිහක් ඇතුළත අදාළ පාර්ශවකරුවන්ට දැන්විය යුතු ය.

ව්‍යාපාර තහනම් කරන අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය

13. යම් රීතියකින්, යම් කරුණක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සෑදීමට ඇති බලය යටතේ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් සම්බන්ධයෙන් සාදන ලද කිසිම අතුරු ව්‍යවස්ථාවක්, ඒ ව්‍යාපාර තහනම් කිරීමේ ගිවිසුමක්ය, යන හේතුව මත පමණක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා බලය

14. ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලින් ඒ සමුපකාර සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් එසේ සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා යම් රීති සැලැස්විය හැකිය. එසේ වුව ද,

(අ) සමුපකාර සමිතිය හෝ සංගමය විසින් ඒ දඩය නියම කිරීමට අදහස් කරන බව හා ඊට හේතු ඒ සාමාජිකයා වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇත්නම් මිස, හා

(ආ) රීතිවලින් නියම කරනු ලැබිය හැකි කාලයක් තුළ හා එහි සඳහන් කර ඇති ආකාරයකින් ඒ දඩය නියම කිරීමට විරුද්ධව ප්‍රමාණවත් හේතු දැක්වීමට ඒ සාමාජිකයා අපොහොසත් වී ඇත්නම් මිස, කිසිම සාමාජිකයෙකුට ඒ දඩය නියම නොකළ යුතු ය.

ලියාපදිංචි කළ සමිතිවල, සංගම්වල වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම, බෙදීම හා පැවරීම

15. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින්, රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව හා ඒ සමුපකාර සමිතියේ හෝ සංගමයේ හෝ මහ සභා රැස්වීමට පැමිණ, ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගේ තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන යෝජනාවකින්-

(අ) සමුපකාර සමිතියේ හෝ සංගමයේ හෝ වත්කම් හා බැරකම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ යම් ලියාපදිංචි කරනු ලැබූ අන් කිසි සමිතියකට හෝ සංගමයකට පැවරීම,

හෝ

(ආ) සමුපකාර සමිතිය හෝ සංගමය, සමුපකාර සමිති හෝ සංගම් දෙකක හෝ ඊට වැඩි වශයෙන් බෙදා වෙන් කර ගැනීම, හෝ කළ හැකිය.

(2) යම් ලියාපදිංචි කළ සමුපකාර සමිති හෝ සංගම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව හා එක් එක් සමිතියේ හෝ සංගමයේ හෝ මහ සභා රැස්වීමකට පැමිණ, ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් හෝ තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන යෝජනාවකින් ඒකාබද්ධ වී අළුත් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ පිහිටුවා ගත හැකිය.

(3) (අ) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් (1) වැනි උපවගන්තිය යටතේ හෝ (2) වැනි උපවගන්තිය යටතේ හෝ සම්මත කරගනු ලබන යෝජනාවේ අවස්ථාවෝචිත පරිදි පැවරීම, බෙදා වෙන් කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ සියලු විස්තර අඩංගු විය යුතුය. මෙම යෝජනාවෙහි අඩංගු විස්තර තත්කාර්යය සඳහා හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරනු ලබන කමිටුවක් විසින් අධ්‍යයනය කර, කමිටුවේ නිර්දේශ ඔහු වෙත ඉදිරිපත් කර, මහ සභාවේ එකඟත්වය ඇතිව ඔහුගේ අනුමැතිය පරිදි එය ක්‍රියාත්මක කළ යුතු ය.

(ආ) (i) යෝජිත පැවරීමේ, බෙදීමේ හෝ ඒකාබද්ධ කිරීමේ ආර්ථික යෝග්‍යතාව සම්බන්ධයෙන්, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන තැනැත්තෙකුගේ හෝ ආයතනයකින් හෝ නිර්දේශ කිරීමේ වාර්තාවක් ලබාගෙන නොමැති නම්,

(ii) ලියාපදිංචි සමිතිය හෝ සංගමය අවස්ථාවෝචිත පරිදි බෙදා ඇත්තේ යම් සමිතිවලට ද හෝ සංගම්වලට ද හෝ නැතහොත් ඒකාබද්ධ වී ඇත්තේ යම් සමිති හෝ සංගම් හෝ සමග ද, ඒ සමිතිවල හෝ සංගම්වල හෝ අතුරු ව්‍යවස්ථාවේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද හෝ සාදනු ලැබ ඇතැයි සැළකෙන යම් රීතියක හො විධිවිධානවලට අනුකූල වන බව පළ කෙරෙන වාර්තාවක් 3 වැනි උපවගන්තියේ (ආ) (1) අනු ඡේදයේ කාර්ය සඳහා වූ තැනැත්තෙකුගෙන් හෝ ආයතනයකින් ලබා ගෙන නොමැති නම්, ස්වකීය වත්කම් හා බැරකම් වෙනත් යම් ලියාපදිංචි සමිතියකට හෝ සංගමයකට පැවරීමකට හෝ එම සමිතිය හෝ සංගමය හෝ සමිති හෝ සංගම් දෙකකට හෝ වැඩි ගණනකට බෙදීමකට හෝ වෙනත් ලියාපදිංචි සමිතියක් හෝ සංගමයක් සමග ඒකාබද්ධ වීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමැතිය දෙනු නොලැබිය යුතු ය.

(4) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් එවැනි යම් යෝජනාවක් සම්මත කර ගනු ලැබූ අවස්ථාවක, ඒ සමිතිය හෝ සංගමය හෝ විසින් සමිතියේ සිය සාමාජිකයින් හා ණය හිමියන්ගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු අතර, පටහැනි අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුම් ඇත් ද, එය නොතකා යම් සාමාජිකයෙකු හෝ ණය හිමියකු හෝ ඒ දැන්වීම කළ දිනයෙන් පසු එක් මාසයක කාලයක් තුළ අවස්ථාවෝචිත පරිදි තම කොටස්, තැන්පතු හෝ ණය මුදල් ඉල්ලා අස්කර ගැනීමේ බලය ඒ සාමාජිකයාට හෝ ණය හිමියාට හෝ තිබිය යුතු ය.

(5) (4) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත තම අස්කර ගැනීමේ බලය ක්‍රියාවෙහි නොයොදවන යම් සාමාජිකයෙකු හෝ ණය හිමියෙකු හෝ විසින් යෝජනාවට කැමැත්ත දක්වනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(6) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් හෝ විසින් මේ වගන්තිය යටතේ සම්මත කර ගත් යෝජනාවකට යම් වත්කම් හා බැරකම් පැවරීමක් ඇතුළත් වන අවස්ථාවක, තත්කාලයෙහි බලපවත්නා යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇති ද, එය නොතකා ඒ සම්මත කර ගත් යෝජනාව තවදුරටත් තහවුරු කිරීමක් නොමැතිව පැවරුම්ලාභීන් වෙත ඒ වත්කම් හා බැරකම් සතු කිරීමේ ප්‍රමාණවත් පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

*ඇතැම් අවස්ථාවල දී ලියාපදිංචි කළ සමිති හෝ සංගම්වල හෝ ලියාපදිංචි කිරීමේ සහතික අවලංගු කිරීම*

16. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ වත්කම් හා බැරකම් සියල්ල ලියාපදිංචි කළ වෙනත් සමුපකාර සමිතියකට හෝ සංගමයකට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව පවරනු ලැබූ අවස්ථාවක, පළමු සඳහන් වූ සමුපකාර සමිතියේ හෝ සංගමයේ හෝ ලියාපදිංචි කිරීම අවලංගු විය යුතු අතර, ඒ සමුපකාර සමිතිය හෝ සංගමය හෝ විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම, සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසාන විය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමුපකාර සමිති හෝ සංගම් හෝ දෙකක් හෝ ඊට වැඩි ගණනක් මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අළුත් සමිතියක් හෝ සංගමයක් හෝ වශයෙන් ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක එසේ ඒකාබද්ධ කරනු ලැබූ ඒ එක් එක් සමුපකාර සමිතියේ හෝ සංගමයේ හෝ ලියාපදිංචි කිරීම අළුත් සමිතිය හෝ සංගමය ලියාපදිංචි කරනු ලැබූ දිනයෙහි අවලංගු විය යුතු අතර, එක් එක් සමිතිය හෝ සංගමය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම, සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතු ය.

(3) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව සමිති දෙකකට හෝ සංගම් දෙකකට හෝ වැඩි ගණනකට වෙන්ව බෙදී යන අවස්ථාවක, ඒ සමිතියේ හෝ සංගමයේ හෝ ලියාපදිංචි කිරීම අළුත් සමිති හෝ සංගම් හෝ ලියාපදිංචි කිරීමෙන් පසු අවලංගු විය යුතු අතර, ඒ සමිතිය හෝ සංගමය හෝ විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතු ය.

*අයවිය යුතු ගෙවීම් කරනු ලබන තෙක්, සාමාජිකයන් විසින් අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු බව*

17. (1) (*අ*) සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ සාමාජිකත්වය සම්බන්ධයෙන් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ගෙවීමක් තමා විසින් කරනු ලැබ ඇත්නම් මිස හෝ කරනු ලබන තෙක් නැතහොත් සමිතියෙහි හෝ සංගමයේ හෝ එසේ නියම කරනු ලැබිය හැකි යම් සම්බන්ධතාවයක් අත් කර ගනු ලැබ ඇත්නම් මිස හෝ අත්කරගනු ලබන තෙක් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ කිසිම සාමාජිකයෙකු විසින් සාමාජිකයෙකුගේ අයිතිවාසිකම් භාවිතා නොකළ යුතු ය.

(*ආ*) සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයන්ගේ වගකීම සීමාසහිත වන අවස්ථා ලියාපදිංචි සමිතියක් නොවන කිසිම සාමාජිකයෙකු විසින් සමිතියේ හෝ සංගමයේ කොටස් ප්‍රාග්ධනයෙන් දරනු ලබන පංගුව, රීති මගින් නියම කරනු ලබන පරිදි පහෙන් එකක උපරිමයකට යටත් විය යුතු ය.

(2) සමිතිය හෝ සංගමය හෝ වැනි (1) වන උපවගන්තියේ සඳහන් යම් ගෙවීමක් කරනු ලැබ නැති හෝ ඒ සමිතියෙහි හෝ සංගමයෙහි හෝ ඒ උපවගන්තියෙහි සඳහන් යම් සම්බන්ධතාවක් අත්කර ගෙන නැති අවස්ථාවක ඒ සාමාජිකයාගෙන් (1) වැනි උපවගන්තියෙහි සඳහන් ඒ ගෙවීම හෝ ඒ සම්බන්ධතාව ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සම්බන්ධයෙන් අයවිය යුතු මුදලක් හෝ වෙනත් අන් නියෝජිතයෙකු වශයෙන් යම් උපලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක් මිලට ගැනීම සම්බන්ධයෙන් සාමාජිකයාට සමිතියෙන් හෝ සංගමයෙන් ගෙවිය යුතු යම් මුදලකින් සමිතිය විසින් අඩුකර ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) (*අ*) සාමාජිකයෙකු විසින් යම් කොටසක් මිලට ගැනීම සඳහා සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ කොටසක වටිනාකම එකවර ගෙවිය යුතු ය. සමිතියේ හෝ සංගමයේ හෝ අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි සාමාජිකයෙකු විසින් ලබා ගත යුතු කොටස් ප්‍රමාණය එකකට වැඩිවන අවස්ථාවක දී එම වැඩිවන කොටස් ප්‍රමාණයේ වටිනාකම වර්ෂයක් ඇතුලත ගෙවිය යුතු ය.

(*ආ*) එසේ වසරක් තුළ ලබාගත යුතු අවම කොටස් ප්‍රමාණය සඳහා මුදල් ගෙවීම සම්පූර්ණ නොකළහොත් ඔහුගේ සාමාජිකත්වය ස්වයංක්‍රීයව අහිමිවන අතර එසේ වන අවස්ථාවන්හි දී ගෙවන ලද කොටස් වාරික සඳහා ඔහුට හිමිකම් පෑමට අයිතියක් නොතිබිය යුතු ය.

(*ඇ*) එමෙන්ම මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ දී එක් කොටසක් සඳහා මුදල් ගෙවීම සම්පූර්ණ කර නැති සාමාජිකයන් එදින සිට මාස 12ක් ඇතුලත අදාල තම කොටස් මුදල් ගෙවීම සම්පූර්ණ කළ යුතු අතර, එසේ නොකළහොත් ඒ හේතුව නිසාම ඔහුගේ සාමාජිකත්වය ද ස්වයංක්‍රීයව අහිමිවිය යුතු ය.

කාරකසභිකත්වයට නුසුදුසුකම්

18. (1) පහත සඳහන් තැනැත්තන් ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක හෝ කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය කාරක සභාවකට හෝ තෝරා පත්කළ නොහැකි ය :-

(අ) පහත 18(4) ඡේදයේ විධි විධානවලට යටත්ව වයස දහඅටක තැනැත්තෙක්,

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකුව සිටීනම්,

(ඇ) සිහිවිකල වූ තැනැත්තෙකු,

(ඈ) පසුගිය තුන් වර්ෂය ඇතුළත දුෂ්චරිතය සම්බන්ධ නඩුවකින් වරදකරුවෙකු වූ කෙනෙක් හෝ තුන්මාසයක් හෝ ඊට අධික කාලයක් සිර දඬුවම් ලැබීමට නියම වූ තැනැත්තෙකු,

(ඉ) සමිතියකට හෝ සංගමයකට හෝ වෙනත් ලියාපදිංචි කළ සමිතියකට හෝ සංගමයකට හෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම තුන් මාසයකට අධික කාලයක් පැහැර හැර ඇති කෙනෙකු හෝ සමිතියට හෝ සංගමයට හෝ වෙනත් සමිතියකට හෝ සංගමයකට හෝ ඇවරකරුවෙකුට ගෙවිය යුතු වෙන යම් මුදලක් ආපසු ගෙවීම පැහැර හැර ඇති තැනැත්තෙක්,

(ඊ) සමිතිය හෝ සංගමය සමඟ ඇති කරගන්නා ලද ගිවිසුමක් හෝ සමිතියේ සංගමයේ යම් විකිණීමක් හෝ මිලට ගැනීමක් හෝ සමිතියේ හෝ සංගමයේ මුදල් සම්බන්ධයෙන් එවකට ඇතිකර තිබෙන්නා වූ ද, ඇතිකර ගැනීමට විධිවිධාන සලස්වා ගෙන යන්නා වූ ද, ගිවිසුමක් හෝ ගණුදෙනුවක් පිළිබඳ සාමාජිකයෙකු හෝ සේවකයෙකු වශයෙන් හැර තමන් විසින්ම හෝ අන් අයෙකුගේ මාර්ගයෙන් හෝ සම්බන්ධයක් ඇති තැනැත්තෙකු,

(උ) සමිතියේ හෝ සංගමයේ දියුණුවට බාධා විය හැකි යැයි රෙජිස්ට්‍රාර්වරයා නිගමනය කරනු ලබන යම් වෙළඳාමක හෝ වෙනත් කටයුත්තකට තමන්ගේම හෝ අන් අයෙකුගේ මාර්ගයෙන් හෝ යෙදී සිටින තැනැත්තෙකු,

(ඌ) සමිතියක හෝ සංගමයක හෝ සමිතිය හෝ සංගමය හෝ සාමාජිකත්වය දරන වෙනයම් සමිතියක හෝ සංගමයක වැටුප් ලබන සේවකයකු,

(එ) යම් සමුපකාර සමිතියකට මුල්‍යමය හෝ ද්‍රව්‍යමය පාඩුවක් හෝ වෙනයම් හානියක් හෝ අලාභයක් සිදුවීමට තුඩුදුන් තීරණයක් ගැනීමට හවුල්වූ තැනැත්තෙකු බවට රෙජිස්ට්‍රාර්වරයා තීරණය කළ තැනැත්තෙකු,

(ඒ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් ලබා දුන් සාමාන්‍ය විධානයක් හෝ තීන්දුවක් හෝ තීරණයක් අනුව කටයුතු කිරීම පැහැර හැරි හෝ ක්‍රියාත්මක නොකළ හෝ ක්‍රියාත්මක කිරීමෙන් මගහැර ඇති අයෙකු,

(ඔ) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පනවනු ලබන රීතිවල හෝ නියෝගවල හෝ අතුරු ව්‍යවස්ථාව හෝ සමුපකාර සේවක කොමිෂන් සභා නීති රීතිවල හෝ විධිවිධාන යටතේ සමිතියක හෝ සංගමයක හෝ නිලයෙන් හෝ සේවයෙන් පහකළ තැනැත්තෙකු,

(ඕ) සමිතියක හෝ සංගමයක හෝ ප්‍රාදේශික කාරක සභාවට හෝ කාරක සභාවට තෝරා පත්කරගත් කෙනෙක් එසේ තෝරා පත්කර ගැනීම නුසුදුසු නොවන බවට අසත්‍ය ප්‍රකාශයක් කළ තැනැත්තෙකු,

(ක) සමිතියෙන් හෝ සංගමයෙන් පසුගිය තුන් වර්ෂය ඇතුළත ලබාගත් ණයක් තුන් මසකට අධික කාලයක් කල් පසු කිරීමේ හේතුවෙන් කාරක සභික හෝ අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තෙකු,.

(2) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙකු හෝ සභිකයෙකු වන කිසිම තැනැත්තෙකු ලියාපදිංචි සමුපකාර සමිතියක හෝ සංගමයක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ධුරය දැරීමට සුදුස්සෙකු නොවන්නේ ය.

(3) සමුපකාර සමිතියක හෝ සංගමයක කාරක සභාවකට හෝ දිස්ත්‍රික් කාරක සභාවකට හෝ ප්‍රාදේශීය කාරක සභාවට හෝ තෝරා පත්කර ගත් සාමාජිකයෙකුගේ නිලය පහත සඳහන් කරුණක් නිසා ඒ කරුණින්ම අහිමි වේ :-

(අ) සමුපකාර සමිතියේ හෝ සංගමයේ සාමාජිකත්වය අහිමිවීම ;

(ආ) මේ වගන්තියේ (1) උපවගන්තියේ (අ) සිට (ක) දක්වා ඇති නුසුදුසුකම් ඇති වීම ;

(ඇ) සමුපකාර සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කාරක සභාවේ හෝ දිස්ත්‍රික් කාරක සභාවේ හෝ ප්‍රාදේශීය කාරක සභාවේ හෝ සාමාජිකයෙකු වීමට සුදුසුකම් නැතිවීම.

(4) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයන් පේෂකර්ම කර්මාන්තයෙහි යෙදී සිටින්නන් හෝ පාසල් ශිෂ්‍යයන් හෝ වෙනත් එවැනි රෙජිස්ට්‍රාර්වරයා විසින් නම් කරනු ලබන සමිතියක හෝ සංගමයක සාමාජිකයින් වයස අවුරුදු 18ට අඩු වුව ද කාරක සභාවට තෝරා පත් කර ගැනීමට සුදුසු විය යුතු ය.

(5) සාමාජිකත්වයට බඳවා ගැනීමේ දින සිට එක් වර්ෂයක් ඉකුත් වන තෙක් ඡන්දය දීමේ අයිතිය හෝ ධුර දැරීමේ අයිතිය සාමාජිකයෙකු විසින් භුක්ති විඳිනු නොලැබිය යුතු ය.

(6) සමුපකාර සමිතියක් හෝ සංගමයක් අළුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරන ඒ සමිතියේ හෝ සංගමයේ සාමාජිකයන් සඳහා (5) වැනි උපවගන්තියේ විධිවිධාන බල නොපැවැත්විය යුතු ය.

(7) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් මෙම ප්‍රඥප්තියේ 56 හෝ 58 වගන්ති යටතේ පත්කළහොත් මිස ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ හෝ සේවය කරන කිසිවකු නිලවරණයක දී ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය කාරක සභාවකට හෝ තෝරාපත් නොකළ යුතු ය.

(8) කෙසේ වුව ද රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් විසින් පිහිටුවාගනු ලබන එම නිලධාරීන්ට පමණක් සීමා වූ ආයතනයක හෝ ආයතන කිහිපයකට අනුබද්ධ සමිති හෝ සංගමයක කාරක සභිකයින් තෝරා ගැනීමේ දී ඉහත (7) උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

ආශ්‍රිත සාමාජිකයෝ

19. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා ගිවිසුමකට එළඹෙන කවර හෝ පුද්ගලයෙකු, ආශ්‍රිත සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත හැකිය.

(2) ආශ්‍රිත සාමාජිකයෙකුට සමුපකාර සමිතියේ හෝ සංගමයේ වත්කම් හෝ ලාභවල කවර කොටසකට හෝ ඒ සමිතියේ හෝ සංගමයේ කටයුතු කර ගෙන යාමෙහිලා යම් ඡන්ද බලයකට හෝ යම් ධුරයක් දැරීමට හෝ හිමිකම් නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි, ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ හෝ සංගමයේ හෝ අතුරු ව්‍යවස්ථාවලින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි, සාමාජිකයෙකුගේ වරප්‍රසාද හා අයිතිවාසිකම් තිබිය යුතු අතර සාමාජිකයෙකුගේ යම් වගකීම්වලට ඔහු යටත් විය යුතු ය.

(4) ආශ්‍රිත සාමාජිකයෙකු පිළිබඳ විධිවිධාන ඒ ඒ සමිතිවල හෝ සංගම්වල අතුරු ව්‍යවස්ථාවල අඩංගු විය යුතු ය.

බාල වයස්කරුවන් වන සාමාජිකයන් විසින් සමිතිය හෝ සංගමය සමග ඇති කරගනු ලබන ගිවිසුම්

20. යම් ලියාපදිංචි සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලැබූ යම් තැනැත්තෙකුගේ බාල වයස හෝ ඔහු නිසි වයසට නොපැමිණීම මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන රීති යටතේ ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කිරීමට හෝ දෙනු ලැබීම අවශ්‍ය නිදහස් කිරීමක් දීමට ඔහුට බාධාවක් නොවිය යුතුය. තව ද එවැනි යම් තැනැත්තෙකු විසින් සමිතිය හෝ සංගමය සමඟ ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම සඳහා හෝ මග හරිනු පිණිස ඒ කරුණ හේතුවක් නොවිය යුතුය. එමෙන්ම එවැනි යම් තැනැත්තෙකු විසින් ප්‍රධාන පාර්ශ්වකරු හෝ ඇපකරු වශයෙන් සමිතියක් හෝ සංගමයක් සමඟ ඇති කර ගත් එවැනි යම් ගිවිසුමක්, ඔහුගේ බාල වයස හෝ නිසි වයසට නොඑළඹීම නොතකා ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව නීතිය අනුව ක්‍රියාකළ හැකි විය යුතු ය.

සමිතිවල හෝ සංගම්වල නිලධරයන් විසින් ඇතිකරගනු ලබන ගිවිසුම්

21. ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ යම් නිලධාරියෙකු පත් කිරීමෙහිලා වූ යම් දෝෂයක් හෝ ඔහු තෝරා පත්කර ගැනීම සඳහා වූ යම් නුසුදුසුකමක් තදනන්තරව සොයාගැනීම, ඒ සමිතිය වෙනුවෙන් ඒ නිලධරයා විසින් ඇතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම හෝ මග හැරවීම සඳහා හේතුවක් නොවිය යුතු ය.

සාමාජිකයන්ගේ ඡන්ද

22. යම් මූලික සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකුට සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහිලා එක් ඡන්දයකට වැඩියෙන් නොතිබිය යුතුය. එසේ වුව ද, ඡන්ද සම සමව බෙදුනහොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

ඡන්දය භාවිත කිරීමේ ආකාරය

23. (1) යම් මූලික සමුපකාර සමිතියක සාමාජිකයෙකු විසින් ඒ සමිතියේ රැස්වීමක දී පෞද්ගලිකවම හැර තම ඡන්දය භාවිතා නොකළ යුතුය. එසේ වුව ද, නියෝජිතයන් මාර්ගයෙන් ඡන්දය දීමට සමිතියේ හෝ සංගමයේ හෝ අතුරු ව්‍යවස්ථා යටතේ විධිවිධාන සළස්වා ඇති අවස්ථාවක සමිතියේ හෝ සංගමයේ යම් රැස්වීමක දී එසේ ඡන්දය දිය හැකිය.

(2) වෙනයම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකුවන යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් ඒ වෙනයම් සමිතියේ හෝ සංගමයේ කටයුතු පවත්වාගෙන යාමෙහිලා ඡන්දය දීමේ කාර්යය සඳහා ස්වකීය සමිතියේ හෝ සංගමයේ සභාපති හෝ කාරක සභාවේ බහුතර එකඟතාවයෙන් කාරක සභාවේ සාමාජිකයෙකු හෝ පත්කළ හැකිය.

කොටස් හෝ සම්බන්ධතා පැවතීම පිළිබඳ සීමා

24. (1) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකුගේ හෝ සිටිය සාමාජිකයෙකුගේ හෝ මියගිය සාමාජිකයකුගේ ප්‍රාග්ධනයෙහි කොටස් හෝ වෙනත් සම්බන්ධතා පැවරීම සහ සතුව සිටිය හැකි වැඩිම ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙන් හෝ රීතිවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව විය යුතු ය.

(2) සීමාරහිත වගකීම්වලින් යුත් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් වූ විට කිසිම සාමාජිකයෙකු විසින්-

(අ) තමා විසින් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් එක් අවුරුද්දකට නොඅඩු කාලයක් දරන ලද්දේ නම්, හා

(ආ) සමිතිය වෙත හෝ සමිතියේ සාමාජිකයෙකු වෙත හෝ සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම්පත්‍රය කාරක සභාව විසින් පිළිගනු ලැබ සිටින තැනැත්තකු වෙත පැවරී කරනු ලබන්නේ නම් මිස, තමා විසින් සමිතියේ ප්‍රාග්ධනයෙන් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් හෝ එහි යම් කොටසක් හෝ නොපැවරිය යුතු ය.

(3) කාරක සභා සහ මහ සභා සඳහා ඉදිරිපත්වන විශ්වාසභංග යෝජනාවල දී රහස් ඡන්දය පාවිච්චි කළ යුතු ය.

## III වන පරිච්ඡේදය

*ලියාපදිංචි කළ සමුපකාර සමිතිවල හා සංගම්වල අයිතිවාසිකම්, බැඳීම් හා වරප්‍රසාද*

සමිතියේ හෝ සංගමයේ ලිපිනය

25. දැන්වීම් හා ලිපි යවනු පිණිස රීතිය අනුව ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයක් සෑම ලියාපදිංචි කළ සමුපකාර සමිතියකටම හෝ සංගමයකටම තිබිය යුතු අතර, ඒ ලිපිනය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇතිවීමෙන් පසු දින හතක් ඇතුලත ඒ වෙනස රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු ය.

ප්‍රඥප්තිය, රීති, අතුරු ව්‍යවස්ථා, කාරක නියෝග යනාදියෙන් පිටපත් පරීක්ෂා කර බැලීමට විවෘතව තිබිය යුතු බව

26. ලියාපදිංචි කළ සෑම සමුපකාර සමිතියක්ම හෝ සංගමයක්ම විසින් මේ ප්‍රඥප්තියේ හා රීතිවල හා සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවල හා කාරක නියෝගවල පිටපතක් ද, සමිතියේ හෝ සංගමයේ සාමාජිකයින්ගේ නාම ලේඛනයක් ද, ගාස්තු ගෙවීමක් නොමැතිව සියලු යුක්ති සහගත වේලාවල දී පරීක්ෂා කර බැලීම සඳහා සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචි කරන ලද ලිපිනයෙහි තැබිය යුතු ය.

සමිති හෝ සංගම් සංස්ථා විය යුතු බව

27. සමිතියක් හෝ සංගමයක් ලියාපදිංචි කිරීම් හේතු කොටගෙන එම ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ, අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති හා දේපළ සතුව සිටීමේ ද ගිවිසුම්වලට ඇතුලත් වීමේ ද, නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීම හා ඒවා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමේ ද සමිතිය හෝ සංගමය ද පිහිටුවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු දේවල් කිරීමේ ද බලය සහිත සංස්ථාවක් විය යුතු ය.

සමිතියට, සංගමයට හෝ සමිතිය, සංගමය මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීම

28. (1) කෘෂිකාර්මික හෝ සත්ත්ව පාලනමය ද්‍රව්‍ය හෝ යම් කර්මාන්තයක නිෂ්පාදන විකිණීම එක් පරමාර්ථයක් වශයෙන් ඇති ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් -

(අ) එවැනි යම් දෙයක් නිෂ්පාදනය කරන සමිතියේ හෝ සංගමයේ සෑම සාමාජිකයෙකුම විසින් ඒ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එහි යම් නිශ්චිත කොටසක්, සමානුපාතයක් හෝ වර්ගයක් ඒ සමිතියට හෝ සංගමයට හෝ සමිතිය හෝ සංගමය මාර්ගයෙන් විකිණිය යුතු බවට ; හා

(ආ) අතුරු ව්‍යවස්ථා හා ගිවිසුම් කඩ කිරීමේ වරදට වරදකරු ලෙස රීතිවලින් නියම කළ හැකි ආකාරයකින් ඔප්පු කරනු ලැබූ හෝ තීන්දු කරනු ලැබූ සාමාජිකයකු වීමෙන් රීතිවලින් හෝ සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිශ්චය කරනු ලබන හෝ තක්සේරු කරනු ලබන මුදලක් ප්‍රමාණ කළ අලාභය වශයෙන් සමිතියට ගෙවිය යුතු බවට, සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සැලැස්වීම හෝ එහි සාමාජිකයන් සමග ගිවිසුමකට ඇතුළු වීම කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් (1) වැනි උපවගන්තිය යටතේ ඇති කර ගත් ගිවිසුමකින් ඒ ගිවිසුම අදාළ වන නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කරනු ලැබීමට ආසන්න සියලු ද්‍රව්‍යයන් කෙරෙහි සමිතියේ හෝ සංගමයේ වාසියට පළමු බැඳීමක් තිබිය යුතු ය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ වූ ගිවිසුමකින් උද්ගතවන යම් නීති කෘත්‍යයක දී ඒ ගිවිසුම ව්‍යාපාර තහනමක් වශයෙන් වූ ගිවිසුමක් යන්න නිදහසට කරුණක් නොවිය යුතු ය.

(4) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකු ඒ සමිතියේ හෝ සංගමයේ සාමාජිකයෙකු වීමට පෙර තම ද්‍රව්‍ය වෙන යම් තැනැත්තෙකුට භාර දීමට ගිවිසගෙන සිටීමේ හේතුව කරන කොටගෙන, ඒ ද්‍රව්‍ය ඒ ලියාපදිංචි කළ සමිතියට හෝ සංගමයට භාරදීමට ඔහු අපොහොසත් වූයේ නම් ඒ නිෂ්පාදන ඒ සමිතියට හෝ සංගමයට භාර දීම තමාට නියම කෙරෙන ඒ සමිතියේ හෝ සංගමයේ යම් අතුරු ව්‍යවස්ථාවක් සාමාජිකයා විසින් කඩ කරනු ලැබූ ලෙස නොසැලකිය යුතු ය.

(5) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම විසින් යම් ද්‍රව්‍යයක් වෙනයම් තැනැත්තෙකුට භාර දීම සඳහා තමා ඇති කරගත් සිය ගිවිසුම් පිළිබඳ විස්තර තම ඉල්ලුම් පත්‍රයෙහි හෙළිදරව් කරන ලෙස සමිතියේ හෝ සංගමයේ කාරක සභාව විසින් නියම කරනු ලැබුවහොත්, එසේ කළ යුතු ය.

අමුද්‍රව්‍ය නිෂ්පාදන හා සතුන් සමිතියක හෝ සංගමයක අයිතිය

29. ණයකරුවෙකුගේ දේපළ සම්බන්ධයෙන් රජයේ ප්‍රමුඛතා හිමිකමකට හා කුලී හෝ කුලී වශයෙන් අයකර ගත හැකි යම් මුදලක් සම්බන්ධයෙන් ඉඩම් හිමියෙකුගේ කැප අයිතියට හෝ හිමිකම් කියාපෑමකට සහ නිශ්චල දේපළ සම්බන්ධයෙන් එහි කලින් ලියාපදිංචි කරන ලද යම් බැඳීමකට යටත්ව -

(1) යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් ලියාපදිංචි කළ සමුපකාර සමිතියකට හෝ සංගමයකට ගෙවිය යුතු යම් ණයක් හෝ සපුරා නොමැති ඉල්ලීමක්,

(අ) ඒ සාමාජිකයා හෝ කලින් සිටි සාමාජිකයා විසින් ඒ සමුපකාර සමිතියෙන් හෝ සංගමයෙන් ගත් ණය මුදලකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වවන ලද වගාවක් හෝ එසේ ලබාගත් වෙනත් කෘෂි ද්‍රව්‍යයක් කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය ;

(ආ) ඒ සමුපකාර සමිතිය හෝ සංගමය විසින් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකුට දෙන ලද මුදලින් හෝ භාණ්ඩවලින් ඔහු යම් හෙයකින් සම්පූර්ණයෙන්ම හෝ ඔහු විසින් මිලට ගනු ලැබූ හෝ ඔහුට සපයන ලද හෝ යම් සතුන්, සතුන් සඳහා ආහාර, ධීවර, කෘෂිකාර්මික හෝ කාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමුද්‍රව්‍ය හෝ කර්මාන්තශාලා, ගබඩා, ව්‍යාපාරික ස්ථාන හෝ කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය ;

(ඇ) එසේ වුව ද, මෙහි අන්තර්ගත කිසිවක් එවැනි යම් වගාවක් හෝ වෙනත් කෘෂිකාර්මික ද්‍රව්‍යයන්, සතුන්, සතුන් සඳහා ආහාර හෝ ධීවර හෝ කෘෂිකාර්මික හෝ කාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමුද්‍රව්‍ය, දැනුම් දීමක් නොමැතිව සත්භාවයෙන් මිලට ගන්නා ගැනුම්කරුවකුගේ හෝ පැවරුම්ලාභියෙකුගේ හිමිකම් කෙරෙහි බලනොපෑ යුතු ය ; තව ද,

(ඈ) ව්‍යවස්ථාපිත මණ්ඩලයට අනුයෝජිතයෙකු වශයෙන් යම් උපලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක් මිලට ගැනීම සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට සමුපකාර සමිතියෙන් හෝ සංගමයෙන් අයවිය යුතු යම් මුදලක් කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය ;

(2) ගෙවල් කුලිය, කොටස්, ණය මුදල් හෝ ගැනුම් මුදල් සම්බන්ධයෙන් යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් නිවාස සංගමයකට ගෙවිය යුතු යම් සපුරා නොමැති මුදල් හෝ නොගෙවා ඇති ගාස්තු ඒ සමිතියට හෝ සංගමයට ගෙවිය යුතු වෙනයම් අයිතිවාසිකම් මුදල් සමිතියේ හෝ සංගමයේ නිශ්චල දේපළ පිළිබඳ ඔහුගේ සම්බන්ධතාව කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය.

සාමාජිකයන්ගේ කොටස් හෝ සම්බන්ධතා කෙරෙහි බැඳීම් හා හිලව් කිරීම

30. සාමාජිකයෙකුගෙන්, කලින් සිටි සාමාජිකයෙකුගෙන් හෝ මිය ගිය සාමාජිකයෙකුගේ බූදලයෙන්,

(අ) ඒ සමුපකාර සමිතියට හෝ සංගමයට අයවිය යුතු යම් ණයක් ;

(ආ) අන් කිසි ලියාපදිංචි කළ සමුපකාර සමිතියකට හෝ සංගමයකට අයවිය යුතු යම් ණයක්,

හෝ

(ඇ) යම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක ඇවරකරුට අයවිය යුතු යම් මුදලක්, පියවීම සඳහා ඒ සාමාජිකයාගේ, කලින් සිටි සාමාජිකයාගේ හෝ මියගිය සාමාජිකයාගේ ප්‍රාග්ධනයේ කොටස් හෝ වෙනත් සම්බන්ධතා හා තැන්පතු කෙරෙහි ද, සාමාජිකයාට හෝ කලින් සිටි සාමාජිකයාට හෝ මියගිය සාමාජිකයාගේ බූදලයට ගෙවිය යුතු යම් ලාභාංශයක්, ප්‍රසාද මුදලක් හෝ ලාභ කෙරෙහි ද ලියාපදිංචි කළ සමිතියට හෝ සංගමයට බැඳීමක් තිබිය යුතු අතර, සාමාජිකයෙකුට හෝ කලින් සිටි සාමාජිකයෙකුට හෝ මියගිය සාමාජිකයෙකුගේ බූදලයකට බැර කෙරෙන හෝ ගෙවිය යුතු මුදලක් හිලව්කිරීම් හෝ එවැනි ණයක් හෝ මුදලක් හෝ ගෙවීමෙහිලා හෝ ගෙවීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ අන් සමුපකාර සමිතියට හෝ සංගමයකට හෝ ඇවරකරුට ගෙවීම් ඒ ලියාපදිංචි කළ සමිතිය හෝ සංගමය විසින් කළ හැකිය.

කොටස් දායක මුදල් හා වෙනත් සම්බන්ධතා තහනම් කිරීමට හෝ විකිණීමට යටත් නොවන බව

31. ඉහත 30 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ප්‍රාග්ධනයෙහි සාමාජිකයෙකුගේ කොටස, දායක මුදල හෝ වෙනත් සම්බන්ධතාව ඒ සාමාජිකයා විසින් ඇති කර ගන්නා ලද යම් ණයක් හෝ වගකීමක් සම්බන්ධයෙන් අධිකරණයක යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් යටතේ තහනමට ගැනීමට හෝ විකිණීමට යටත් නොවිය යුතුය. එසේ බුන්වත් වීමේ දී පත්කරනු ලබන ඔහුගේ පැවරුම්ලාභියාට හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 'එල්' පරිච්ඡේදය යටතේ

පත් කරනු ලබන භාරගන්නෙකුට ඒ කොටසට, දායක මුදලට හෝ වෙනත් සම්බන්ධතාවකට කිසිදු හිමිකමක් හෝ ඒ සම්බන්ධයෙන් හිමිකම් කියා පෑමේ කිසියම් අයිතියක් නොතිබිය යුතු ය.

සාමාජිකයෙකු මියගිය විට සම්බන්ධතා පැවරීම

32. (1) සාමාජිකයෙකු මියගිය පසු ලියාපදිංචි කල සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් ඒ මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීති අනුව නම් කරනු ලැබූ තැනැත්තෙකුට හෝ එසේ නම් කරනු ලැබූ කිසිම තැනැත්තෙකු නොසිටීනම් මියගිය සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමකරු හෝ නියෝජිතයා ලෙස කාරක සභාවට පෙනී යා හැකි වෙනයම් තැනැත්තෙකුට පැවරිය හැකිය. නැතහොත් රීති හෝ අතුරු ව්‍යවස්ථා අනුව නිශ්චය කරනු ලැබූ ඒ සාමාජිකයාගේ කොටසේ හෝ වෙනත් සම්බන්ධතාවයේ වටිනාකමට සමාන මුදලක් ඒ නම් කල තැනැත්තාට, උරුමකරුට හෝ නීත්‍යානුකූල නියෝජිතයාට ගෙවිය හැකිය.

(අ) එසේ වුව ද සීමාරහිත වගකීම්වලින් යුතු සමිතියක් සම්බන්ධයෙන් වූ විට අවස්ථාවෝචිත පරිදි ඒ නම් කරනු ලැබූ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතාවයක් සම්බන්ධයෙන් ඉහත කී පරිදි නිශ්චය කරනු ලැබූ වටිනාකම සමිතිය විසින් ගෙවන ලෙස ඉල්ලා සිටිය හැකිය.

(ආ) සීමාසහිත වගකීම් වලින් යුත් සමුපකාර සමිතියක් හෝ සංගමයක් සම්බන්ධයෙන් වූ විට සමිතිය හෝ සංගමය විසින්, මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා සමිතියේ හෝ සංගමයේ සාමාජිකත්වය සඳහා රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සුදුසුකම් ලත්, අවස්ථාවෝචිත පරිදි ඒ නම් කළ තැනැත්තා උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත හෝ මියගිය තැනැත්තාගේ මරණයෙන් පසු මාස හයක් ඇතුලත ඔහු විසින් කරනු ලබන ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබූ, එසේ සුදුසුකම් ලත් වෙනයම් තැනැත්තෙකු වෙත පැවරිය හැකිය.

(2) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් ඒ සමිතියේ හෝ සංගමයේ මියගිය සාමාජිකයාට ගෙවිය යුතු වෙනත් සියළු මුදල් අවස්ථාවෝචිත පරිදි ඒ නම්කල තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත ගෙවිය යුතු ය.

(3) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කරන ලද සියළුම පැවරීම් හා ගෙවීම් වෙනයම් තැනැත්තෙකු විසින් සමිතියට හෝ සංගමයට ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට විරුද්ධව වලංගු හා බල සහිත විය යුතු ය.

බාලවයස්කරුවෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන තැන්පතු

33. (1) ලියා පදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් බාල වයස්කරුවන්ගෙන් හෝ ඔවුන්ගේ අර්ථලාභය සඳහා තැන්පතු බාරගත හැකි අතර, ඒ තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය යුතු විය හැකි පොලිය ඒ බාල වයස්කරුවන්ට ලියාපදිංචි කල සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් ගෙවීම නීත්‍යානුකූල විය යුතුය. බාල වයස්කරුවෙකු විසින් කරන ලද යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමග ඒ බාල වයස්කරුට ගෙවනු ලැබිය හැකිය. තව ද, බාලවයස්කරුවකු වෙනුවෙන් වූ යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමග ඒ බාල වයස්කරුගේ ප්‍රයෝජනය සඳහා ඒ බාල වයස්කරුගේ භාරකරු වෙත ගෙවනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය යටතේ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් යම් බාලයවස්කරුවෙකුට ගෙවන ලද මුදල් සඳහා ඔහුගෙන් ලබා ගන්නා ලදුපත ඒ මුදල සම්බන්ධයෙන් ඒ සමිතියේ හෝ සංගමයේ වගකීම් ඉටුකළ බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු ය.

සමිතියේ සංගමයේ ණය සම්බන්ධයෙන් හිටපු සාමාජිකයා හා මියගිය සාමාජිකයාගේ බූදලය බැඳී ඇති බව

34. (1) හිටපු සාමාජිකයකු සාමාජිකයකුව සිටීම කෙලවර වූ දින පැවතියා වූ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක ණය සම්බන්ධයෙන් ඔහුගේ බැඳීම ඒ දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ අඛණ්ඩව පැවතිය යුතු ය.

(2) සාමාජිකයෙකු මියගිය දින සිට ගණන් බලනු ලබන අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ ඔහුගේ බූදලය, ඔහු මියගිය දින පැවති සමිතියේ ණය සම්බන්ධයෙන් බැඳී තිබිය යුතු ය.

සාමාජිකයන්ගේ නාමලේඛණය

35. යම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ගේ යම් නාම ලේඛණයක් හෝ ලැයිස්තුවක් එහි සටහන් කරන ලද පහත සඳහන් විස්තර වලින් යම් විස්තරයක් පිළිබඳව බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු ය.

(අ) සාමාජිකයෙකු වශයෙන් යම් තැනැත්තෙකුගේ නම ඒ නාම ලේඛණයෙහි හෝ ලැයිස්තුවෙහි සටහන් කරන ලද දිනය,

(ආ) එබඳු යම් තැනැත්තෙකු සාමාජිකයකුව සිටීම නතර කළ දිනය,

(ඇ) සාමාජිකයා විසින් නම් කරනු ලැබ ඇති තැනැත්තාගේ නම හා නම් කරනු ලැබූ දිනය

36. (1) ලියාපදිංචි කල සමිතියක් හෝ සංගමයක් ගණුදෙනුකිරීමේ දී විධිමත් ලෙස තබන ලද පොතක වූ යම් සටහනක පිටපතක් රීතිවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහතික කරනු ලැබුයේ නම්, ඒ සටහන පැවති බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ලෙස යම් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක දී පිළිගත යුතුය. තව ද, ඒ මුල් සටහන පිළිගනු ලබන සෑම අවස්ථාවක දී ම හා පිළිගනු ලබන ප්‍රමාණයටම ඒ පිටපතේ සටහන් කරන ලද කරුණු, ගණුදෙනු හා ගණන් පිළිබඳ සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු ය. සමිතියේ, සංගමයේ පොත්පත්වල සටහන් ඔප්පු කිරීම

(2) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් පාර්ශවකරුවකු නොවන යම් නීති කෘත්‍යයක දී (1) වැනි උපවගන්තිය යටතේ ඔප්පු කළ හැකි කරුණු අඩංගු ඒ සමිතියේ හෝ සංගමයේ පොත්වලින් යම් පොතක් ඉදිරිපත් කරන ලෙස එහි සටහන් කරන ලද යම් කරුණු ගණුදෙනු හෝ ගණන් ඔප්පු කිරීම පිණිස සාක්ෂිකරුවෙකු වශයෙන් පෙනී සිටින ලෙස අධිකරණය විසින් විශේෂ හේතු කාරණා කොටගෙන එසේ කිරීමට විධානය කරනහොත් මිස, ඒ සමිතියේ හෝ සංගමයේ කිසිම නිලධරයකුට බල නොකල යුතු ය.

37. තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියක් හෝ වෙනත් නීතියක් නොතකා ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින්, සමිතියක් හෝ සංගමයක් විසින් ඔඩපන වශයෙන් සුරැකුම්පත් තැන්පත් කිරීම

(අ) සාමාන්‍ය ගිණුම් තුලනයක් සඳහා ඇපය වශයෙන් ඒ සමිතිය හෝ සංගමය සතු යම් සුරැකුම්පත් ඔඩපනය කල හැකිය, හා

(ආ) සමුපකාර සමිතිය හෝ සංගමය වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක් අවසන් වන දිනයේ මුදල් ගෙවීම නොකරන ලද්දේ නම් අධිකරණය වෙත නොගොස් ඒ සුරැකුම්පත් වලින් යමක් හෝ සියල්ලම විකුණා එයින් ලැබෙන මුදල් ඒ ගිණුම් තුලනයට බැර කිරීම සඳහා ණය හිමියාට බලය පැවරිය හැකිය.

38. (1) ලියාපදිංචි කල සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් එහි පරමාර්ථ වලට සම්බන්ධ යම් කාර්යයන් සඳහා ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීම, බද්දට ගැනීම, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හා බද්දට දීම, විකිණීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය. දේපළ අත්කර ගැනීම හා විකිණීමේ අයිතිය

(2) එසේ වුව ද, යම් නිශ්චල දේපළකට හෝ මේ ප්‍රඥප්තිය යටතේ ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීතිවල නිශ්චිතව සඳහන් කරන ලද යම් චංචල දේපළකට අදාල මේ වගන්තියේ පෙරාතුව වූ විධානයන්හි සඳහන් යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් වූ විට රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතු ය.

39. (1) ලියාපදිංචි කල සමිතියක හෝ සංගමයක පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අවස්ථාවක එම කාර්යය පොදු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ සමිතියේ හෝ සංගමයේ කාර්ය සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත්පත් කරගත හැකිය. ඉඩම් හා ගොඩනැගිලි අනිවාර්යයෙන් අත් කර ගැනීම

(2) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් සඳහා රජය විසින් හෝ පළාත් සභාව විසින් රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්පත් කරගත යුතු අවස්ථාවක ඒ සමිතිය හෝ සංගමය විසින් ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඒ පනතේ විධි විධාන යටතේ නියෝගයක් කරනු ලැබීමට පෙර, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ඒ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල හා අත්කර ගැනීමේ කටයුතු වලදී රජය විසින් හෝ පළාත් සභා විසින් දරනු ලබන වියදම් ද, රජයට හෝ පළාත් සභාවට ගෙවිය යුතු ය.

(3) එසේ වුව ද, ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කිරීමට පෙර යම් හදිසි කාර්යයන් හේතු කොට ගෙන යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් නිශ්චය කරනු ලැබිය හැකි යැයි අත්කර ගැනීමේ නිලධාරියා අදහස් කරන යම් මුදලක් ඒ නියමය කිරීමට පෙර ඒ සමුපකාර සමිතිය හෝ සංගමය විසින් රජයට හෝ පළාත් සභාවට ගෙවිය යුතු අතර, ඉතිරි මුදලක් ඇතොත් ඒ ඉතිරි මුදල ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කිරීමෙන් පසු ගෙවිය යුතු ය.

## IV වැනි පරිච්ඡේදය

### මුද්දර ගාස්තුවෙන් සහ ගාස්තු වලින් නිදහස් වීම

40. (1) ලියාපදිංචි කළ සෑම සමුපකාර සමිතියක්ම හෝ සංගමයක්ම, මුද්දර ගාස්තු වලින් හා ගාස්තු වලින් නිදහස් කිරීම

(අ) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් හෝ සංගමයක් විසින් හෝ වෙනුවෙන් හෝ ඒ සමිතියේ හෝ සංගමයේ වාසියට ලියා අත්සන් කරනු ලබන යම් නීත්‍යානුකූල ලේඛනයක් සම්බන්ධයෙන් හෝ 69 වැනි වගන්තියේ විධිවිධාන අනුව අධිකරණයට ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් සම්බන්ධයෙන් මේ උප වගන්තිය මඟින් නිදහස් කිරීම නිසා නොවේ නම් අය කෙරෙන ගාස්තුව ගෙවීමට ඒ සමිතිය හෝ සංගමය යටත් විය හැකි අවස්ථා වලදී ඒ නීත්‍යානුකූල ලේඛනයක් හෝ අන් ලේඛනය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවකින්, හා

(ආ) ලේඛන ලියාපදිංචි කිරීමට අදාලව තත් කාලයේ දී බල පවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකු විසින් ඒ ලියා පදිංචි කළ සමිතියේ හෝ සංගමයේ වාසියට සහ ඒ සමිතියේ හෝ සංගමයේ ව්‍යාපාර කටයුතු වලට අදාලව ලියා අත්සන් කරනු ලබන යම් නීත්‍යානුකූල ලේඛනයක් සම්බන්ධයෙන්, මේ උප වගන්තිය මඟින් නිදහස් කිරීම නිසා නොවේ නම්, අය කෙරෙන ගාස්තුව ගෙවීමට ඒ සාමාජිකයා යටත් විය හැකි අවස්ථා වලදී ඒ නීත්‍යානුකූල ලේඛනය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන් ඒ සෑම සාමාජිකයෙකුම නිදහස් විය යුතු ය.

## V වැනි පරිච්ඡේදය

### ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක ව්‍යාපාර දේපළ හා අරමුදල් කළමනාකරණය

*ව්‍යාපාර කටයුතු හා වාර්ෂික සංවර්ධන සැලැස්ම*

41. (1) සමිතියේ හෝ සංගමයේ අරමුණු වලට හා මහසභාව විසින් අනුමත කරන ලද සංවර්ධන වැඩසටහන හා අයවැය ඇස්තමේන්තු වලට අනුකූලව, සාමාජික අවශ්‍යතා ඉටු වන ආකාරයෙන් එහි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සමිතියේත්, සංගමයේත්, සමිතියේ හා සංගමයේ කාරක සභාවේ හා කාර්ය මණ්ඩලයේත් වගකීම වන්නේ ය. නොසැලකිල්ල, ඕනෑකමින් පැහැර හැරීම, අනුමත නොකළ වියදම් හා අනුමත නොකළ ආයෝජනත් නිසා සමිතියට, සංගමයට සිදු වන යම් පාඩුවකට කාරක සභාව හා විධායක මට්ටම්වල කළමනාකාරීත්වය වග කිව යුතු ය.

(2) සමුපකාර සමිතියේ හෝ සංගමයේ සමස්ථ අරමුණු ඉටු වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති පාලනය මැනවින් ඉටු කිරීම කාරක සභාව හා කළමනාකාරීත්වය විසින් කළ යුතු ය.

(3) සමිතියේ හෝ සංගමයේ ඉදිරි වර්ෂය සඳහා සමිතියේ හෝ සංගමයේ සංවර්ධන සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වීමට යටත් පිරිසෙයින් තුන් මසකට කලින් සකස් කර මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කාරක සභාව හා කළමනාකාරීත්වය ක්‍රියා කළ යුතු ය.

*ලියාපදිංචි කළ සමිති හෝ සංගම් වලින් දෙනු ලබන ණය*

42. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් සාමාජිකයෙකු නොවන කිසිම තැනැත්තෙකුට යම් මුදලක් හෝ වෙනත් ඕනෑම දෙයක් ණයක් වශයෙන් ලබා නොදිය යුතු ය.

(2) එසේ වුව ද, ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක මහ සභාවේ අනුමැතිය ඇතිව හා නියම කරන ලද යම් කොන්දේසි මත, ලියා පදිංචි කළ අන් සමුපකාර සමිතියකට හෝ සංගමයකට හෝ ආශ්‍රිත සාමාජිකයෙකුට හෝ එම සමිතියේ හෝ සංගමයේ සේවකයෙකුට හෝ ණය ප්‍රදානය කළ හැකි අතර ව්‍යාපාරික කටයුතු සඳහා සමිතියේ හෝ සංගමයේ අනුයෝජිතයෙකු ලෙස පත් කරන ලද පුද්ගලයෙකු හෝ වෙනත් ආයතනයක් සමඟ විධිමත් ගිවිසුමක් අනුව බඩු ණයට සැපයීම කරනු ලැබිය හැකිය.

(3) ස්වකීය මහ සභාවේ අනුමැතිය ඇතිව හැර, ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක් විසින් කෘෂිකාර්මික නිෂ්පාදන නොවන වෙනයම් චංචල දේපළක් ඇපයට තබාගෙන (2) වැනි උප වගන්තියේ සඳහන් පාර්ශ්වයන්ට මුදල් ණයට නොදිය යුතුය. එහෙත් යම් විශ්වාසී සුරැකුමක් හෝ ස්ථාවර දේපළක් උකසට තබාගෙන ණය මුදලක් ලබා දිය හැකිය.

*ලියාපදිංචි කළ සමිතිය හෝ සංගමය විසින් භාරගනු ලබන තැන්පතු හා ණය මුදල්*

43. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් රීති වලින් හෝ අතුරු ව්‍යවස්ථා වලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක් සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් තැන්පතු හා ණය මුදල් භාරගත යුතු ය.

(2) ලියාපදිංචි කළ සමුපකාර සමිතියකට හෝ සංගමයකට යම් නිශ්චල හෝ චංචල දේපළක උකස පිට බැංකුවක් විසින් ණය මුදලක් දෙන ලද අවස්ථාවක, ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ උකස් ලියාපදිංචි කිරීමේ දිනයට පෙර එම ආඥාපනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද්දා වූ ද, එම දේපළට බලපාන්නා වූ ද, උකසක් හෝ එසේ ලියාපදිංචි කරන ලද උකසකින් ආරක්ෂිත එසේ බලපාන්නා වූ ගෙවීමකට බැඳී සිටීමක් හැර එම දේපළට බලපාන්නා වූ ඒ ලියාපදිංචි කළ සමිතියේ හෝ සංගමයේ කවර වූ හෝ අන් සෑම ණයකට හෝ එසේ බලපාන්නා වූ සෑම උකසකට හෝ ගෙවීමකට බැඳී සිටීමට ඉහලින් ප්‍රමුඛත්වය ඇතිව ඒ උකසේ ලියාපදිංචි කිරීමේ දින සිට හා ඉන් පසු ඒ උකස යටතේ වූ මුදල් ගෙවීමට ඒ දේපළ බැඳී තිබිය යුතු ය.

*සාමාජිකයින් නොවන තැනැත්තන් සමග කරනු ලබන වෙනත් ගණුදෙනු සීමා කිරීම*

44. ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින් සාමාජිකයින් නොවන තැනැත්තන් සමග කරනු ලබන ගණුදෙනු මෙම ප්‍රඥප්තියේ 42 වැනි හා 43 වැනි වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර රීති වලින් නියම කර ඇති තහනම් හා සීමාකිරීම් වලට යටත් විය යුතු ය.

45. (1) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් භාර ආඥාපනතේ 20 වැනි වගන්තියේ නිශ්චිතව සඳහන් නිශ්චල දේපළ සම්බන්ධව පළමු උකසක් නොවන යම් සුරැකුම් පත් වල වූ යම් බැංකුකරුවෙකු සමග හෝ බැංකුකරු වශයෙන් ක්‍රියාකරන යම් තැනැත්තෙකු සමඟ හෝ වෙනයම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ සමුපකාර සමාගම හෝ කොටස් වල හෝ ඇපය පිට හෝ රීති වලින් අවසර දෙන ලද වෙනයම් ආකාරයකින් සමිතියේ හෝ සංගමයේ අරමුදල් තැන්පත් කිරීම හෝ ආයෝජනය කිරීම කළ හැකිය. රාජ්‍ය බැංකුවකින් බැහැර බැංකුවක ආයෝජනය කරන්නේ නම් එම බැංකුව හෝ ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ බැංකුවක් හෝ ආයතනයක් විය යුතු ය. සමිතියේ හෝ සංගමයේ අරමුදල් අයෝජනය කිරීම

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකව තිබුනේ නම් වලංගු විය හැකිව තිබූ මේ ප්‍රඥප්තිය ආරම්භ වීමට පෙර කරන ලද යම් තැන්පතුවක් හෝ ආයෝජනයක් මෙයින් වලංගු කර ස්ථිර කරනු ලැබේ.

46. සමූපකාර සංවර්ධන අරමුදල නමින් අරමුදලක් පිහිටුවිය යුතුය. වාර්ෂික විගණනයේ දී නිශ්චය කරනු ලබන සමිතියේ හෝ සංගමයේ ශුද්ධ ලාභ වලින් සියයට 10ක් (දහයක්) එම අරමුදලට දායක වශයෙන් සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ගෙවිය යුතුය. අදාළ මුදල් වර්ෂය තුළ සමිතිය හෝ සංගමය ශුද්ධ ලාභයක් උපයා නැති විටක රුපියල් සියයක් (100.00) අරමුදල වෙත ගෙවිය යුතුය. මෙම සියළු ගෙවීම් එසේ ගෙවන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ලිඛිතව දැනුම්දුන් දිනයකට පෙර ගෙවා අවසන් කළ යුතුය. මෙම අරමුදල රීති මගින් සලසනු ලබන විධිවිධාන වලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් පාලනය කළ යුතු ය. සමූපකාර සංවර්ධන අරමුදල පිහිටුවීම

47. ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ වාර්ෂික විගණනයේ දී නිශ්චය කරනු ලබන ශුද්ධ ලාභ වලින් සියයට විසි පහකට (25%) නොඅඩු මුදලක් සමිතියේ නිදන් අරමුදලට නැතහොත් ව්‍යවස්ථාපිත සංචිතයට මාරුකල යුතුය. මෙම අරමුදල පරිපාලනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සකස් කළ යුතු ය. සමිතියේ හෝ සංගමයේ නිදන් අරමුදල හෝ ව්‍යවස්ථාපිත සංචිතය පිහිටුවීම

48. (1) සාමාජික සංවර්ධන සුභ සාධන අරමුදල නමින් අරමුදලක් සෑම ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින්ම පිහිටුවිය යුතු ය. සාමාජික, සංවර්ධන හා සුභසාධන අරමුදල පිහිටුවීම

(2) ලියාපදිංචි කරන ලද සෑම සමුපකාර සමිතියක හෝ සංගමයක විගණනයේ දී අනාවරණය වන ශුද්ධ ලාභයෙන් සියයට දහයක් (10%) සාමාජික සංවර්ධන හා සුභ සාධන අරමුදලට දායක මුදල වශයෙන් ගෙවිය යුතු ය.

(3) මෙම අරමුදල සමුපකාර සමිතියේ හෝ සංගමයේ මහ සභාව මඟින් තීරණය කර සාදනු ලබන කාරක රීති මගින් සලසනු ලබන විධි විධානවලට අනුකූලව කාරක සභාව විසින් පාලනය කළ යුතු ය.

49. ලියාපදිංචි කළ සෑම සමිතියක් හෝ සංගමයක් විසින් ම 51 වැනි වගන්තිය යටතේ විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් මුදල් වර්ෂයක් තුළ එහි වූ ශුද්ධ ලාභ වලින් ඉහත 46, 47, 48 වගන්තිවල සඳහන් අරමුදල්වලට වෙන් කිරීමෙන් පසුව ඉතිරිවන ශුද්ධ ලාභ වල ශේෂය පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන් යමක් සඳහා ප්‍රයෝජනයට ගත හැකිය. ඉතිරි ලාභ පිළිබඳ සුදුසු පරිදි ක්‍රියා කිරීම

(අ) සාමාජිකයන් විසින් ගෙවා නිම කරන ලද කොටස් ප්‍රාග්ධනය සඳහා වාර්ෂික ලාභයෙන් සියයට දහයක් හෝ ඉතිරි ලාභයෙන් සියයට දහයක් යන ප්‍රමාණ දෙකෙන් වැඩි ප්‍රමාණය ලාභාංශ වශයෙන් ගෙවීම.

(ආ) සාමාජිකයින් විසින් සමිතිය හෝ සංගමය සමඟ කරන ලද ගනුදෙනු වල වටිනාකම අනුව හා ඒ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවලින් නියමිත ප්‍රමාණයට හා යම් ආකාරයකින් ඔවුන්ට ප්‍රතිදාන ගෙවීම.

(ඇ) අතුරු ව්‍යවස්ථාවල නියම කළ හැකි යම් අරමුදල් වලට දායක මුදල් ගෙවීම

(ඈ) සමිතියේ හෝ සංගමයේ සේවකයින්ට ප්‍රසාද මුදල් ගෙවීම හා ඔවුන්ගේ සුභ සාධන සමිතියට යම් මුදලක් ගෙවීම.

(ඉ) යම් සමාජයීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයන් පිණිස හෝ ප්‍රාදේශීය හෝ මහජන ප්‍රයෝජනය සඳහා හෝ වෙන යම් ප්‍රජා සංවර්ධන අරමුණක් සඵල කිරීම සඳහා වැය කිරීම පිණිස පොදු සුභ සාධක අරමුදලකට ශුද්ධ ලාභ වලින් සියයට දහයකට නොවැඩි යම් මුදලක් ගෙවීම.

## **VI** වැනි පරිච්ඡේදය

### ලියාපදිංචි සමිතියක හෝ සංගමයක ගිණුම් අය වැය සහ විගණනය

50. (1) (අ) සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින්ම, එම සමිතියේ හෝ සංගමයේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගණුදෙනු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම් පවත්වාගෙන යෑමට සැලැස්විය යුතු ය. සමිතියේ හෝ සංගමයේ ගිණුම්, අය වැය ලේඛණ පිළියෙල කිරීම

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරන ලද සමිතියේ හෝ සංගමයේ කටයුතුවලට අදාළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින්ම සකස් කළ යුතුය. ඒ මූල්‍ය ප්‍රකාශය අදාළ වන මුදල් වර්ෂය අවසාන වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත හෝ සමිතිය හෝ සංගමය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) සෑම ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසින්ම, ආදායම් ඉලක්ක, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම, මූල්‍ය හා මුදල් සම්පත්, මුදල් ආයෝජන, අයවැය ගත කරන ලද ලාභ අලාභ ගිණුම්, ආදායම් හා වියදම් ගිණුම් සහ ශේෂ පත්‍ර දැක්වෙන අයවැය ලේඛණයක් සහ ඉහත 41 වැනි වගන්තියේ විධි විධාන පරිදි සංවර්ධන සැලැස්මක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ මාස දෙකකට කලින්, අනුමැතිය සඳහා සමිතියේ හෝ සංගමයේ මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) එම අයවැය ලේඛනයේ පිටපතක් සහ ඉහත 41 වැනි වගන්ති විධිවිධාන පරිදි සකස්කරන ලද සංවර්ධන සැලසුමේ පිටපතක් අදාළ වන මුදල වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ එක මාසයකට කලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(ඈ) එම අයවැය ලේඛනය පිළියෙල කරනු ලැබිය යුතු ආකෘතිය හා ආකාරය ද, එහි අඩංගු විය යුතු අවම තොරතුරු ද, රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතු ය.

(ඉ) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක සාමාජික සංඛ්‍යාව හා එහි ආදායම හා වියදම සැලකිල්ලට ගෙන මේ වගන්තියේ විධිවිධානවලින් යම් සමිතියක් හෝ සංගමයක් නිදහස් කිරීම අවස්ථානුකූල යැයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, විශේෂ හෝ සාමාන්‍ය නියමයක් මගින් යම් සමිතියක් හෝ සංගමයක් අමාත්‍යවරයා විසින් නිදහස් කරනු ලැබිය හැකිය.

(ඊ) මේ වගන්තියේ විධිවිධානවලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ හෝ සංගමයේ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම මේ ප්‍රඥප්තියේ පහත 53, 54 හෝ 55 වගන්තිවලින් එක් වගන්තියක් යටතේ සිදු කරනු ලබන විභාගයකින් හෝ පරීක්ෂණයකින් පසු වරදකට වරදකරුවකු බව රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ සමිතියේ හෝ සංගමයේ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුට හෝ විධායක මට්ටමේ නිලධාරියෙකු හෝ තම නිලයෙන් හෝ සේවයෙන් ඉවත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකිවිය යුතු ය.

(උ) තව ද, එවැනි අවස්ථාවක සමිතියේ හෝ සංගමයේ කළමනාකරණ හා පාලන කටයුතු පවත්වා ගෙන යාම සඳහා 58 වැනි වගන්තියේ වධි විධාන පරිදි රෙජිස්ට්‍රාර්වරයාට කටයුතු කළ හැකිය.

විගණනය

51. (1) (අ) සෑම වර්ෂයකටම වරක්වත් රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද තැනැත්තෙකු හෝ ආයතනයක් ලවා ගිණුම් විගණනය කරවා ගැනීම ලියාපදිංචි කළ සෑම සමුපකාර සමිතියකම හෝ සංගමයකම කාරක සභාවේ වගකීම විය යුතු ය.

(ආ) සෑම අවුරුද්දකට වරක්වත් ලියාපදිංචි කරනු ලැබූ සෑම සමුපකාර සමිතියකම හෝ සංගමයකම ගිණුම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් වූ බලය පවරනු ලබන තැනැත්තෙකු හෝ ආයතනයක් ලවා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීම කළ යුතු ය.

(ඇ) නියමිත සුදුසුකම් හා සමුපකාර විගණනයක් පවත්වාගෙන යාමට හැකියාව ඇති බවට සෑහීමකට පත්වන්නේ නම් මිස, කිසිම පුද්ගලයෙකු ආයතනයක් විගණකවරයෙකු ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත නොකළ යුතු ය.

(2) ඉහත (1) වැනි උපවගන්තිය යටතේ වූ විගණනයෙහි,

(අ) කාලය ඉකුත් වූ ණය සම්බන්ධයෙන් පරීක්ෂණයක්,

(ආ) ලියාපදිංචි කළ සමුපකාර සමිතිවල හෝ සංගම්වල වත්කම් හා බැරකම් පිළිබඳ තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක්.

(ඇ) නිසි මුදල් පාලනය හා සමුපකාර සමිතියේ හෝ සංගමයේ කටයුතු සම්බන්ධයෙන් අඛණ්ඩ ඇගයීමක් කරනු හැකි වනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරීමට, සහතික කිරීමට සංවිධාන ක්‍රම, කාර්යය පටිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛණ නිසි ලෙස සහ ප්‍රමාණවත් ලෙස සැලසුම් කරනු ලැබ ඇත්තේ ද, සහ ඒ ඒ ක්‍රම, කාර්යය පටිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛණ ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක්,

(ඈ) සමුපකාර සමිතිය හෝ සංගමය පවත්වාගෙන යාම මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද රීති, නියෝග හෝ අතුරු ව්‍යවස්ථා වල විධි විධාන වලට අනුකූල වනනේ ද, සමිතියේ හෝ සංගමයේ කටයුතු පරිපාලනය මේ

ප්‍රඥප්තියේ රීති වලට, නියෝග වලට හෝ අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව කර ඇත්තේ ද, යන්න පිළිබඳව පරීක්ෂණ,

(ඉ) අරමුදල් උපයෝගී කිරීම කාර්යක්ෂම ලෙස පිරිමැසුම් සහිතව ක්‍රියාත්මක කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක්,

(ඊ) ලියාපදිංචි සමුපකාර සමිතියකට හෝ සංගමයකට අයත් සහ එහි පාලනය යටතේ ඇති මුදල්, දේපළවල ආරක්ෂාව සහතික කරනු පිණිස සතුටුදායක කාර්ය පරිපාටි සකස් කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක්,

(උ) ගිණුම්, මුදල් යෙදවීම හා තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධාන්ත කෙරෙහි නිසි අවධානයක් ඇතිව සැලකිල්ලට භාජනය කර ඇති කාල සීමාව සම්බන්ධයෙන්, සමිතියේ හෝ සංගමයේ කටයුතු පිළිබඳ සත්‍ය වූ හා නිවැරදි වූ ගිණුමක් ඉදිරිපත් කිරීම පිණිස, විගණනය කරනු ලැබූ ගිණුම් සැලසුම් කොට ඇත්තේ ද, යන්න පිළිබඳ පරීක්ෂණයක්, සහ,

(ඌ) වෙනත් නියමිත කරුණු, ඇතුලත් විය යුතු ය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ විගණන කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ ගණන් විගණනය කිරීම පිණිස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට,

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ ඒ විගණනය සඳහා ඔහු විසින් බලය පැවරූ තැනැත්තාගේ මතය අනුව සමුපකාර සමිතියේ හෝ සංගමයේ යම් ගණුදෙනු හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරීත්වය පිළිබඳ වැදගත් තොරතුරු සැපයිය හැකි කලින් සිටි හෝ දැනට සමිතියේ හෝ සංගමයේ සිටින යම් නිලධාරියෙකු, නියෝජිතයෙකු සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකු කැඳවීමේ, හා

(ආ) සමුපකාර සමිතියේ හෝ සංගමයේ කටයුතු වලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපළක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකව සිටින හෝ භාරව සිටින හෝ කලින් සිටි හෝ දැනට සිටින, එම සමිතියේ හෝ සංගමයේ නිලධාරියෙකුට, නියෝජිතයෙකුට, සේවකයෙකුට, සාමාජිකයෙකුට හෝ වෙනයම් තනැත්තෙකුට නියම කිරීමේ, හා

(ඇ) ඒ විගණනයේ දී තමා විසින් වංචාවක් සොයාගනු ලබන අවස්ථාවක එම සමිතියේ හෝ සංගමයේ ගිණුම්, පොත් හා ලේඛණ තමන් භාරයට ගැනීම හෝ ආරක්ෂාව සඳහා සමිතියේ වග කිවයුතු නිලධාරියෙකුට භාරදීමේ බලය තිබිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක පවත්වාගෙන යනු ලබන සියළු පොත්, ලේඛණ ගිණුම් සහ ලියවිලි, සුරැකුම් පත් හා අතැති මුදල් පරීක්ෂා කිරීමට ද, හිමිකම තිබිය යුතුය. තව ද, ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වාගෙන යන හෝ සන්තකයේ ඇතිව සිටින සෑම තැනැත්තෙකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ බලය දෙන තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය. නැතහොත් එම සමිතියේ හෝ සංගමයේ ගණු දෙනු හා වැඩ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඒ පරීක්ෂණය හෝ විගණනය කරනු ලබන තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර්වරයා හා ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ගණන් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) (අ) සමිතියක හෝ සංගමයක සංවිධානය හෝ කළමනාකාරිත්වය භාරව සිටින හෝ භාරව සිටි හෝ සමිතියක හෝ සංගමයක නිලධාරියෙකු හෝ සේවකයෙකුව සිටින කවර හෝ අවස්ථාවක සිටි යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පනවනු ලබන ලද රීති වල රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද සමුපකාර සමිතිවලට හෝ සංගම්වලට හෝ මුදල් කාර්යය පටිපාටියට අදාළ රීති වලට නැතහොත් නියෝගවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පොදු විධාන කිසිවක හෝ සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවල සමිතියේ හෝ සංගමයේ කාරක රීතිවල විධිවිධානයන් පටහැනිව යම් ගෙවීමක් කර ඇති බව හෝ සමිතියේ හෝ සංගමයේ යම් අරමුදල් පාවිච්චි කර ඇති බව (1) වැනි උපවගන්තිය යටතේ වූ විගණනයක දී සොයාගතහොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි සෑම ගෙවීමකටම හා එවැනි සෑම අරමුදල් පාවිච්චි කිරීමකටම ඉඩ නොදිය යුතු අතර, ඒ නීති විරෝධී ගෙවීම හෝ අරමුදල් පාවිච්චි කිරීම හෝ කිරීමට බලය දෙන නතැනැත්තාට එය අධිභාර කළ යුතුය. තව ද එම තැනැත්තාගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතුකොට ගෙන දරන්නට සිදුවූ යම් ඌණතාවයක් හෝ පාඩුවක් සහ ඒ තැනැත්තා විසින් ගණන් දැක්විය යුතු වූ නමුත් එසේ ගණන් නොදක්වන ලද යම් මුදලක් ඒ තැනැත්තාගෙන් අයකර ගත යුතුය. තව ද, ඒ එක් එක් අවස්ථාවේ දී ඒ තැනැත්තාගෙන් අයවිය යුතු මුදල සහතික කොට තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත රෙජිස්ට්‍රාර්වයා විසින් දන්වා යැවිය යුතු ය.

(ආ) යම් තැනැත්තෙකුට යම් ඉඩ දීමක් නොකිරීමට හෝ යම් අධිභාරයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ වෙනුවට ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් සුදුසුයැයි සිතිය

හැකි යම් කරුණු සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ යම් කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට ඒ සම්බන්ධව අවස්ථාවක් දිය යුතු අතර, එවැනි ඉඩ දීමක් හෝ අධිහාර කිරීමක් කරනු ලැබුවහොත් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු විසින් බලය පැවරූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඉඩ නොදීම හෝ අධිහාර කිරීම සම්බන්ධයෙන් තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත දැන්විය යුතු ය;

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන එවැනි යම් ඉඩ නොදීමකින් හෝ අධිහාරයකින් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය තමා වෙත දන්වා එවනු ලැබීමේ දිනයේ සිට දින 14ක් ඇතුලත සමුපකාර විෂයභාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනා කළ හැකි අතර, ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එම තීරණය පිළිබඳව කිසිම අධිකරණයක් ප්‍රශ්න නොකළ යුතු ය ;

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන තීරණයකට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක පහත 74 (2) වැනි වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතු ය.

විගණනයෙහි අඩුපාඩු සමිතිය හෝ සංගමය වෙත දැන්වීම.

52. (1) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක ක්‍රියාකාරිත්වයෙහි යම් අඩු පාඩු ඉහත 51 වැනි වගන්තිය යටතේ කරන ලද විගණනයක දී හෙළිදරව් වුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අඩුපාඩු සමිතියේ හෝ සංගමයේ දැන ගැනීමට හා ඒ සමිතිය හෝ සංගමය අන් සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකු වේ නම්, එම සමුපකාර සමිතියේ හෝ සංගමයේ දැනගැනීමට ද සැලැස්විය හැකිය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෙලිදරව් කළ අඩුපාඩු සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා, රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පියවරක් ඒ නියෝගයෙහි සඳහන් කාලය ඇතුලත දී ගන්නා ලෙස සමිතියට හෝ සංගමයට හෝ එහි නිලධරයන්ට විධාන කළ හැකිය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන විධානයක් කඩ කරන හෝ පැහැර හරින සමිතියට හෝ සංගමයට හෝ නිලධරයන්ට එරෙහිව මේ ප්‍රඥප්තියේ විධිවිධානවලින් පැවරී ඇති බලතල අනුව ක්‍රියාකිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකිය.

## VII වැනි පරිච්ඡේදය

### ලියාපදිංචි සමිතියක, සංගමයක, විභාග හා පරීක්ෂණ

විභාග හා පරීක්ෂණ.

53. (1) (අ) රෙජිස්ට්‍රාර්වරයා විසින් තම මෙහෙයවීමෙන්ම ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක හෝ සංගමයක සංයුතිය, ක්‍රියාකාරිත්වය, මුදල් තත්වය පිළිබඳව විභාගයක් පවත්වනු ලැබිය හැකිය. තවද, ඒ සමිතියේ කාරක සභාවේ බහුතරයක් හෝ මහා සභා රැස්වීමකට සහභාගි වීමට අතුරු ව්‍යවස්ථානුකූලව සුදුසුකම් ලබා ඇති සාමාජිකයන් හෝ නියෝජිතයින් තුනෙන් එකකට (1/3) නොඅඩු සංඛ්‍යාවක් හෝ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් හෝ සියයක් යන දෙකෙන් අඩු සංඛ්‍යාවක් හෝ ලිඛිතව ඉල්ලා සිටි විට එවැනි විභාගයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. එමෙන්ම රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිත නියමයක් මගින් බලය දෙනු ලැබූ තැනැත්තෙකුට ලියාපදිංචි සමිතියක හෝ සංගමයක සංයුතිය, ක්‍රියාකාරිත්වය පිළිබඳ හා මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් පැවැත්වීමට විධාන කළ හැකිය ;

(ආ) එසේ වුව ද, මෙහි (1) වැනි උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විභාගයක් පැවැත්වීමට හෝ විභාගයක් පැවැත්වීම සඳහා විධාන කිරීමට පෙර අවශ්‍ය වේ යැයි හැගේ නම් එවැනි විභාගයක් කිරීමට ප්‍රමාණවත් කරුණු ඇත්ද යන්න පිළිබඳව සෑහීමකට පත්වීම සඳහා සුදුසු ආකාරයේ පූර්ව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ ඒ සඳහා විධාන කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතුය. එකී පූර්ව පරීක්ෂණයේ නිර්දේශය කුමක් වුව ද එය නොසලකා 53 (1) වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විධානයක් කිරීමට කොමසාරිස්වරයාට හැකිය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ විභාගයක් පැවැත්වීමට ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට —

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ ඒ තැනැත්තාගේ මතය අනුව සමිතියේ හෝ සංගමයේ යම් ගණුදෙනුවක් හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි සමිතියේ හෝ සංගමයේ කලින් සිටි හෝ දැනට සිටින නිලධාරියෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකු කැඳවීමට ;

(ආ) සමිතියේ හෝ සංගමයේ කටයුතු වලට අදාලව යම් පොතක් හෝ ලේඛණයක්, සමිතියට හෝ සංගමයට අයත් යම් මුදලක් හෝ වෙනත් දේපලක් සන්තකයේ ඇත්තා වූ හෝ භාරව සිටින්නා වූ සමිතියේ හෝ සංගමයේ කලින් සිටි හෝ දැනට සිටින යම් නිලධාරියෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකුට ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ;

(ඇ) තමා විසින් යොමු කරනු ලබන යම් කාරණා තීරණය කිරීම පිණිස තමා සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයක දී සමිතියේ හෝ සංගමයේ සාමාජිකයින්ගේ මහා සභා රැස්වීමක් කැඳවීමට ; සහ

(ඈ) එම විභාගය හෝ පූර්ව පරීක්ෂණය අතරතුර වංචාවක් හෝ අක්‍රමිකතාවයක් ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක සමිතියේ හෝ සංගමයේ ගිණුම් පොත් පත් හා ලේඛන තමා භාරයට ගැනීමට බලය ඇත්තේ ය.

(3) (2) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ කැඳවනු ලබන යම් මහ සභා රැස්වීමකට, සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථා යටතේ කැඳවනු ලබන මහා සභා රැස්වීමකට ඇති සියළු බලතල තිබිය යුතුය. තවද, ඒ රැස්වීම සඳහා ගණ පූර්ණය තිබිය යුතු නොවීමේ හා මහ සභා රැස්වීමක් කැඳවීමේ දැන්වීමෙහි කාල සීමාව පිළිබඳව අතුරු ව්‍යවස්ථාවල ඇති විධිවිධාන එම රැස්වීමට අදාල නොවිය යුතු වීමේ විශේෂය හැර, ඒ අතුරු ව්‍යවස්ථාවලින් එහි කටයුතු විධිමත් කරනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය හැකි නමුදු ඔහුට ඡන්දයක් නොතිබිය යුතුය. (ඡන්දය සමානව බෙදී ගිය අවස්ථාවකදී ඔහුට තීරක ඡන්දයක් තිබිය යුතු ය.)

(4) මේ වගන්තිය යටතේ විභාගයක් නිම කිරීමට පෙර කාරක සභාවට විරුද්ධව මුල් බැල්මට චෝදනාවක් තහවුරු වී ඇතැයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වේ නම්, ඒ කාරක සභාව හය මාසයකට අත් හිටුවීමට ද, සමිතියේ හෝ සංගමයේ වැඩ කටයුතු කළමනාකරණය හා පරිපාලනය කිරීමට අන්තර්කාලීන මණ්ඩලයක් පත් කිරීමටද, ඔහුට බලය තිබිය යුතුය. ඒ කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට හය මසක් ඇතුළත ඒ විභාගය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිම කළ යුතු අතර, ඒ කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් 57 වැනි වගන්තිය යටතේ අවසාන තීරණයක් ගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ විභාගයක් පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ විභාගයේ ප්‍රතිඵලය සමිතිය හෝ සංගමය වෙත, හා ඒ සමිතියේ හෝ සංගමයේ සාමාජිකයෙකු වන අන් සමිතියක් හෝ සංගමයක් ඇතොත් ඒ සමිතිය හෝ සංගමය වෙත ද, සමිතිය හෝ සංගමය යම් කිසි බැංකුවට ණයක් වී ඇත්නම් එම බැංකුව වෙත ද දැන්විය යුතු ය.

(6) රෙජිස්ට්‍රාර්වරයා සහ මේ වගන්තිය යටතේ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

54. (1) රෙජිස්ට්‍රාර්යා විසින් තමාගේම ඕනෑකම මත හෝ ඒ සමිතියේ හෝ සංගමයේ කාරක සභාවේ බහුතරයකගේ හෝ මහ සභා රැස්වීමකට සහභාගීවීමට අතුරු ව්‍යවස්ථානුකූලව සුදුසුකම් ඇති සාමාජිකයින් හෝ නියෝජිතයින් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත හෝ බාහිර තැන්පත් කරුවෙකු හෝ ණයකරුවෙකුගේ ලිඛිත ඉල්ලීමට පිට හෝ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකගේ හෝ සියයක යන දෙකෙන් අඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත හා ලියාපදිංචි සමිතියක හෝ සංගමයක පොත් පිළිබඳ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකිය. නැතහොත් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් හෝ නියෝගයක් මගින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකුට ඒ පොත් පිළිබඳ පරීක්ෂණය පවත්වන ලෙස විධාන කළ හැකිය. එසේ වුව ද, ඉල්ලුම්කරු බාහිර තැන්පත්කරුවෙකු, ණය හිමියෙකු නම් ඔහු විසින් — සමිතියක හෝ සංගමයක පොත් පරීක්ෂා කිරීම හා එහි කටයුතු විමර්ශනය කිරීම.

(අ) යම් නිශ්චිත මුදලක් ඔහුට ලැබිය යුතු බවත්, ඔහු එය ගෙවන ලෙස ඉල්ලා ඇති බවත්, සාධාරණ කාලයක් ඇතුළත දී ඔහුට එය ලැබී නැති බවත් ඔප්පු කරතහොත් ; හා

(ආ) යෝජිත පරීක්ෂණයේ ගාස්තු සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කල හැකි යම් මුදලක් ඇප වශයෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත තැන්පත් කරතහොත් මිස, ණය හිමියකුගේ ඉල්ලීම පිට එවැනි පොත් පිළිබඳ පරීක්ෂණයක් නොපැවැත්විය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් තමාගේ ඕනෑකම පිට ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයේ කටයුතු විමර්ශණය කල හැකිය. නැතහොත් ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට එසේ විමර්ශණය කරන ලෙස විධාන කළ හැකිය.

(3) රෙජිස්ට්‍රාර්වරයා හෝ මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට —

(අ) ලියාපදිංචිකළ සමිතියක හෝ සංගමයක සියළුම පොත්පත්, ගණන්, ලියවිලි හා සුරැකුම් පත් සෝදිසි කර බැලීමට සෑම විටම ඉඩ කඩ තිබිය යුතු අතර, අත ඉතිරි මුදල් පරීක්ෂා කර බැලීමට ද හිමිකම් තිබිය යුතුය. තවද, පරීක්ෂණයක් හෝ විමර්ශණයක් පවත්වන තැනැත්තාට අවශ්‍ය විය හැකි සමිතියක හෝ සංගමයේ ගණුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ යම් තොරතුරු සමිතියේ හෝ සංගමයේ සෑම නිලධාරියෙකු හෝ සාමාජිකයකු විසින් සැපයිය යුතුය ; තවද,

(ආ) ඒ පරීක්ෂණයේ දී හෝ විමර්ශණයේ දී තමා විසින් වංචාවක් සොයා ගනු ලබන අවස්ථාවක ඒ සමිතියේ හෝ සංගමයේ ගිණුම් පොත් හා ලේඛණ තම භාරයට ගැනීමේ බලය තිබිය යුතු ය.

(4) එවැනි යම් පරීක්ෂණයක හෝ විමර්ශණයක ප්‍රතිඵල —

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ ඕනෑකම පිට ඒ පරීක්ෂණය හෝ විමර්ශණය පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් සමිතිය හෝ සංගමය වෙත ද, සමිතිය හෝ සංගමය යම් කිසි බැංකුවට ණය වී ඇත්නම් ඒ බැංකුව වෙත ද ;

(ආ) බාහිර තැන්පත් කරුවෙකුගේ හෝ ණය හිමියකුගේ ඉල්ලීම පිට ඒ පරීක්ෂණය හෝ විමර්ශණය පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් බාහිර තැන්පත්කරු හෝ ණය හිමියා වෙතද, සමිතිය හෝ සංගමය වෙතද දැන්විය යුතු ය.

(5) ලියාපදිංචිකල සමිතියක හෝ සංගමයක ණය හිමියකුගේ ඉල්ලීම පිට (1) වැනි උප වගන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු යයි සිතන පරිදි ඒ පරීක්ෂණයේ ගාස්තු හෝ ගාස්තුවල යම් කොටසක් සමිතිය හෝ සංගමය හා ණය හිමියා අතර බෙදා අයකර ගත හැකිය.

(6) යම් සමිතියක් හෝ සංගමයක් හෝ බාහිර තැන්පත්කරුවෙකු හෝ ණය හිමියෙකු සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ගාස්තු වශයෙන් නියම කරනු ලැබූ යම් මුදලක් අයකර ගන්නා ලෙස ඒ සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචි කල කාර්යාලය පිහිටි හෝ එම ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය පිහිටි හෝ බාහිර තැන්පත්කරු හෝ ණය හිමියා පදිංචිව සිටින ස්ථානය පිළිබඳව හෝ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලැබූ විට ඒ අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක් අයකර ගන්නා ආකාරයෙන් අයකර ගනු ලැබිය හැකිය.

(7) රෙජිස්ට්‍රාර්වරයා හා ලියාපදිංචි කල සමිතියක හෝ සංගමයක පොත් පරීක්ෂා කිරීමට හෝ කටයුතු විමර්ශණය කිරීමට ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයින් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ විධිවිධාන යටතේ පරීක්ෂණයක හෝ විමර්ශණයක කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් පරීක්ෂණය හෝ විමර්ශණය පැවැත්වීම සඳහා බලය ලබාදෙන යම් තැනැත්තෙකුට —

(අ) සමිතියේ හෝ සංගමයේ ගණුදෙනු කිසිවක් පිළිබඳව හෝ එහි කටයුතු පාලනය කිරීම සම්බන්ධව හෝ වැදගත්ම තොරතුරු සැපයිය හැකි යැයි රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ තැනැත්තා අදහස් කරන සමිතියේ හෝ සංගමයේ කලින් සිටියා වූ හෝ දැනට සිටින්නා වූ නිලධාරියෙකු, අනුයෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු නැතහොත් වෙනත් යම් තැනැත්තෙක් කැඳවීමට ;

(ආ) සමිතියේ හෝ සංගමයේ කටයුතුවලට අදාළ යම් පොතක, ලේඛණයක, මුදලක, ඇපයක හෝ වෙනත් දේපලක සන්තකය නැතහොත් භාරය දරන සමිතියේ හෝ සංගමයේ කලින් සිටියා වූ හෝ දැනට සිටින්නා වූ නිලධාරියෙකුට, අනුයෝජිතයෙකුට, සේවකයකුට, සාමාජිකයෙකුට, හෝ වෙනත් තැනැත්තෙකුට ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ;

(ඇ) තමා විසින් විධානය කරනු ලබන කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් නිශ්චය කරනු ලබන වේලාවක සහ ස්ථානයක සමිතියේ හෝ සංගමයේ සාමාජිකයකයින්ගේ මහ සභා රැස්වීමක් කැඳවීමට ; සහ

(ඈ) එවැනි පරීක්ෂණයකදී හෝ විමර්ශණයකදී වංචාවක් හෝ අක්‍රමිකතාවක් හෝ තිබෙන බවට විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති අවස්ථාවක සමිතියේ හෝ සංගමයේ ගිණුම් පොත් පත් හා ලේඛණ තම භාරයට ගැනීමට බලය තිබිය යුතු ය.

ලියාපදිංචි සමුපකාර සමිතිවල හෝ සංගම්වල සාමාන්‍ය පරීක්ෂණ පැවැත්වීමේ බලය.

55. (1) රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් ලිපියක් මගින් විධිමත්ව බලය පවරන ලද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පළාතේ ලියාපදිංචි කරන ලද සියළුම සමුපකාර සමිති හා සංගම්වල ව්‍යාපාරයට අදාල කටයුතු සම්බන්ධව සාමාන්‍ය පරීක්ෂණ පැවැත්වීම සඳහා බලය ඇත. තව ද රෙජිස්ට්‍රාරවරයාට හෝ ඒ බලය පවරනු ලැබූ හෝ ලබන තැනැත්තාට ඕනෑම ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක හෝ සංගමයක පරීක්ෂණයට අදාලව පොත්පත් හා ලියවිලි ලබා ගැනීමට, පරීක්ෂා කිරීමට, ඉතිරි තොග ගණන් ගැනීමට, අත ඉතිරි මුදල් පරීක්ෂා කිරීමට හා නිලධාරීන්ගෙන් හා සේවකයින්ගෙන් අවශ්‍ය වන්නා වූ තොරතුරු විමසීමට හෝ ප්‍රකාශ ලබා ගැනීමට බලය තිබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා හා ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක හෝ ඉහත සඳහන් (1) වැනි උප වගන්තිය යටතේ පරීක්ෂණ පැවැත්වීමට බලය පවරනු ලබන සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

### III වැනි පරිච්ඡේදය

### ලියාපදිංචිකළ සමුපකාර සමිතියක හෝ සංගමයක නිලධරයන්ගේ සේවය අත්හිටුවීම හෝ වැඩ තහනම් කිරීම, නිලධරයන් ඉවත් කිරීම සහ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ කාරක සභාව විසුරුවා හැරීම, කාරක සභාවට සභිකයන් නම් කිරීම

සමිතියක හෝ සංගමයක කාරක සභාව විසුරුවා හැරීම හා කාරක සභාවක සාමාජිකයින් ධුර වලින් ඉවත් කිරීම, වැටුප් ලබන නිලධරයන්ගේ සේවය අත්හිටුවීම හෝ වැඩ තහනම් කිරීම හා වැටුප් ලබන නිලධරයන් ඉවත් කිරීම යනාදිය.

56 (1) 53 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 54 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශණයකින් පසුව ලියාපදිංචිකල යම් සමුපකාර සමිතියක හෝ සංගමයක කාරක සභාවක් හෝ එකී කාරක සභාවේ යම් සාමාජිකයෙකු සිය යුතුකම් නිසි ආකාරයකින් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, එකී කාරක සභාව විසුරුවා හැරීම හෝ එකී කාරක සභාවේ යම් සාමාජිකයෙකු සිය ධුරයෙන් ඉවත් කිරීම හෝ සම්බන්ධයෙන් යම් විරෝධතා කිසිවක් වෙතොත් ඒ විරෝධතා ලිඛිතව ප්‍රකාශ කරනු පිණිස ඔහු විසින් එකී කාරක සභාවට හෝ එකී කාරක සභාවේ යම් සාමාජිකයින්ට අවස්ථාවක් ලබා දී ඉදිරිපත් කරනු ලැබූ ලිඛිත ප්‍රකාශ වේ නම් ඒවා ද සලකා බැලීමෙන් පසු —

(අ) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් කැඳවනු ලබන මහ සභාවට කරුණු පැහැදිලි කරදී වරද කළ කාරක සභාව ඉවත්කර අභිනව කාරක සභාවක් පත්කරන ලෙස හෝ කාරක සභාවේ යම් සාමාජිකයෙකු ඉවත් කර වෙනත් කාරක සභිකයෙකු පත්කරන ලෙස විධාන කළ හැකිය ;

(ආ) ඉහත (අ) අනු වගන්තිය යටතේ මහසභාව කටයුතු නොකළහොත් කාරක සභාවම විසුරුවාහල යුතු අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී කාරක සභාව විසුරුවා හැර රජයේ නිලධාරීන් අතරින් තිදෙනෙකු තාවකාලික පාලක මණ්ඩලයක් ලෙස පත්කළ යුතුය. එලෙස පාලක මණ්ඩලයක් පත්කළ පසුව එතෙක් සිටි කාරක සභිකයන්ගේ කාරකසභික ධුරයන් අවසන් වන්නේ ය. රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන පාලක මණ්ඩලයේ සභාපති, උප සභාපති නම් කිරීම ද රෙජිස්ට්‍රාර්වරයා විසින් කළ යුතුය.

(ඇ) 53 වැනි වගන්තිය යටතේ වූ විභාගයක හෝ 54 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයක ප්‍රතිඵලයක් ලෙස ඉහත (ආ) අනු වගන්තිය පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කරනු ලබන තාවකාලික පාලක මණ්ඩලය විසින් මාස 03 ක් ඉක්මවා යාමට පෙර අතුරු ව්‍යවස්ථානුකූලව මහසභාව කැඳවා අභිනව කාරක සභාවක් පත්කළ යුතුය. එලෙස පත්කරගනු ලබන කාරක සභිකයන්ගේ නිල කාලය පළමුව සිටි කාරක සභාවේ ඉතිරි නිල කාලයට පමණක් සීමා වන්නේ ය.

(2) මේ ප්‍රඥප්තියේ 53 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 54 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශණයකින් පසුව යම් ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක හිටපු කාරක සභාවක් හෝ හිටපු කාරක සභාවක යම් සාමාජිකයෙකු හෝ සිය යුතුකම් නිසියාකාරයෙන් ඉටු කර නොමැති බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම් එවැනි අවස්ථාවකදී කාරක සභාව සම්බන්ධයෙන් හෝ එකී කාරක සභාවක හිටපු සාමාජිකයෙකු සම්බන්ධයෙන් ඉහත (1) වැනි උපවගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීමෙන් පසු ලියවිල්ලකින් වූ නියෝගයකින් එකී හිටපු කාරක සභාවට හෝ එහි යම් සාමාජිකයන්ට එකී සමුපකාර සමිතියේ හෝ සංගමයේ හෝ වෙනයම් ලියාපදිංචි කල සමුපකාර සමිතියක හෝ සංගමයක කාරක සභාවකට විධානය කළ දින සිට වර්ෂ පහක් ගතවන තුරු නැවත වරක් තේරී පත්වීම තහනම් කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් විධානය කරනු ලැබිය යුතුය. එවැනි විධානයකට යටත්වන යම් කිසි තැනැත්තෙකු ලියාපදිංචි සමුපකාර සමිතියක හෝ සංගමයක කාරක සභාවට තේරී පත්වීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

(3) ඉහත (1) වැනි උප වගන්තියේ (අ), (ආ) වැනි අනු වගන්ති යටතේ නිකුත් කරනු ලබන විධානයක් යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩල හෝ කාරකසභාවල තැනැත්තෙකු ගේ නිල කාලය 56 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ තැනැත්තෙකුගේ ඉතිරි නිල කාලයට සීමාවිය යුතුය. එසේ වුව ද යම් කිසි ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක අතුරු ව්‍යවස්ථානුකූල මහසභාවක් ස්ථාපිත කර කාරක සභාවක් තෝරා පත්කර ගන්නා තුරු, එම පත් කරන ලද තැනැත්තෙකුගේ නිල කාලය දීර්ඝ කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතුය. තවද එවැනි මහ සභාවක් ස්ථාපිත කිරීම සඳහා බාධාවන යම් අතුරු ව්‍යවස්ථා විධිවිධාන වෙතොත්, අදාල විධිවිධානවලින් නිදහස් කර මහ සභාව සංස්ථාපනය කිරීමට අවශ්‍ය නියමයන් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉහත (1) වැනි උපවගන්තිය යටතේ යම් නියෝගයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියෝගයෙන්ම හෝ පසුව වූ නියෝගයකින් ඒ සමිතියේ හෝ සංගමයේ වැඩ කටයුතු කළමනාකරණය හා පරිපාලනය කිරීමට සුදුසු හා නිසි තැනැත්තෙකු හෝ ඊට වැඩි ගණනක් පත් කල යුතු අතර, එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙකු ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමට හෝ ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කිරීමට හෝ අතිරේක තැනැත්තන් පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකිය.

(5) රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ලියාපදිංචි කල සමුපකාර සමිතියක හෝ සංගමයක කටයුතු කළමනාකරණය හා පරිපාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙකුට —

(අ) සමුපකාර සමිතියේ හෝ සංගමයේ වත්කම් අයකර ගැනීමේ හා බැඳීම් ඉටු කිරීමේ ද, එහි යහපත සඳහා අවශ්‍ය විය හැකි වෙනයම් පියවරවල් ගැනීමේ ද බලය තිබිය යුතුය ; තව ද

(ආ) සමුපකාර සමිතියේ හෝ සංගමයේ යථා පරිදි සංස්ථාපනය කරන ලද කාරක සභාවට එහි සියළු බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබිය යුතු අතර, ඒවා ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. තව ද, ඒ සමිතියේ හෝ සංගමයේ කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම උදෙසා අවශ්‍යවන අවස්ථාවක මහ සභාව සතු බලතල අතුරෙන් එසේ අවශ්‍යවන බලතල ද, ඒ මහ සභාව පවරා දෙන පරිදි තිබිය යුතු අතර, ඒවා ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(6) ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත්කරනු ලැබූ තැනැත්තන් විසින් නීතියට හෝ සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලට පටහැනිව කටයුතු කළහොත් එසේ කරන ලද යම් ක්‍රියා නිසා සමිතියට විඳීමට සිදු වූ යම් අලාභයන්ට හෝ පීඩාවන්ට හෝ සමිතිය හෝ සංගමය යටත්වන යම් දඬුවමකට ඒ තැනැත්තන් සාමූහිකව හා වෙන්වෙන්ව වගකිව යුතු ය.

(7) ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්විසින් පත් කරන ලද යම් තැනැත්තෙකුට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ඔහු විසින් නියම කල හැකිය. ඒ පාරිශ්‍රමිකය හා ඒ සමිතියෙහි හෝ සංගමයෙහි කළමනාකාරීත්වයෙහිලා දරන්නට සිදුවන වෙනත් වියදම් ඇතොත් ඒ වියදම එකී සමිතියේ හෝ සංගමයේ අරමුදල්වලින් ගෙවිය යුතු ය.

(8) ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබ ඉහත (1) වැනි උපවගන්තියේ (ඇ) වැනි අනු වගන්තිය යටතේ වූ විධානය බල පැවැත්වීම නතරවන දිනයට පෙරාතුව වූ දිනයෙහි ධුරය දරමින් සිටින තැනැත්තා විසින් එකී දිනයට පෙර ඒ සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථා අනුව අලුත් කාරක සභාවක් පත්කිරීමට කටයුතු පිලියෙල කිරීම ඔහුගේ යුතුකම විය යුතු ය.

නිලධාරීන්ගේ සේවය අත්හිටුවීම හෝ තහනම් කිරීම යනාදිය.

57. (1) 53 වැනි වගන්තිය යටතේ විභාගයකින් හෝ 54 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශණයකින් හෝ 55 වගන්තිය යටතේ සාමාන්‍ය පරීක්ෂණයකින් පසුව යම් ලියාපදිංචිකල සමිතියක හෝ සංගමයක යම් නිලධරයෙකු හෝ සේවකයෙකු තම කාර්යය නිසිආකාරයෙන් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීමට නුසුදුසු බව නැතහොත් අන්‍යාකාරයකින් නොහැකි බව හෝ එම සමිතිය හෝ සංගමය සතු මුල්‍යමය හෝ ද්‍රව්‍යමය වෙනත් වත්කමකට හෝ කීර්ති නාමයට හෝ හානියක් වියහැකි ඕනෑම ආකාරයක ක්‍රියාවක් සිදුකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වුවහොත්, මේ ප්‍රඥප්තියෙහි හෝ වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද සිය විරෝධතා දැක්වීමට එම නිලධරයාට හෝ සේවකයාට අවස්ථාවක්, දීමෙන් පසුව, විධිමත් විනය පරීක්ෂණය අවසන්වන තුරු ඔහු විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අවස්ථාවෝචිත පරිදි ඒ නිලධරයාගේ හෝ සේවා නියුක්තිකයාගේ සේවය අත්හිටුවීම හෝ වැඩ තහනම් කිරීම කල හැකි අතර, ඒ පරීක්ෂණයෙන් පසුව එම නිලධාරියා හෝ සේවා නියුක්තිකයා ධුරයෙන් ඉවත් කල හැකි ය ;

එසේ වුව ද, මේ උප වගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියෝගයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තයෙකු විසින් දින 30 ක කාලයක් ඇතුලත පළාත් සභාවේ සමුපකාර සේවයක කොමිෂන් සභාව වෙත, ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කල හැකිය.

(2) ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක සේවය කළ හෝ කරන නිලධාරියෙකු හෝ සේවයෙකුට විරුද්ධව ඔහු සේවය කළ හෝ සේවය කරන සමිතියක හෝ සංගමයේ කාරක සභාව විසින් කිසියම් විනය පරීක්ෂණයක් පැවැත්වීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා පරීක්ෂණ නිලධාරියෙකු හෝ නිලධාරීන් පත්කළ යුත්තේ රෙජිස්ට්‍රාර්වරයා විමසා රෙජිස්ට්‍රාර්වරයා විසින් නම් කරන අය පමණි. මෙවැනි අවස්ථාවලදී පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි සුදුසුකම් සහිත නිලධාරීන්ගේ සංචිතයක් පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යෙදිය යුතු ය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ යම් නිලධරයෙකු හෝ සේවා නියුක්තියෙකු ඉවත් කරනු ලැබ ඇත්තාවූ ද, ඒ ඉවත් කිරීමේ නියෝගය සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ස්ථිර කොට ඇත්තාවූ නැතහොත් දින 30ක කාලයක් ඇතුලත ඒ නියෝගයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද, අවස්ථාවක, වෙනත් නිලධරයෙකු හෝ සේවා නියුක්තයෙකු අවස්ථාවෝචිත පරිදි තෝරාපත් කර ගැනීම හෝ පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබිය හැකිය.

(4) ඉහත (1) වැනි උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ගනු ලබන තීරණයක් මත වැඩ තහනමට හෝ ධූරයෙන් ඉවත් කිරීමට ලක්වූ කිසියම් තැනැත්තෙකු එම ඡේදයේ සඳහන් පරීක්ෂණයෙන් පසුව නිවැරදිකරුවෙකු බවට ඒත්තු යාම නිසා නැවත සේවයේ පිහිටුවීමට හෝ සේවය අත්හිටුවා තිබූ කාලයට අදාල හිඟ වැටුප් හෝ දීමනා ගෙවීමට තීරණය කරනු ලැබුවහොත් හෝ එකී හිඟ මුදල් ඔහු සේවය කළ සමිතිය හෝ සංගමය විසින් ගෙවිය යුතු ය.

58. (1) රජයේ හෝ පළාත් සභාවේ අරමුදල්වලින් ක්‍රියාත්මකවන ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක හෝ සංගමයක කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සමිතියට හෝ සංගමයට රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩ වලින් දෙන ලද අත්තිකාරම් හෝ ආරක්ෂා කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ඒ ලියාපදිංචි කල සමිතියේ හෝ සංගමයේ කාරක සභාවට සාමාජිකයින් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීමට අවශ්‍ය බව හෝ අවස්ථාවෝචිත බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතයවන අවස්ථාවක මෙම ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවල හෝ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඔහු විසින් ඔහුගේ මතය අනුව අවශ්‍ය හෝ අවස්ථාවෝචිත පරිදි ඒ ලියාපදිංචි කළ සමිතියේ හෝ සංගමයේ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කල හැකිය. තවද, එම නම් කල තැනැත්තන් අතුරින් ඒ සමිතියේ හෝ සංගමයේ සභාපති හා උපසභාපති තනතුරු සඳහා තැනැත්තන් ද නම් කල හැකිය. එසේ නම් කිරීමත් සමග තත්කාලයෙහි තනතුරු දරන්නන්ගේ එම තනතුරු අහෝසි විය යුතුය. එසේ වුව ද එසේ නම් කරන ලද සාමාජික සංඛ්‍යාව ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් අඩකට වඩා අඩු විය යුතු ය. රජයේ අරමුදල් වලින් ක්‍රියාත්මක වන සමිති හෝ සංගම් කළමනාකරණය කිරීම.

(2) (අ) රජයේ හෝ පළාත් සභාවේ අරමුදල්වලින් ක්‍රියාත්මකවන ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක හෝ සංගමයක කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කිරීමේ කාර්යය සඳහා හෝ ඒ සමිතියට හෝ සංගමයට රජයෙන් හෝ පළාත් සභාවන් හෝ කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩවලින් දෙන ලද අත්තිකාරම් හෝ ආරක්ෂා කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා එම සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කර ඇති නිල කාලය අවසන් වූ විගස ඒ ලියාපදිංචි කල සමිතියේ හෝ සංගමයේ කාරක සභාව වෙනුවට නව පාලක මණ්ඩලයක් පත්කිරීම අවශ්‍ය බව හෝ අවස්ථාවෝචිත බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම් මේ ප්‍රඥප්තියේ හෝ වෙනයම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද රජයේ හෝ පළාත් සභාවේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලයක් පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකිය. එසේ පත්කරනු ලැබූ යම් තැනැත්තෙකු කලින් කල ඉවත් කිරීම හෝ ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කිරීම හෝ කල හැකිය. තවද එසේ නම් කල තැනැත්තන් අතරින් ඒ සමිතියේ හෝ සංගමයේ සභාපති හා උපසභාපති තනතුරු සඳහා තැනැත්තන්ද නම් කල හැකිය ;

(ආ) ඉහත (අ) අනු වගන්තිය අනුව නව පාලක මණ්ඩලයක් පත්කල විගස එම සමිතියේ හෝ සංගමයේ පවතින කාරක සභාව අහෝසි විය යුතුය. නව පාලක මණ්ඩලයේ නිල කාලය මාස හයක උපරිම කාලයකට සීමා විය යුතු අතර එකී මාස හයක කාලය තුලදී සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථානුකූල නව කාරක සභාවක් පත් කර ගැනීමට පාලක මණ්ඩලය කටයුතු කල යුතු ය.

(ඇ) ඉහත (අ) අනු වගන්තිය යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩලයට එම සමිතිය හෝ සංගමය සඳහා කිසියම් දේපලක් අත්පත් කර ගැනීමට හෝ සමිතිය හෝ සංගමය සතු දේපලක් බැහැරකිරීමට හෝ කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් හෝ සේවකයින් බඳවා ගැනීමට හෝ බලය නොතිබිය යුතු ය.

(ඈ) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත් ද, ඉහත (අ) අනු වගන්තිය යටතේ පාලක මණ්ඩලයක් පත් කිරීම අත්හිටුවීමට හෝ වලක්වාලීමට නැතහොත් එසේ පත්කරන ලද පාලක මණ්ඩලයක් බලරහිත කිරීමට හෝ තහනම් කිරීමට හෝ විසුරුවා හැරීමට හෝ එහි කටයුතු අත්හිටුවීමට හෝ අදාල යම් කරුණක් සම්බන්ධයෙන් හෝ කිසිම සිවිල් අධිකරණයකට කිසිම අධිකරණ බලයක් නොතිබිය යුතු ය.

## IX වැනි පරිච්ඡේදය

### ලියාපදිංචි කල සමුපකාර සමිතියක් හෝ සංගමයක් විසුරුවා හැරීම

59. (1) 53 වැනි වගන්තිය යටතේ විභාගයකින් පසු හෝ 54 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශණයකින් පසු හෝ ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුන් කොටසක් විසින් සමිතිය හෝ සංගමය විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා ඒ සමිතියේ හෝ සංගමයේ සිය විරෝධතා පෑමට සමිතියට හෝ සංගමයට හෝ ණය හිමියන්ට අවස්ථාවක් සලසා දීමෙන් පසු, ඒ සමිතිය හෝ සංගමය විසුරුවා හැරිය යුතු යැයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන්නේ නම්, ඔහුට ලිඛිතව වූ නියෝගයක් මගින් සමුපකාර සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කල හැකිය. විසුරුවා හැරීම.

(2) ලියාපදිංචිකල සමුපකාර සමිතියක හෝ සංගමයක යම් සාමාජිකයෙකු විසින් හෝ යම් ණය හිමියෙකු විසින් (1) වැනි උපවගන්තිය යටතේ වූ නියෝගයක දිනයේ සිට මාස දෙකක් ඇතුලත ඒ නියෝගයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් කලහැකිය.

(3) සමුපකාර සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් කිරීමේ දින සිට මාස දෙකක් ඇතුලත කිසිම අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ඒ නියෝගය ඒ කාලය ගත වූ විට ක්‍රියාත්මක විය යුතුය. මාස දෙකක් ඇතුලත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක අභියාචනය ඇසීමෙන් පසුව නියෝගය ස්ථිර කරනු ලබන තෙක් ඒ නියෝගය බල නොපැවැත්විය යුතු ය.

(4) සමුපකාර සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වැනි උපවගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක, සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තෙක් හෝ අභියාචනයකදී අමාත්‍යවරයා විසින් ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක් ඒ සමිතියේ හෝ සංගමයේ පොත්, ලේඛණ හා වෙනත් දේපල භාරව සිටීමට හා ඒ සමිතියේ හෝ සංගමයේ කටයුතු පාලනය කිරීම සඳහා එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කල හැකිය. ඒ තැනැත්තා හෝ තැනැත්තන් පත් කරනු ලැබූ විට සමිතියේ හෝ සංගමයේ කාරක සභාව විසින් හෝ සමිතියේ හෝ සංගමයේ පොත්, ලේඛණ හා වෙනත් දේපල භාරව සිටින වෙනත් තැනැත්තෙකු විසින් ඒ පොත්, ලේඛන හෝ දේපළ පළමු සඳහන් තැනැත්තාට හෝ තැනැත්තන් වෙත භාර දිය යුතු අතර ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මකවන තුරු හෝ අමාත්‍යවරයා විසින් අභියාචනයකදී ඒ නියෝගය අවලංගු කරන තෙක් ඒ කාරක සභාව අක්‍රිය විය යුතු ය.

සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය අවලංගු කිරීම.

60. යම් ලියාපදිංචි කල සමුපකාර සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය-

(අ) ඒ සමිතිය හෝ සංගමය අවම වශයෙන් සාමාජිකයින් විසිදෙනෙකුගෙන්වත් සමන්විත විය යුතු බව සමිතිය ලියාපදිංචි කිරීමේ කොන්දේසියක්වන අවස්ථාවක ඒ සමිතියේ හෝ සංගමයේ සාමාජික සංඛ්‍යාව විස්සට අඩුවී ඇත්නම්, හෝ

(ආ) ඒ සමිතිය හෝ සංගමය ලියාපදිංචිකල දින සිට අවුරුදු එකක කාලපරිච්ඡේදයක් තුළ ඒ ලියාපදිංචි කල සමිතිය හෝ සංගමය එහි පරමාර්ථ සඳහා වැඩ ආරම්භ කර නැත්නම් ; හෝ

(ඇ) මේ යටතේ අවලංගු කිරීමේ නියෝගය පැනවීමේ දිනට පෙර වසර දෙකක කාලපරිච්ඡේදයක් තුළ ඒ සමිතිය හෝ සංගමය අක්‍රියව තිබුනේ නම්,

රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් ඒ සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කල හැකිය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ බලපෑම්.

61. ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය 59 වැනි වගන්තිය හෝ 60 වැනි වගන්තිය යටතේ නියෝගයකින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, මෙහි මින් මතු "විසුරුවා හැරීමේ දිනය" වශයෙන් සඳහන් කරන ඒ නියෝගය ක්‍රියාත්මකවන දින සිට සමිතිය හෝ සංගමය සංස්ථාවක් ලෙස පැවතීම නතර විය යුතුය ඃ එසේ වුව ද, මේ ප්‍රඥප්තියේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සමිතිය හෝ සංගමය වෙත පැවරුනු යම් වරප්‍රසාද රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය හෝ සංගමය සඳහා පත් කරනු ලැබූ යම් ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

සමිතියක, සංගමයක ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු ඈවර කිරීම.

62. 59 වැනි වගන්තිය හෝ 60 වැනි වගන්තිය යටතේ සමිතියක හෝ සංගමයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ හෝ සංගමයේ ඈවරකරු හෝ ඈවරකරුවන් වශයෙන් එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කල හැකිය. අවස්ථාවෝචිත පරිදි 59 වැනි වගන්තිය හෝ 60 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මකවන දිනයේ සමිතියේ හෝ සංගමයේ සියලුම දේපල ඈවරකරු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබිය යුතු ය.

ඈවරකරුගේ බලතල

63. (1) 62 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ඈවරකරුට රෙජිස්ට්‍රාර්වරයාගේ මඟ පෙන්වීම හා පාලනයට ද, 64 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන යම් සීමා කිරීම්වලටද යටත්ව පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතු ය ඃ-

(අ) සමිතියේ හෝ සංගමයේ හෝ වත්කම්වලට සමිතියේ හෝ සංගමයේ සාමාජිකයන් හා හිටපු සාමාජිකයන් සහ සේවකයින් හෝ හිටපු සේවකයින් විසින් ගෙවිය යුතු හෝ සමිතියේ හෝ සංගමයේ හෝ මිය ගිය සාමාජිකයින්ගේ සහ සේවකයින්ගේ, බූදල්වලින් ලැබිය යුතු දායක මුදල් කලින් කල නිශ්චය කිරීම ;

(ආ) සමිතියේ හෝ සංගමයේ පොත්වල එතෙක් සටහන්ව නැති ණය හිමියන් විසින් සිය හිමිකම් කියාපෑම් ඇතුලත් කරවා ගැනීම සඳහා ඒවා ඉදිරිපත් කල යුත්තේ හෝ ඒ හිමිකම් කියාපෑම් ඔවුන් විසින් තහවුරු කරනු ලැබීමට පෙර කෙරෙන වත්කම් බෙදා දීමෙන් ඒ ණය හිමියන් අත්හරිනු ලැබිය යුත්තේ යම් දිනයකට පෙර ද, ඒ දිනය ප්‍රකාශයකින් හෝ දැන්වීමකින් නියම කිරීම ;

(ඇ) ණය හිමියන් අතර උද්ගතවන ප්‍රමුඛත්වය පිළිබඳ යම් ප්‍රශ්නයක් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කිරීම ;

(ඈ) 68 වගන්තියෙහි සඳහන් යම් විස්තරයක ආරවුලක් (සමිතිය හෝ සංගමය සම්බන්ධයෙන් එහි වූ සඳහන් කිරීම් ඈවරකරු සම්බන්ධයෙන් සඳහන් කිරීම් ලෙස තේරුම් ගෙන) ඒ වගන්තිය යටතේ බේරුම් කිරීම සඳහා යොමු කිරීම හා සමිතිය හෝ සංගමය වෙනුවෙන් තමාගේ නමින් හෝ ධුරයෙන් සිවිල් නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීම හා නීති කෘත්‍යවලදී ප්‍රතිවාද ඉදිරිපත් කිරීම ;

(ඉ) ඈවර කිරීමේ ගාස්තු කවර පුද්ගලයින් විසින් හා කවර ප්‍රමාණවලින් දැරිය යුතුද යන්න තීරණය කිරීම ;

(ඊ) සමිතියක හෝ සංගමයක ගණන් බේරා වසා දැමීමේදී අවශ්‍ය විය හැකි වත්කම් එකතු කොට බෙදා දීම සම්බන්ධයෙන් විධාන කිරීම ;

(උ) රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය කලින් ලැබී ඇත්තේ නම් සමිතිය හෝ සංගමය විසින් හෝ සමිතියට හෝ සංගමයට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑම් සමථයකට පත් කිරීම ;

(ඌ) ඈවර කිරීම නිසි ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි සාමාජිකයන්ගේ මහ සභා රැස්වීම් කැඳවීම ;

(එ) සමිතියේ හෝ සංගමයේ පොත්, ලේඛණ හා වත්කම් තම සන්තකයට ගැනීම ;

(ඒ) සමිතියේ හෝ සංගමයේ දේපළ විකිණීමෙන් හා ඈවර කිරීම සම්බන්ධයෙන් රැස්කරන ලද සියළුම මුදල් රෙජිස්ට්‍රාර්වරයා විසින් විධාන කරනු ලබන යම් ආකාරයකින් තැන්පත් කිරීම ;

(ඔ) වැඩදායී ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය විය හැකිතාක් දුරට සමිතියේ හෝ සංගමයේ කටයුතු පවත්වාගෙන යෑම. එසේ වුව ද, සමිතියක හෝ සංගමයක ඈවරකරුට යම් ණය මුදල් නිකුත් කිරීම සඳහා මෙහි අඩංගු කිසිවකින් හිමිකම් නොලැබිය යුතුය. තව ද,

(ඕ) රෙජිස්ට්‍රාර් විසින් වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබූ විට සමිතියේ හෝ සංගමයේ වත්කම් පහසු ආකාරයකින් බෙදා දීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

(2) 59 වැනි වගන්තිය හෝ 60 වැනි වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක හෝ සංගමයක යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු සහ සේවකයෙකු හෝ හිටපු සේවකයකු විසින් යම් ණයක් හෝ වෙනයම් මුදලක් ගෙවීමට ඇති හා ඒ තැනැත්තා ඒ අවලංගු කිරීමේ දිනයෙන් පසු මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිකල අන්කිසි සමිතියක හෝ සංගමයක සාමාජිකයකුවන අවස්ථාවක, 62 වැනි වගන්තිය යටතේ පත් කරන ලද පළමු සඳහන් සමිතියේ හෝ සංගමයේ ඈවරකරුට රෙජිස්ට්‍රාර්වරයාගේ මඟ පෙන්වීම් හා පාලනයට සහ 64 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන වෙනයම් සීමාකිරීම්වලට ද යටත් ව, ඒ තැනැත්තාට ඒ අන් සමිතියෙන් හෝ සංගමයෙන් අයවිය යුතු මුදලින් ඒ ණයට හෝ වෙනයම් මුදලට වැඩි නොවන මුදලක් ඒ සාමාජිකයාගෙන් ඒ අන් සමිතියට හෝ සංගමයට අයවිය යුතු ණයක් වූවාක් මෙන් අයකොට ඒ මුදල ඈවරකරු වෙත එවන ලෙස ඒ අන් සමිතියට හෝ සංගමයට නියම කිරීමේ බලය තිබිය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද යම් ඈවරකරුවෙකුට, ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි යම් රීතිවලට යටත්ව මේ වගන්තියේ කාර්යය කරගෙන යෑම පිණිස යම් බලතල අවශ්‍යවන ප්‍රමාණයට දිසා අධිකරණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ විධිවිධාන සලස්වා ඇති මාර්ගයෙන්ම හා (අවශ්‍ය විය හැකි පමණින්) ඒ ආකාරයට පාර්ශවකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට ඔවුන්ට බල කිරීමටත් ලේඛණ ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට බල කිරීමටත් බලය තිබිය යුතු ය.

ඈවරකිරීම පාලනය කිරීමට රෙජිස්ට්‍රාර්වරයා සතු බලය.

64. (1) ඈවරකරු රෙජිස්ට්‍රාර්වරයාගේ පාලනයට හා විධානයට යටත්ව සිය බලතල ක්‍රියාවේ යෙදවිය යුතු අතර,

(අ) ඈවරකරු විසින් කරනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කොට හෝ වෙනස් කොට අවශ්‍ය කවර හෝ අළුත් නියෝගයක් කිරීම ද ;

(ආ) ඈවරකරුවෙකු ධුරයෙන් ඉවත් කිරීම ද ;

(ඇ) සමිතිය හෝ සංගමයේ සියළුම පොත්, ලේඛණ හා වත්කම් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම ද ;

(ඈ) 63 වැනි වගන්තිය යටතේ වූ ඈවරකරුගේ බලතල ලියවිල්ලකින් වූ නියෝගයකින් සීමා කිරීම ද ;

(ඉ) ගණන් ඉදිරිපත් කරන ලෙස ඈවරකරුට තම අභිමතය පරිදි නියම කිරීම ද ;

(ඊ) ඈවරකරුගේ ගණන් විගණනය කරවා ගැනීම හා සමිතියේ හෝ සංගමයේ වත්කම් බෙදා දීමට බලය පැවරීම ද ;

(ඌ) ඈවරකරුට පාරිශ්‍රමික ගෙවීම නියම කිරීම, හා

(ඌෟ) ඈවරකරු හා යම් තෙවන පාර්ශ්වකරුවෙකු අතර පවත්නා වූ (63(1) (ඈ) අනු වගන්තිය යටතේ බේරුම් කිරීමට යොමු කල හැකි ආරාවුලක් නොවන) යම් ආරාවුලක් ඒ පිළිබඳව බේරුම්කර දෙන තීරණයෙන් බැඳී සිටීමට ඒ පාර්ශ්වකරු ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරතහොත් බේරුම් කිරීම සඳහා යොමු කිරීම ද,

රෙජිස්ට්‍රාර්වරයා විසින් කළ හැකිය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් 'ඈවරකිරීම' යනුවෙන් ගිණුමක් පිහිටුවිය යුතු අතර ඈවරකරු විසින් රැස්කරනු ලබන සියළු මුදල් මෙම ගිණුමට බැර කළ යුතුය. ඈවරකරුවන්ගේ සියළුම මුදල් හා පිරිවැය ගෙවීම් පිළිබඳ වියදම් එම ගිණුමෙන් දැරිය යුතු ය.

නියෝග ක්‍රියාත්මක කිරීම.

65. (1) 63 වැනි වගන්තිය යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වූ බේරුම්කරුගේ තීරණයෙන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර, ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට ඒ තීරණය ක්‍රියාත්මක කල හැකි විය යුතු ය.

(2) බේරුම්කරුවෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් 63 වැනි වගන්තිය හෝ 64 වැනි වගන්තිය යටතේ හෝ කරනු ලැබූ නියෝගයක් කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකල යුතු අතර, ඒ සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති යම් සිවිල් අධිකරණයක් විසින් ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ඒ නියෝගය ක්‍රියාත්මක කළ යුතු ය.

(3) එසේ වුව ද, ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක හෝ සංගමයක හෝ ණය හිමියකු වන යම් සමුපකාර සමිතියකට හෝ සංගමයකට හෝ යම් සමුපකාර සමිතියකට හෝ සංගමයකට හෝ යම් බැංකුවකට හෝ වෙනත් යම් ආයතනයකට ඈවරකරුවකු හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් 63 වැනි වගන්තිය හෝ 64 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයකට විරුද්ධව ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගයේ දිනයේ සිට මාස දෙකක් ඇතුලත අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් තිබිය යුතු ය.

(4) 63 වැනි වගන්තිය හෝ 64 වැනි වගන්තිය යටතේ ඈවරකරුවෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියෝගයක් කිරීමෙන් පසු මාස දෙකක් ඇතුලත අමාත්‍යවරයා වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ ඈවරකරුගේ හෝ එම රෙජිස්ට්‍රාර්වරයාගේ එම නියෝගය ඒ කාල පරිච්ඡේදය ගතවීමෙන් පසු බල පැවැත්විය යුතුය. මාස දෙකක් ඇතුලත අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් තීරණයක් දෙනු ලබන තෙක් ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගය බල නොපැවැත්විය යුතු ය.

සිවිල් අධිකරණයක අධිකරණ බලය සීමා කිරීම.

66. මෙහි පෙරාතුව ප්‍රකාශිතවම විධිවිධාන සැලැසුනු ප්‍රමාණය හැර මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචිකල සමිතියක් හෝ සංගමයක් විසුරුවා හැරීමට අදාල යම් කරුණක් සම්බන්ධයෙන් කිසිම සිවිල් අධිකරණයකට කිසිම අධිකරණ බලයක් නොතිබිය යුතු ය.

ඈවර කිරීම අවසන් කිරීම.

67. (1) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියක් හෝ සංගමයක් ඈවර කිරීමේ දී සංචිත අරමුදල ඇතුළු අරමුදල් 43 (2) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ප්‍රථම කොට ඈවර කිරීමේ ගාස්තු සඳහා ද, ඊළඟට ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ ණය හා ආණ්ඩුව හෝ පළාත් සභාව ඇප වූ ණය ආපසු ගෙවීම සඳහා ද, ඉක්බිතිව සමිතියේ හෝ සංගමයේ වෙනත් වගකීම් ඉටු කිරීම පිණිස ද, ඉක්බිතිව කොටස් ප්‍රාග්ධනය ගෙවීම පිණිස ද, ඉක්බිතිව සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලින් අවසර ලැබෙන්නේ නම් ලාභ බෙදනු නොලැබූ යම් කාලපරිච්ඡේදයක් සඳහා අවුරුද්දකට සියයට දහයකට නොවැඩි ප්‍රමාණයකින් ලාභාංශයක් ගෙවීම සඳහා ද, ලාභ පිළිබඳව සුදුස්සක් කරනු නොලැබූ යම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන්, ඒ කාලපරිච්ඡේදය විසුරුවා හැරීමේ දිනයට පෙරාතුවම වූ අවස්ථාවක සාමාජිකයන්ගේ ප්‍රතිදානයක් ගෙවීම සඳහා ද යෙදිය යුතු ය.

(2) සමිතියක හෝ සංගමයක ඈවර කිරීම අවසන් කිරීම ලැබූ හා ඒ සමිතියේ හෝ සංගමයේ යම් ණය හිමියෙකු විසින්, වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑමක් ඉදිරිපත් කරනු නොලැබූ හෝ ඒ දේ ඔහුට නොලැබුන විට ඈවර කිරීම අවසන් කිරීමේ දැන්වීම *ගැසට්* පත්‍රයෙහි පළ කල යුතුය. තව ද, ඒ සමිතියේ හෝ සංගමයේ අරමුදල් සම්බන්ධයෙන් හෝ වූ යම් හිමිකම් කියාපෑමක් පිළිබඳව කිසිම නඩුවක් ඒ දැන්වීම *ගැසට්* පත්‍රයෙහි පල කිරීමේ දින සිට මාස තුනක් ඇතුලත ආරම්භ වන්නේ නම් මිස ඒ පවත්වාගෙන නොයා යුතු ය.

(3) (1) වැනි උප වගන්තියෙහි නිශ්චිතව සඳහන් කාර්යයන් සඳහා සහ (2) වැනි උපවගන්තිය යටතේ නඩුවක් පවරනු ලැබූ යම් හිමිකම් කියාපෑමක් ගෙවීම සඳහා මුදල් යෙදීමෙන් පසු ඉතිරිවන යම් අතිරික්තයක් ඒ සමිතිය හෝ සංගමය විසුරුවා හැරීමේ දිනයෙහි එහි නිලධරයන්ව සිටි තැනැත්තන් විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතියට යටත්ව තෝරා ගත හැකි යම් ප්‍රාදේශීය මහජනෝපාකාර අරමුණක් සඳහා යෙදිය හැකිය. සමිතියක හෝ සංගමයක ඈවර කිරීමේ දිනයෙන් පසු මාස තුනක් ඇතුලත රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරනු ලැබූ ඉහත කී

අරමුණක් තෝරා ගැනීම ඒ තැනැත්තන් පැහැර හැරිය හොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අතිරික්තය බැංකුවක හෝ ලියාපදිංචි කළ සමිතියක තැන්පත් කළ යුතුය. එසේ තැන්පත් කළ අතිරික්තය මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පිහිටුවනු ලැබිය හැකි අතිරික්ත අරමුදලකට ගෙවනු ලැබිය හැකිය. රීති වලින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි යම් කාර්යයන් සඳහා එසේ විධි විධාන සලස්වනු ලැබිය හැකි ආකාරයකින් අතිරික්ත අරමුදල් වියදම් කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතය පරිදි කල හැකිය. එසේ වුව ද, අතිරික්තයට එකතුවන යම් පොලියක් සමුපකාර අරමුදලට ගෙවනු ලැබිය හැකි ය.

(4) මෙම පරිච්ඡේදයේ සඳහන් යම් කාර්යයක් ඉටු කරන්නේ හෝ ඒ සඳහා පත්කරනු ලබන්නේ යම් තැනැත්තෙක් ද එම තැනැත්තා හෝ තැනැත්තන් 1979 අංක 15 දරන දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය.

## X වැනි පරිච්ඡේදය

### ආරවුල්

68. (1) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ව්‍යාපාරයට සම්බන්ධ යම් ආරවුලක, ආරවුල්

(අ) සාමාජිකයන්, හිටපු සාමාජිකයන් සහ ආශ්‍රිත සාමාජිකයන්, හිටපු සාමාජිකයන් හා මියගිය සාමාජිකයින් මඟින් හිමිකම් කියාපාන තැනැත්තන් අතර, හෝ සමිතියේ හෝ සංගමයේ අතීත හෝ වර්තමාන නිලධරයන් හෝ සේවකයන් අතර හෝ මියගිය නිලධරයන් හෝ සේවකයන්ගේ උරුමක්කරුවන් හෝ නීත්‍යානුකූල නියෝජිතයන් අතර ; හෝ

(ආ) සාමාජිකයෙකු, හිටපු සාමාජිකයෙකු හෝ සාමාජිකයෙකු, හිටපු සාමාජිකයෙකු, හෝ මියගිය සාමාජිකයෙකු මඟින් හිමිකම් කියාපාන තැනැත්තෙකු හා සමිතිය, එහි කාරකසභාව හෝ එහි අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකු හෝ සේවකයෙකු, හෝ මියගිය යම් නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර ; හෝ

(ඇ) සමිතිය හෝ සංගමය හෝ එහි කාරක සභාව හා සමිතියේ හෝ සංගමයේ අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ යම් මියගිය නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර ; හෝ

(ඈ) සමිතිය හෝ සංගමය හෝ එහි කාරක සභාව, සහ

(i) ව්‍යාපාරය හෝ ඉන් කොටසක් ඒ සමිතියට හෝ සංගමයට පවරනු ලැබ වෙන යම් සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකුව හෝ නිලධරයෙකුව හෝ සේවකයෙකුව සිටි යම් තැනැත්තෙකු,

(ii) (i) වැනි අනු ඡේදයේ සඳහන් සමිතියේ හෝ සංගමයේ සාමාජිකයෙකු හෝ හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන යම් තැනැත්තෙකු,

(iii) (i) වැනි අනු ඡේදයේ සඳහන් සමිතියෙහි හෝ සංගමයේ යම් නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු වන යම් තැනැත්තෙකු අතර ; හෝ

(ඉ) සමිතිය හා ලියාපදිංචි කළ අන්කිසි සමිතියක් අතර උද්ගත වන්නේ නම්, තීරණය සඳහා ඒ ආරවුල රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

අතීත හෝ වර්තමාන සාමාජිකයෙකුගෙන්, නිලධරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් හෝ මියගිය සාමාජිකයෙකුගේ, නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් නම් කළ තැනැත්තෙකුගෙන්, උරුමකරුවෙකුගෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකුගෙන් ලියාපදිංචි සමිතියකට හෝ සංගමයකට අය විය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඒ සමිතිය හෝ සංගමය විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑමක්, හෝ ලියාපදිංචි කළ සමිතියකින් හෝ සංගමයකින් අතීත හෝ වර්තමාන නිලධරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් හෝ සාමාජිකයෙකුගෙන් සාමාජිකයෙකුට හෝ සේවකයෙකුට හෝ ලියාපදිංචි සමිතියකින් හෝ සංගමයකින් මියගිය සාමාජිකයෙකු නිලධරයකුගේ හෝ සේවකයෙකුගේ යම් නම් කළ තැනැත්තෙකුට, උරුමකරුවෙකුට හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකුට අයවිය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් ඒ ණය ඉල්ලීම හෝ අලාභය පිළිගත යුතු වුව ද, නොවුව ද, මේ උපවගන්තියේ අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදාළව ආරවුලක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉහත (1) වන උපගන්තිය යටතේ යොමු කිරීමක් ලැබීමෙන් පසු ඃ

(අ) තමා විසින්ම ඒ ආරවුල සම්බන්ධයෙන් තීරණය කල හැකිය, නැතහොත්

(ආ) ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් වෙත යොමු කල හැකිය.

(3) බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවන් විසින්, එම තීන්දුව දෙන ලද දිනයේ සිට දින තිහක් ඇතුලත කාලයක් තුළ ඒ පිළිබඳ අභියාචනයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත කල හැකිය. එවැනි අභියාචනයක් ඊට ප්‍රමාණවත් හේතු ඇතුලත් ලිඛිත ආයාචනයක් විය යුතුය. තව ද පැමිණිලිකරු අභියාචනය කරන්නේ නම් ඔහු ආරවුලේ විෂය වස්තුවේ වටිනාකමින් සියයට දහයක් ද, විත්තිකරු අභියාචනා කරන්නේ නම් තීන්දු කරන ලද මුදලින් සියයට දහයක් වශයෙන් අභියාචනා තැන්පතුවක් රෙජිස්ට්‍රාර්වරයා වෙත තැබිය යුතු ය. එසේ වුවද, එවැනි තැන්පතුවක උපරිමය රුපියල් දස දහසකට නොවැඩි විය යුතු ය.

(4) ඉහත (3) වැනි උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ කිසිම පාර්ශ්වකරුවකුට ඒ පාර්ශ්වකරු විසින්ම හෝ යම් නියෝජිතයෙකු මාර්ගයෙන් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පෙනී සිට ඒ අභියාචනය සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හිමිකම් නොතිබිය යුතු ය.

(5) ඉහත (2) වැනි උප වගන්තිය යටතේ හෝ (3) වැනි උප වගන්තිය යටතේ වූ අභියාචනයකදී රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව යම් සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකල යුතු ය.

(6) ඉහත (2) වැනි උප වගන්තිය යටතේ බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුව සම්බන්ධයෙන් (3) වැනි උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත කිසිම අභියාචනයක් යොමු කරනු නොලබන්නේ නම් හෝ එබඳු යම් අභියාචනයක් අත්හරිනු ලබන්නේ නම් හෝ ඉල්ලා අස්කර ගනු ලබන්නේ නම් ඒ තීන්දුව අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳ කිසිම සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකල යුතු ය.

(7) මේ වගන්තිය යටතේ ආරවුලක විෂය වන යම් හිමිකම් කියාපෑමක් සම්බන්ධයෙන් කාලසීමා ආඥාපනතේ විධිවිධාන අදාල නොවිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබූ ආරවුලක් ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ව්‍යාපාරයට අදාල ආරවුලක් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකල යුතු ය.

(9) මේ වගන්තියේ 'සාමාජිකයා' යන්නට ආශ්‍රිත සාමාජිකයෙක්ද ඇතුලත් වේ.

තීරණයක් හෝ තීන්දුවක් ක්‍රියාත්මක කිරීම.

69. (1) 68 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබූ ආරවුලක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණයකින් (මේ වගන්තියෙහි මින් මතු එය 'තීරණයක්' යනුවෙන් හඳුන්වනු ලැබේ) හෝ ඒ වගන්තිය බේරුම්කරුවෙකු වෙත යොමු කරන ලද ආරවුලක් පිළිබඳ වූත් ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යථා පරිදි අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූත්, මේ වගන්තියේ මින් මතු 'තීන්දුවක්' යනුවෙන් හඳුන්වනු ලබන තීන්දුවකින් කෙරෙන නිගමනය ඒ ආරවුලේ එක් පාර්ශ්වකරුවෙකුගෙන් ඒ ආරවුලේ අනෙක් පාර්ශ්වකරුට මුදලක් අයවිය යුතු බවත්, ඒ මුදල ඊට සම්බන්ධ ගාස්තු හා පොලී ඇතොත් ඒවා සමග නොගෙවා ඇත්තාවූත් අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ මුදල අයවිය යුත්තේ යම් පාර්ශ්වකරුවෙකුගෙන් ද මේ වගන්තියෙහි මින් මතු 'පැහැර හරින්නා' යනුවෙන් හඳුන්වනු ලබන ඒ පාර්ශවකරු සම්බන්ධයෙන් -

(අ) ගාස්තු හා පොලී සමග ඒ මුදල පිළිබඳ විස්තර හා ඒ පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් ප්‍රාදේශීය ලේකම්, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත නිකුත් කිරීම ; හෝ

(ආ) ගාස්තු හා පොලී ඇතොත් ඒ පොලියද සමග ඒ මුදල් පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් ඒ පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඒ පැහැරහරින්නාට අයත් යම් චංචල හෝ නිශ්චල දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත නිකුත් කිරීම ; හෝ

(ඇ) අයවිය යුතු මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැනගත් ඔහුගේ ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය අඩංගු සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාසයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කිරීම, කල හැකිය.

(ඈ) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද එය නොතකා මෙම ප්‍රඥප්තියේ 68 වන වගන්තිය යටතේ ලබා ගන්නා තීරක ප්‍රදානයකින් හෝ අභියාචනා තීන්දුවකින් අයවිය යුතු යැයි සඳහන්කර ඇති යම් මුදලක් ගෙවීම් පැහැරහැර ඇති විටක එකී මුදල්ද ඊට අදාල වන්නාවූ වෙනත් යම් ආකාරයක මුදල්ද අයකරගැනීම සඳහා ඊට අදාල වන්නාවූ යම් සුරැකුමක් වන යම් දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එකී මුදල් හා ඊට අදාල වන්නාවූ ගාස්තු ආදී මුදල් ද අයකර ගැනීම සඳහා අදාල සමිතියේ හෝ සංගමයේ කාරක සභාවට විධාන කළ හැකිය.

(2) (අ) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උප වගන්තියේ (අ) අනු වගන්තිය යටතේ ප්‍රාදේශීය ලේකම්, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, පැහැර හරින්නාගේ චංචල දේපල තහනමට ගෙන විකුණා ගාස්තු හා පොලී සමග ඒ මුදල අයකරගැනීමට සැලැස්වීමට ඒ නිලධරයාට මෙයින් බලය පවරා නියම කරනු ලැබේ.

(ආ) ඒ නිලධරයා විසින් ඒ වෙනුවෙන් ඉතාමත්ම අවස්ථානුකූල යැයි සලකනු ලබන යම් ආකාරයකින් එකී තහනමට ගැනීම් ක්‍රියාත්මක කල යුතු අතර, එසේ තහනමට ගත් සෑම දේපලක්ම පැහැර හරින්නා විසින් ගාස්තු හා වියදම ගෙවීමට යටත්ව දින පහක් තබා ගත යුතුය. පැහැර හරින්නා විසින් ගාස්තු හා පොලිය සහිතව අයවිය යුතු ඒ මුදලද ඒ දේපල තහනමට ගෙන තබා ගැනීමේ වියදම් හා වැය බර ද එකී දින පහ ඇතුලත නොගෙවන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි ප්‍රාදේශීය ලේකම් හෝ පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් විසින් එකී දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට සැලැස්විය යුතුය.

(ඇ) ඒ විකිණීමෙන් ලැබෙන්නා වූ මුදල,

(i) පළමු කොට ඒ දේපල තහනමට ගැනීම, තබා ගැනීම හා විකිණීම පිළිබඳ වූ වියදම් හා ගාස්තු ගෙවීමටද,

(ii) දෙවනුව, ගාස්තු හා පොලිය සමඟ අයවිය යුතු මුදල පියවීමටද, යෙදිය යුතු අතර යම් ශේෂයක් ඇතොත් තහනමට ගත් දේපල අයිතිකරු වෙත එය ගෙවිය යුතු ය.

(3) (1) වන උප වගන්තියේ (ආ) අනු වගන්තිය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් එය පැහැර හරින්නාගේ සියළුම චංචල හා නිශ්චල දේපල හෝ ඉන් යමක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යයි සැලකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල්ට බලය පැවරෙන හා නියම කෙරෙන දේපල තහනම් ඇස්කීසියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධාන කල යුතුය. ඒ තහනමට ගෙන විකිණීම කෙරෙහි සහ ඊට අදාල සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය දක්වා වූ වගන්ති වල විධි විධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතු ය.

(4) (1) වන උප වගන්තියේ (ඇ) අනු වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුධව වැඩි දුරටත් ක්‍රියා නොකල යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම්, බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කල නොහැකි වූද, දඩයකින් පමණක් දඬුවම් කල හැකි වරදකට ඒ පැහැර හරින්නා සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරුණු දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතුය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වන වගන්තියේ (ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ සහ (ඇ) ඡේද හැර) විධිවිධාන අදාල විය යුතු අතර ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධාන අනුව මහෙස්ත්‍රාත්වරයා විසින් කල හැකිව තිබූ විධානයක් ඔහු විසින් කල හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වන වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය ගෙවීම පැහැර හැරීමෙහිලා බන්ධනාගාර ගත කිරීමේ කාලයට දණ්ඩන නියමයන් කරනු ලැබූ යම් පැහැර හරින්නෙකු ඉහත (1) උප වගන්තියේ (අ) අනු වගන්තියේ නිශ්චිත සහතිකයෙහි සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උප වගන්තියේ (ඇ) අනු වගන්තිය යටතේ තීරණයක් කළ අවස්ථාවක එකී මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියා කිරීමට සමිතියේ හෝ සංගමයේ හෝ කළමනාකරණ කාරක සභාවට බලය ඇත.

(6) රෙජිස්ට්‍රාර්වරයා මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක ඒ පිළිබඳ නිවේදනයක් පෞද්ගලිකව භාර දීමෙන්, ලියාපදිංචි කල තැපෑලෙන් හෝ විදුලි පණිවුඩ මාර්ගයෙන් යැවීමෙන් පැහැර හරින්නා වෙත නිකුත් කල යුතුය. එහෙත් පැහැර හරින්නාට ඒ නිවේදනය නොලැබීම හේතු කොට ගෙන මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍යය අවලංගු නොවිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදි භාවය සලකා බැලීමට, පරීක්ෂා කිරීමට, ඒ පිළිබඳ තීරණය කිරීමට යම් දිසා අධිකරණයකට හෝ මහෙස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම නොවිය යුතු ය,

(8) (3) වන උප වගන්තිය යටතේ විකිණීමෙන් ලත් යම් මුදලක් හා (4) වන උපවගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකරන ලද යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි දිසා අධිකරණය හෝ මහේස්ත්‍රාත්වරයා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ මුදල සම්බන්ධයෙන් අදාල තීරණය හෝ තීන්දුව අනුව සුදුස්සක් කළ යුතු ය.

70. (1) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක සාමාජිකත්වය සඳහා යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් එම සමිතිය හෝ සංගමය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඒ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචනා කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතු ය.

වෙනත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු බව

(2) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකු ඒ සමිතියේ හෝ සංගමයේ ධුරයකට යථා පරිදි තෝරා පත්කර ගන්නා ලද්දේ ද, යන්න සම්බන්ධයෙන් ද හෝ සාමාජිකයෙකු ඒ සමිතියේ හෝ සංගමයේ සාමාජිකයෙකු හෝ නිලධරයෙකුව සිටීම නතරවූයේ ද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ හෝ සංගමයේ යම් මහ සභා රැස්වීමක් වලංගු ලෙස පවත්වනු ලැබුවේ ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළ යුතු වන අතර, ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය. රෙජිස්ට්‍රාර්වරයාගේ එකී තීරණය සමිතිය හෝ සංගමය වෙත දන්වා යැවිය යුතු අතර ඒ අනුව ක්‍රියා කිරීමට සමිතිය හෝ සංගමය බැඳී සිටියි.

## XI වැනි පරිච්ඡේදය

### *රීති*

රීති

71. (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධි විධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු රීති අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(2) විශේෂයෙන්ම හා (1) වැනි උපවගන්තියෙන් පැවරුනු බලතලවල සාමාන්‍ය තත්ත්වයට හානියක් නොමැතිව ඒ රීතිවලින් -

(අ) සමිතියක් හෝ සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා ඊට අදාල කොන්දේසි නියම කළ හැකිය;

(ආ) සාමාජිකයින් වශයෙන් ඇතුලත් වීම් සඳහා ඉල්ලුම් කරන හෝ සාමාජිකයින් වශයෙන් ඇතුලත් කරගනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියම කළ හැකි අතර කලින් කල සාමාජිකයින් තෝරා පත්කර ගැනීම හා ඇතුළු කර ගැනීමත් සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙර කළ යුතු ගෙවීම් හා ලබාගත යුතු සම්බන්ධතා සඳහා විධිවිධාන සැලැස්වීමත් කළ හැකිය;

(ඇ) සාමාජිකයින් ඉල්ලා අස්වීම හා සාමාජිකත්වයෙන් නෙරපීම, සාමාජිකත්වය අත්හිටුවීම හා සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ හෝ නෙරපනු ලබන තැනැත්තෙකුට කළ යුතු ගෙවීම් පිළිබඳවත්, හිටපු සාමාජිකයන්ගේ වගකීම පිළිබඳවත් විධිවිධාන සැලැස්විය හැකිය;

(ඈ) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක සාමාජික සංඛ්‍යාව එම සමිතිය හෝ සංගමය මගින් සීමා කළ හැකි ප්‍රමාණය නියම කළ හැකිය;

(ඉ) මිය ගිය සාමාජිකයෙකුගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළ යුතු ආකාරය ද ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තෙකු නම් කිරීම සඳහා ද, විධිවිධාන සැලැස්විය හැකිය;

(ඊ) (3) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සාමාජිකයෙකු සතුව තිබිය හැකි ලියාපදිංචි කළ හැකි සමිතියක හෝ සංගමයක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැකිය;

(උ) ණය හෝ මුදල් ණයවර සඳහා ඉල්ලුම් කරන සාමාජිකයින් විසින් කළ යුතු ගෙවීම්, අනුගමනය කළ යුතු කොන්දේසි හා ලියා අත්සන් කළ යුතු බැඳුම්කරවල, නීත්‍යානුකූල ලේඛනවල හෝ වෙනත් ලේඛනවල ආකෘති, දියහැකි ණයවල හෝ ප්‍රදානය කළ හැකි ණයවරවල කාලසීමාව, තනි සමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි උපරිම මුදල හා ඔවුන් සම්බන්ධයෙන් ඉඩදෙනු ලැබිය හැකි වැඩිම ණයවර නියම කළ හැකිය;

(ඌ) සීමාරහිත වගකීම්වලින් යුක්ත සමිතියක හෝ සංගමයක සාමාජිකයින්ට ලාභ බෙදා දිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි හා සමිති හෝ සංගම් විසින් ගෙවිය හැකි ලාභාංශ උපරිම ප්‍රමාණය නියම කළ හැකිය;

(එ) කොටස් මගින් හෝ සෘණ පත්‍ර මගින් හෝ වෙනයම් ආකාරයකින් අරමුදල් ලබා ගත හැකි ආකාරය හා තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය හැකි පොලී ප්‍රමාණය විධිමත් කළ හැකිය;

(ඒ) සාමාජිකයන්ගේ මහ සභා රැස්වීම් සම්බන්ධයෙන් ද ඒ රැස්වීම්වල කාර්ය පටිපාටි සම්බන්ධයෙන් ද, ඒ රැස්වීම්වල දී පාවිච්චි කළ යුතු බලතල සම්බන්ධයෙන් ද විධි විධාන සැලැස්විය හැකිය;

(ඔ) කාරක සභාවල සාමාජිකයින් හෝ වෙනත් නිලධරයන් පත්කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් ඉවත් කිරීම සම්බන්ධව ද කාරක සභා රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහා ද කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළ යුතු බලතල හා ඉටුකළ යුතු යුතුකම් සම්බන්ධයෙන් ද විධිවිධාන සැලැස්විය හැකිය;

(ඕ) සමිතියක් හෝ සංගමයක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේ දී, වෙනස් කිරීමේ දී හා පරිච්ඡින්න කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ අතුරු ව්‍යවස්ථා පැනවීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකිය;

(ක) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් තබා ගත යුතු හා පවත්වාගෙන යායුතු පොත්පත්, ගිණුම් සහ ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක වත්කම් හා බැරකම් පෙන්නුම් කරන ශේෂ පත්‍රයක් කලින් කල පළකිරීමට නියම කළ හැකිය;

(ග) ලියාපදිංචි කළ සමිතිවල හෝ සංගම්වල ගිණුම් විගණනය කිරීම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද, පවත්නා සමිති හෝ සංගම් විගණනය කිරීම සහ ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහය දීම සඳහා ද සමුපකාර අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ද, ප්‍රචාරක කටයුතු උදෙසා ද, පාවිච්චි කළ හැකිවනු පිණිස ඌව පළාත් සමුපකාර සංවර්ධන අරමුදල යනුවෙන් හැඳින්විය හැකි අරමුදලක් පිහිටුවීම සඳහාත් එම අරමුදලට ලියාපදිංචි සමිති හෝ සංගම් විසින් දැරිය යුතු දායකත්වය නියම කිරීමටත් එම අරමුදලේ පරිපාලනයට අදාල විධි විධාන සැලැස්වීමටත් හැකිය;

(ඡ) ලියාපදිංචි කළ සමිති හෝ සංගම් විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර වාර්තා සහ ඒ වාර වාර්තා ඉදිරිපත් කළ යුතු තැනැත්තන් හා වාර්තා ඉදිරිපත් කිරීම පැහැර හැරි අවස්ථාවල දී ඊට අදාලව ක්‍රියාකළ යුතු අන්දමත් පිළිබඳව විධිවිධාන සැලැස්විය හැකිය;

(ට) ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක පොත්පත්වල ඇතුළත් සටහන්වල පිටපත් සහතික කළ හැකි තැනැත්තන් ද එසේ සහතික කළයුතු ආකාරය ද, සම්බන්ධ විධි විධාන සැලසිය හැකිය;

(ඩ) සාමාජිකයන්ගේ නාම ලේඛනයක් සහ සාමාජිකයින්ගේ වගකීම් කොටස්වලින් සීමාසහිත වූ අවස්ථාවක කොටස් පිළිබඳ නාම ලේඛනයක් සකස්කොට පවත්වාගෙන යාම සඳහා ද, විධි විධාන සැලැස්විය හැකිය;

(න) සංචිත අරමුදල් ඇති කොට පවත්වාගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය;

(ත) සමිතියක් හෝ සංගමයක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීමට අදාල යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩ කිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩ කිරීමක් නිසා වූ ප්‍රමාණ කළ අලාභය නිශ්චය කළ හැකි හෝ තක්සේරු කළ හැකි ආකාරය නියම කළ හැකිය;

(ද) බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් පත්කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර්වරයා හෝ බේරුම්කරු හෝ බේරුම්කරුවන් ඉදිරියෙහි පැවැත්වෙන කෘත්‍යයන්හි දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්වරයා වෙත ආභියාචනය කළ විට තැන්පත් මුදල සම්බන්ධ විධිවිධාන ද බේරුම්කරු හෝ බේරුම්කරුවන්ගේ තීන්දු හා රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණ ක්‍රියාත්මක කළ යුතු ආකාරය ද, නියම කළ හැකිය;

(ණ) ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය;

(ප) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු වුව ද මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිත වන විධිවිධාන සලස්වා නැත්තාවූ කරුණු නිශ්චය කළ හැකිය;

(බ) 62 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඈවරකරුවෙකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා ඒ ඈවරකරුගේ නියෝගවලට විරුද්ධව ආභියාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය;

(ම) 67 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ සඳහන් අතිරික්ත අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා ඒ අරමුදලේ මුදල් වියදම් කළ හැකි ආකාරය සහ කාර්යයන් නියම කිරීම කළ හැකිය;

(ය) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ අභියාචනා ඉදිරිපත් කිරීම, ඇසීම හා ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් භාවිතා කළ යුතු ආකෘති, ගෙවිය යුතු ගාස්තු, පිළිපැදිය යුතු කාර්ය පටිපාටි හා ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් සියලු කරුණු නියම කිරීම කළ හැකිය;

(ඊ) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක සාමාජිකයෙකු කළමණාකරණ කාරක සභාවේ හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයෙකු ලෙස තෝරාපත් කර ගැනීම සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ සඳහන් නොවන නුසුදුසුකම් නියම කිරීම කළ හැකිය ;

(උ) මෙම ප්‍රඥප්තියේ 69(1) (ඇ) අනුවගන්තිය යටතේ ක්‍රියාකිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටි නියම කළ හැකිය.

(3) පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූයේ නම් මිස කිසිම රීතියක් බලනොපැවැත්විය යුතුය. ඒ අනුමැතිය පිළිබඳ නිවේදන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වැනි උපවගන්තියේ සඳහන් නියමිත නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු සෑම රීතියක්ම මෙහි පනවනු ලැබුවාක් මෙන් වලංගු සහ බල සහිත විය යුතු ය.

## XII වැනි පරිච්ඡේදය

### *පළාත් සභාවට හෝ ආණ්ඩුවට අයවිය යුතු ණය*

ආණ්ඩුවට සහ පළාත් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීම.

72. (1) ලියාපදිංචි කළ සමිතියකින් හෝ සංගමයකින් හෝ ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක යම් නිලධරයෙකුගෙන් හෝ සාමාජිකයෙකුගෙන් හෝ එහි හිටපු සාමාජිකයෙකුගෙන් එම තත්වයෙන් ආණ්ඩුවේ ණය, පළාත් සභාවේ ණය හා ආණ්ඩුව ඇපවූ හා පළාත් සභාව ඇප වූ ණය වෙනුවෙන් අයවිය යුතු මුදල් හා ආණ්ඩුව හා පළාත් සභාව විසින් ප්‍රදානය කරන ලද යම් මුදලක්ද, ඇතුලත්ව ආණ්ඩුවට හා පළාත් සභාවට අයවිය යුතු සියලු මුදල් ජනරජයට අයවිය යුතු ණය අයකර ගැනීම සඳහා ආණ්ඩුවේ ණයකරු ආඥාපනත යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම අයකරගනු ලැබිය හැකි අතර 43(2) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අන්කිසි තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අයවිය යුතු මුදල්වලට ඉහලින් ඒවාට ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමිතියකින් හෝ සංගමයකින් ආණ්ඩුවට හා පළාත් සභාවට අයවිය යුතු (1) වැනි උපවගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් පළමුව සමිතියේ හෝ සංගමයේ දේපළවලින් අයකර ගත හැකිය. දෙවනුව සාමාජිකයින්ගේ වගකීම් සීමාකරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගේ වගකීමේ සීමාවට යටත්ව සාමාජිකයන්ගෙන් ද, තෙවනුව අන් සමිති හෝ සංගම් සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගෙන් ද අයකර ගත හැකිය.

## XIII වැනි පරිච්ඡේදය

### *විවිධ කරුණු*

සමුපකාර යන වචනය පාවිච්චිය සීමා කිරීම.

73. (1) 'එක්සත් සහකාර' යන වචනය හෝ 'සමුපකාර' යන වචනය හෝ දෙමළ භාෂාවෙන් 'අයික්කිය' යන වචනය හෝ 'කුට්ටුරව්' යන වචනය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් 'කෝපරේටිව්' (co-operative) යන වචනය කොටසක් වන යම් නාමයක් හෝ අභිදානයක් යටතේ වෙළඳාම් කිරීම හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් නොවන කිසිම තැනැත්තෙකු විසින් පළාත් සභාවේ අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නොකළ යුතු ය.

එසේ වුව ද 1921 සැප්තැම්බර් මස 22 වැනි දිනට පෙර යම් තැනැත්තෙකු විසින් වෙළඳාමක් කර ගෙන යන ලද්දේ හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද්දේ යම් නාමයක් හෝ අභිදානයක් යටතේ ද ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවෙහි අනුප්‍රාප්තිකයා විසින් ඒ නාමය හෝ අභිදානය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවක් අදාල නොවිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන කවර තැනැත්තෙකු වුව ද, මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියය නොඉක්මවන දඩයකට හා වරද අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අවස්ථාවක් වූ විට ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු තවදුරටත් ඒ වරද කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් සියයක අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

සමිතියකට හෝ සංගමයකට ලැබිය යුතු මුදල් ආපසු ගෙවීමට හෝ අන් දේපළක් ආපසු භාර දීමට රෙජිස්ට්‍රාර් විසින් නියම කළ හැකි බව.

74. (1) ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් සම්බන්ධයෙන් 51 වැනි වගන්තිය යටතේ විගණනයක දී හෝ 53 වැනි වගන්තිය යටතේ විභාගයක දී හෝ 54 වැනි වගන්තිය යටතේ පොත් පරීක්ෂා කිරීමක දී නැතහොත් විමර්ශනයක දී හෝ ගණන් බේරා වසා දැමීමේ දී ඒ සමිතිය හෝ සංගමය සංවිධානය කිරීමෙහිලා හෝ එහි කළමණාකාරිත්වයෙහි ලා සහභාගී වූ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් පනතක විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද රීති මාලාව හෝ නියෝගවලට නැතහොත් සමිතිය හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක රීතිවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පටිපාටියට හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව හෝ විසින් නිකුත් කරන ලද යම් පොදු විධානවලට පටහැනිව සමිතියේ හෝ සංගමයේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තෙකුගෙන් හෝ තැනැත්තන් කණ්ඩායමකින් හෝ ඒ සමිතියේ හිටපු හෝ දැනට සිටින යම්

නිලධාරියෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපලක් ලැබිය යුතු බව පෙනුණ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් තමාගේ ඕනෑකම පිට හෝ සමිතියේ හෝ සංගමයේ කාරක සභාවේ හෝ ඇවරකරුගේ හෝ යම් ණයහිමියෙකුගේ හෝ දායකයකුගේ ඉල්ලීම පිට ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කර -

(අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසුයැයි අදහස් කරනු ලබන පොළියක් සමඟ ආපසු ගෙවන ලෙස, හෝ

(ආ) ඒ අන් දේපළ හෝ එහි කොටසක් ආපසු භාර දෙන ලෙස, හෝ

(ඇ) සමිතියේ හෝ සංගමයේ වත්කම්වලට රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසුයැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස හෝ ඔහුට හෝ ඒ කණ්ඩායමට නියම කරමින් නියෝගයක් කළ හැකිය.

එවැනි යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එබඳු යම් නියෝගයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමිතියකට හෝ සංගමයකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම් වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වන උප වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියාකර නොමැති අවස්ථාවක, සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචි කළ ව්‍යාපාර ස්ථානය පිහිටි හෝ ඒ නියෝගය කරන ලද්දේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධරයෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව ද, ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාසය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා විසින් ඒ මුදල බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි, දඩයකින් පමණක් දඬුවම්කල හැකි වරදක් සඳහා ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධාරයා හෝ සේවකයින් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අයකර ගනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියෙහි (එම වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන ඉනික්බිතිව අදාල විය යුතුය. තව ද, ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේ ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කල හැකිව තිබූ යම් විධානයක්ද, ඔහු විසින් කල හැකිය. රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ කිසිම නීති කෘත්‍යයක දී සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ කිසිවකින් බලය ලැබීම හෝ නියම වීම සිදු නොවිය යුතු ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් (1) වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ නිලධරයෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම මේ වගන්තියේ පෙරාතුව වූ විධි විධාන හෝ ඒ යටතේ යම් නියෝගයක් කිරීම හේතු කොට ගෙන වැලැක් වෙනු ලෙස හෝ ඒ කෙරෙහි වෙනයම් ආකාරයකින් බලපාන ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

75. (1) ලියාපදිංචි සමුපකාර සමිතියක හෝ සංගමයක සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින් වාර්ෂිකව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හා රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශනයක්, ඒ ප්‍රකාශය කරන්නේ යම් වර්ෂයක් වෙනුවෙන්ද ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට පැවති පරිදි,

*වත්කම් හා බැරකම් ප්‍රකාශ.*

(අ) ඔහුගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව ;
(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව ; සහ
(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව

කළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රකශය, ලියාපදිංචි සමිතියක හෝ සංගමයක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින්, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ කාරකසභාවේ සාමාජිකයා තෝරා පත්කර ගනු ලැබූ හෝ පත්කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුලත ද ඔහු සභාපති ධුරය හෝ කාරක සභා සාමාජික ධුරය දැරීම නතර වුවහොත් මිස ඔහු ප්‍රථම ප්‍රකාශය කළ වර්ෂයෙන් පසුව එළඹෙන එක් එක් අනුක්‍රමික වර්ෂයේ ජූලි මස පළමු වැනි දිනට පෙර කළ යුතුය. එසේ නියමිත දිනට ප්‍රකාශය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් තම ධුරය හෝ නිලය අහෝසි කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය.

76. ලියාපදිංචි කළ සමුපකාර සමිතියක ගණන්, 51 වැනි වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විගණනය කරනු ලැබීමෙන් පසුව හෝ 53 වැනි වගන්තිය යටතේ විභාගයකින් පසුව හෝ ලියාපදිංචිය කළ සමිතියක පොත්පත් පරීක්ෂා කර බැලීම සහ එහි කටයුතු විමර්ශනය කිරීම 54 වන වගන්තිය යටතේ කිරීමෙන් පසුව හෝ සමිතියේ හෝ සංගමයේ නිලධරයෙකු හෝ සාමාජිකයෙකු හෝ සේවකයෙකු වශයෙන් වූ තම තත්වයෙන් යම් මුදලක්, යම් බඩු

*විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් නිලධරයන් ආදීන්ගේ වගකීම.*

හෝ දේපල භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි නැතහොත් ඒ මුදල්, බඩු හෝ දේපළ පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තෙකු විසින් ඒ නිලධරයා, සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ලඟ තබාගෙන සිටින හෝ තමාගෙන් අයවිය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත්වල හෝ ප්‍රකාශ වල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් ගෙවන ලෙස හෝ එවැනි යම්බඩුවල හෝ දේපල වල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය. තව ද, එසේ නියම කරනු ලැබීමෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වහාම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩුවල හෝ දේපල වල වටිනාකම ගෙවීම හෝ යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරිය හොත් ඔහු සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරදට වරදකරුවන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු තුනක් නොඉක්මවන කාලසීමාවකට, දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත් විය යුතුවාක් මෙන්ම රුපියල් පන්දහසක දඩයකට ද, ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවුවද ඔහු යටත් විය යුතු ය.

යම් තොරතුරක් ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් බැංකුවකට නියම කළ හැකි බව.

77. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, එය නොතකා රෙජිස්ට්‍රාර්වරයා විසින් අවශ්‍ය යැයි ඔහු අදහස් කරන අවස්ථාවක,

(අ) යම් ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් බැංකුවක් සමඟ කරනු ලබන ගණුදෙනු සම්බන්ධයෙන් යම් තොරතුරක් සපයන ලෙස,

(ආ) බැංකුව සමඟ පවතින ඒ සමිතියේ හෝ සංගමයේ ගිණුම් පෙන්නුම් කරන පිටපතක් බැංකුව විසින් තබා ඇති ලෙජරයෙන් පෙන්නුම් කරන ලෙස, හෝ

(ඇ) සමිතියේ හෝ සංගමයේ හෝ බැරට ගෙවන ලද හෝ සමිතිය හෝ සංගමය විසින් පිටසන් කරන ලද යම් චෙක්පතක් ඉදිරිපත් කරන ලෙස, යම් බැංකුවකට නියම කළ හැකිය.

නඩු පැවරීම මෙහෙයවීම කවුරුන් විසින් කලයුතු ද යන වග.

78. ලියාපදිංචි කරන ලද සමිතියකට හෝ සංගමයකට අදාල කරුණක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීම, විභාග කිරීම හා 1979 අංක 15 දරන අපරාධ නඩු විධි විධාන සංග්‍රහ පනත යටතේ XVII වැනි ඡේදය යටතට වැටෙන නඩු පැවරීම් මෙහෙය වීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

සමාගම් ආඥා පනත හා වෘත්තීය සමිති ආඥා පනත අදාල නොවිය යුතු බව.

79. සමාගම් ආඥාපනතේ සහ වෘත්තීය සමිති ආඥාපනතේ විධිවිධාන හා ඒ ආඥාපනත් සංශෝධනය කරන යම් අනු පනත්වල විධිවිධාන මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමිති හා සංගම්වලට අදාල නොවිය යුතු ය.

දැනට පවත්නා සමිති සංගම් රීති යනාදිය පිළිබඳ ඉදිරි කටයුතු කිරීම පිළිබඳ බලය.

80. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකෙන සෑම සමුපකාර සමිතියක් හෝ සංගමයක්ම මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථා වෙනස් කරනු ලබන හෝ පරිච්ඡින්න කරනු ලබන තෙක් මේ ප්‍රඥප්තියේ ප්‍රකාශිත විධිවිධාන සමඟ ගැලපෙන පමණට අඛණ්ඩව බල පැවැත්විය යුතු ය.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ සාදනු ලැබූ, මේ ප්‍රඥප්තිය ආරම්භ වන අවස්ථාවේ බලපවත්නා සියළු රීති ඒවා මේ ප්‍රඥප්තියේ විධිවිධාන සමඟ ගැලපෙන පමණට, මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ රීති වෙනුවට 71 වන වගන්තිය යටතේ අළුත් රීති සාදනු ලබන තෙක් ඒවා අඛණ්ඩව බල පැවැත්විය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ කරන ලද හෝ කරනු ලැබූ ලෙස ද සැලකෙන සියළු පත්කිරීම් කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැලකෙන සියළුම නියෝග නිකුත් කරනු ලැබූ ලෙස සැලකෙන සියළුම නිවේදන හා දැන්වීම් බේරුම්කරුවන් විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන ප්‍රදාන, රෙජිස්ට්‍රාර්වරයා විසින් ගන්නා ලද හෝ ගන්නා ලදැයි සැලකෙන සියලු තීරණ, පවරන ලද හෝ පවරන ලදැයි සැලකෙන සියළු සිවිල් නඩු හා වෙනත් නඩු කටයුතු උද්ගතව ඇති සියළු ආරවුල් හැකිතාක් දුරට මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ ලෙස, නිකුත් කරනු ලැබූ ලෙස, පවරනු ලැබූ ලෙස හා උද්ගත වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

මුදල් නීති පනත යටතේ රක්ෂිත තැන්පතු වලට අදාල බැරකම් පියවීම සඳහා විනා ප්‍රයෝජනයට නොගත යුතු බව.

81. යම් වර්ගයක බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් විසින් එහි තැන්පතු මුදල් නීති පනතේ IV බී වැනි ඡේදයේ II වන කොටස යටතේ රක්ෂණය කොට ඇති අවස්ථාවක ඒ කොටස යටතේ රක්ෂණය කොට රක්ෂිත තැන්පතුවලට අදාල වත්කම් මේ ප්‍රඥප්තියේ අන් කිසි විධිවිධානයක කුමක් සඳහන්ව ඇත් ද, එය නොතකා ඒ තැන්පතුවලට අදාල බැරකම් පියවීම නොවන වෙනයම් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට නොගත යුතු ය.

ප්‍රඥප්තියට අනුව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩන.

82. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු විසින් නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් හෝ එහි නිලධරයකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු සහ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් කැඳවීමේ නියෝගයකට නියමයකට හෝ නීත්‍යානුකූල ලිඛිත නියෝගයකට ඕනෑකමින්ම හෝ යම් සාධාරණ හේතුවක් නොමැතිව අකීකරුවන හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම් තොරතුරක් සපයන ලෙස නියම කිරීමට බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් එසේ සැපයීම නීත්‍යානුකූලව නියම කරනු ලබන යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම තැනැත්තෙකුම හා ඕනෑකමින් අසත්‍ය වාර්තා ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ සංගමයක් හෝ එහි යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් දොලොස් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම සහ ඒ දඩය යන දෙකටම හෝ ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වූ ද, ඔහු යටත් විය යුතු ය.

(3) යම් ලියාපදිංචි කල සමිතියක් හෝ සංගමයක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක කරන ලද වරද යම් යුතුකමක් කඩ කිරීමක් වේ ද ඒ යුතුකම ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථාවලින් හෝ රීතිවලින් බැඳී සිටින එම සමිතියේ හෝ සංගමයේ සෑම නිලධරයෙකුම හෝ එබඳු නිලධරයන් නොසිටී නම් කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම ඒ සාමාජිකයා ඒ වරද කිරීම ගැන නොදැන සිටි බව හෝ එය වැලැක්වීමට ප්‍රයත්න දැරූ බව ඔප්පු කරනු ලැබුව හොත් මිස ඔහු විසින් ඒ වරද කරන ලද්දේ නම් ඔහු යටත් විය යුතු වන දණ්ඩනයටම යටත් විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා ආදීන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

83. මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටුකිරීමේ දී හෝ කර්තව්‍ය කිරීමේ දී කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ සහකාර හා සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ මේ ප්‍රඥප්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන හෝ පත් කරන ලද වෙනත් තැනැත්තෙකුට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

මහ සභා රැස්වීම් හෝ කාරක සභා රැස්වීම් කැඳවීමටත්, ඒවාට පැමිණ සිටීමටත්, කථාකිරීමටත්, රෙජිස්ට්‍රාර්ට ඇති බලතල.

84. (1) රෙජිස්ට්‍රාර්වරයාට ද සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් ඔහුගෙන් ඒ සඳහා බලයලත් කෙනෙකුට ද, ඕනෑම අවස්ථාවක දී තමා නියම කරන අයුරු නියම කරන වේලාවක හා ස්ථානයක දී ඕනෑම ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක විශේෂ මහ සභා රැස්වීමක් හෝ එකී සමිතියක හෝ සංගමයක ඕනෑම ප්‍රාදේශික මහ සභාවක විශේෂ මහ සභා රැස්වීමක් හෝ කැඳවීමට බලය තිබිය යුතුය. එවැනි රැස්වීමකට ඒ සමිතියේ මහ සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් දස දෙනෙක් පැමිණ සිටීම ප්‍රමාණවත් වන අතර එම සංඛ්‍යාව සනපූර්ණය වශයෙන් සැලකිය යුතුය. එසේම එවැනි මහ සභා රැස්වීමකට හෝ ප්‍රාදේශීය මහ සභා රැස්වීමකට සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලින් ඒ මහ සභාවට නිශ්චිතව ඇති බලතල හිමිවිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහුගෙන් ඒ සඳහා ලිඛිතව බලයලත් කෙනෙකුට ද, සෑම ලියාපදිංචි කළ සමුපකාර සමිතියක හෝ සංගමයක කාරක සභා රැස්වීමක් හෝ එකී සමිතියේ හෝ සංගමයේ ප්‍රාදේශික කාරක සභා රැස්වීමක් ඕනෑම අවස්ථාවක දී තමන් නියම කරන අයුරින් නියම කරන වේලාවක හා ස්ථානයක දී කැඳවීමට බලය තිබිය යුතුය. එවැනි රැස්වීමකට ඒ එක් එක් සමිතියේ හෝ සංගමයේ කාරක සභාවට නියමිත නියෝජිත සංඛ්‍යාවේ පහෙන් එකක් හෝ තිදෙනෙකු යන ප්‍රමාණයෙන් වැඩි පිරිසක් පැමිණ සිටීම ප්‍රමාණවත් වන අතර එම සංඛ්‍යාව සණපූර්ණය වන්නේ ය. එවැනි කාරක සභා රැස්වීමකට සමිතියේ හෝ සංගමයේ අතුරු ව්‍යවස්ථාවලින් ඒ ඒ කාරක සභාවට නිශ්චිතව ඇති බලතල හිමිවිය යුතු ය.

(3) කාරක සභා රැස්වීමක් කැඳ වූ විට අවශ්‍ය යැයි තමාට වැටහෙන සමිතියේ හෝ සංගමයේ පොත්පත් හෝ ලියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහුගෙන් ලිඛිතව බලය ලත් තැනැත්තෙකුට හෝ බලය තිබිය යුතුය. එවැනි සෑම නියෝගයක්ම අනුව ක්‍රියා කිරීම සමිතියේ හෝ සංගමයේ ලේකම් තැනගේ වගකීම වේ. රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහුගේ බලය ලත් තැනැත්තාට හෝ ඉහත (1) හා (2) වන උප වගන්තිය යටතේ කැඳවන ලද ඕනෑම රැස්වීමක මුලසුන දැරිය හැකිය. එහෙත් එම රැස්වීමේ න්‍යාය පත්‍රයේ සඳහන් කරුණු තීරණය කිරීමට අදාළ සාමාන්‍ය ඡන්ද බලය හිමි නොවිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහුගේ සාමාන්‍ය හෝ විශේෂ ලිඛිත නියෝගයකින් බලයලත් කෙනෙකුට ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ඕනෑම මහ සභා රැස්වීමකට හෝ කාරක සභා රැස්වීමකට සහභාගිවීමත් එහිදී කථා කිරීමටත් බලය තිබිය යුතුය. එහෙත් රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහුගේ නිසිබලය ලත් තැනැත්තෙකුට හෝ එවැනි රැස්වීමක දී ඡන්දය ලබා දීමට බලය නොතිබිය යුතු ය.

අර්බුදකාරී අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයාට තිබෙන බලතල.

85. ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක ව්‍යාපාරික සහ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාමට නොහැකි ආකාරයකට අර්බුදකාරී තත්ත්වයක් ඇතිවුවහොත් අර්බුදකාරී තත්ත්වය නිරාකරණය වනතෙක් හෝ තමා සෑහීමට පත්වන තෙක් සමිතිය හෝ සංගමය හෝ පවත්වාගෙන යෑම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් විධිවිධාන සැලැස්විය හැකිය.

ප්‍රඥප්ති අවලංගු කිරීම.

86. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමත් සමගම පහත සඳහන් ප්‍රඥප්ති ක්‍රියාත්මක වීම පරිච්ඡින්න විය යුතු ය.

(අ) ඌව පළාත් සභාවේ 1991 අංක 5 දරන සමුපකාර සමිති හා සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය ;

(ආ) ඌව පළාත් සභාවේ 1992 අංක 5 දරන සමුපකාර සමිති හා සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) ප්‍රඥප්තිය.

අර්ථ නිරූපනය.

87. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි,

'අතුරු ව්‍යවස්ථාව' යන්නෙන් තත් කාලයෙහි බල පවත්නා ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථා අදහස් වන අතර, එම අතුරු ව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධන ඇතුළත් වේ.

'අමාත්‍යවරයා' යන්නෙන් ඌව පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

'අමාත්‍යාංශ ලේකම්වරයා' යන්නෙන් ඌව පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

'රෙජිස්ට්‍රාර්' යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ ඌව පළාත් සභාවේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයෙකුගේ යුතුකම් ඉටුකිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් වේ.

'කාරක සභාව' යන්නෙන් ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක කටයුතු පිළිබඳ කළමණාකාරිත්වය භාර කරනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩලය අදහස් වන අතර, ලියාපදිංචි කළ සමිතියක හෝ සංගමයක අධ්‍යක්ෂ මණ්ඩලය හා මෙම ප්‍රඥප්තියේ 56 වැනි වගන්තියේ විධි විධාන යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද හා නම් කරන ලද තැනැත්තන් ද ඊට ඇතුළත් වේ.

'නිලධාරියා' යන්නට සමිතියක හෝ සංගමයක හෝ එහි යම් ශාඛාවක සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා හෝ සමිතියක හෝ සංගමයක කාරක සභාවක සාමාජිකයෙකු සහ සමිතියේ හෝ සංගමයේ කටයුතු සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට සමිතියේ හෝ සංගමයේ කාරක නියෝගවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් බලය පවරනු ලැබූ අන් කිසි තැනැත්තෙකු ඇතුළත් වේ.

'සාමාජිකයා' යන්නට සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සහභාගිවන තැනැත්තෙක් ද, ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුළත් කර ගන්නා ලද තැනැත්තෙක් ද, ඇතුළත් වේ.

'බැංකුව' යන්නෙන්,

(අ) මහජනයාගෙන් ඉල්ලුම් තැන්පත් මුදල් භාර ගැනීමේ හෝ ඉල්ලුම් තැන්පත් මුදල් ඇති කිරීමේ ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කරගෙන යන නීතිගත කරනු ලැබූ හෝ නීතිගත කරනු නොලැබූ යම් පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් ;

(ආ) ආණ්ඩුව වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ හා ණය දීම අත්තිකාරම් දීම හෝ ආයෝජනය කිරීම කරන්නා වූ හෝ මහජනයාගෙන් මුදල් තැන්පතු භාර ගන්නා වූ (යම් ලිඛිත නීතියක් මගින් හෝ අන් ආකාරයකින් පිහිටුවනු ලැබූ) යම් නියෝජිත ආයතනයක් ;

(ඇ) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංවර්ධන මුදල් සංස්ථාව, හා ;

(ඈ) සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියෝගයක් මගින් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා බැංකුවක් ලෙස ප්‍රකාශිත අන් කිසි පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

'මූලික සමිතිය' යන්නෙන් 6 (1) වැනි උපවගන්තියේ (ආ) (ඇ) හා (ඈ) ඡේදවල සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන ලද යම් සංගමයක් නොවන ලියාපදිංචි කළ සමිතියක් අදහස් වේ.

'රීති' යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සලකන රීති අදහස් වේ.

'පළාත් සභාවේ හෝ ආණ්ඩුවේ අරමුදල්' යන්නෙන් පළාත් සභාව හෝ රජය විසින් දෙනු ලබන ණය අත්තිකාරම් සහ ප්‍රදාන අදහස් වේ.

'නිදන් අරමුදල නැතහොත් ව්‍යවස්ථාපිත සංචිතය' යන්නෙන් කිසියම් සමිතියක හෝ සංගමයක අඛණ්ඩ පැවැත්ම සඳහා හෝ නැතහොත් කාරක ප්‍රාග්ධන ඌණතාවය ඇති වූ අවස්ථාවක හෝ ප්‍රයෝජනයට ගැනීම පිණිස වෙන් කරන ලද මුදලක් හෝ තැන්පත් කරනු ලබන අරමුදලක් අදහස් වේ.

88. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල සහිත බව.

12-329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.